ශ්‍රී ලංකාවේ අංක එකේ කාන්තා පුවත්පත

# ධරණී

සතුටින් ජීවිතය දරන්නී

2023 පෙබරවාරි 15 වන බදාදා
3 කාණ්ඩය 11 කලාපය
මිල රු. 80 යි



# බළල් ශාපයෙන් මිදෙන්න අපිත් ඇහිබැම කපන්න ඕනැද?

"ඇහිබැම් හැදූ වරදට ශිෂ්‍යාව විශ්වවිද්‍යාලයෙන් දෙට්ට"

ආගමේ නීතිවලට එපිටින් ඇහිබැම හැඩකරලා කැම්පස් එකෙන් අයින් කරාපු 'ජස්බීන් කවුර්' කියන සික් ජාතික තරුණිය ගැන ඉන්දියාවේ පත්තරවල පළවුණේ ඔහොමයි. ඔයින් පස්සේ ජස්බීන් තමන්ට වෙච්චි අසාධාරණයට අධිකරණයෙන් පිහිටක් පැතුවා. ගින්නට පිදුරු වැටෙන්නා වගේ හර්යානා අධිකරණයෙනුත් කිව්වේ ආගමික නීති කඩකරන ළමයින්ව එළියට දන්න අධ්‍යාපන ආයතනවලට අයිතියක් තියෙනවා කියලයි.

පවුලේ වෙඩිමකට ඇහිබැම් හැදුවයි කියලා උරණ වෙච්චි ගුරුවරියක් උසස් පෙළ ගෑනු දරුවෙක්ව පැය තුනක් දණගස්සවලා තිබ්බය කියලා නිවුස් එකක් නාවලපිටිය පැත්තෙනුත් ඇහුණා. පාසල් ළමයින්ගේ ඇහිබැම හදපුවයි, රැවුලේ නීටි එකයි, සපත්තුවේ පොලිෂ් එකයි හොයලා හදපු රට මේකද කියලයි ඔතැනදි ඇතැම්මු ප්‍රශ්න කරලා තිබ්බේ.

එච්චා මෙච්චා මොනවා වුණත් ගෑනුන්ගේ මූණු කළුඑළි කරන්න ඇහිබැම දෙජෝඩුවට පුළුවන් කියන කතාව නම් ඇත්ත. 'Eyebrow can make or break your look' කියලා ඉංග්‍රීසි කියමනකුත් තියෙනවා. පෙනුම ලස්සන කරන්නත් කැත කරන්නත් ඇහිබැමවලට පුළුවන් කියන එකයි ඒකේ තේරුම. ඇහිබැම හරියට හැඩකරන හැටියි එච්චා ලස්සනට වවාගන්න හැටියි තමයි අද කියන්නේ.

ඇහිබැම කිව්වහම රංගවේදී ටෝනි රණසිංහ මහත්තයා මාධ්‍ය සාකච්ඡාවකදි හිනාවෙවී කියාපු කතාවක් මතක් වුණා. රඟපාන්න ආපු මුල් කාලේ ඔහු නිතරෝම ඇහිබැම උඩට යවනවලු. 'දෙලොවක් අතර' චිත්‍රපටය රූගත කරන්න ගියපු වෙලෙත් ඇහිබැම උස්සන වැඩේ පුරුද්දට වගේ සිද්ධ වුණාලු.

"ටෝනි... කතා කරනකොට ඇහිබැම නටවන්න එපා."

චිත්‍රපටයේ අධ්‍යක්ෂ ලෙස්ටර් ජේම්ස් පීරිස් මහත්තයා කීපසැරයක්ම කිව්වත් ටෝනිට ඒ වැරැද්ද හදාගන්න බැරිවෙලා.

"දැන් ඉතින් ඇහිබැම කපලා දාන්න තමයි වෙන්නේ."

ලෙස්ටර් ජේම්ස් පීරිස් මහත්තයා ඒ පාර කියලා තියෙන්නේ සැරෙන්. ටෝනි රණසිංහ රංගනවේදියා එදා ඉඳලා කිසිම දවසක රඟපාද්දි ඇහිබැම නටවන්න ගියේ නැතිලු.

ඔය ඇහිබැම කපන වැඩේත් මුලින්ම පටන් අරන් තියෙන්නේ ඊජිප්තුවේ අය. ක්ලියෝපැට්‍රා රැජිණ වගේම නෙෆර්ටිටි රැජිණත් ඇහිබැම ගැන හරියට හිතුවලු. ඒ කාලේ ලලනාවන් වගේම පිරිමි පාර්ශවයත් ඇහිබැම කපලා පාට ගාලා හැඩ කළාලු. ගෙදරක බළලෙක් ආන්තරා වුණොත් ඒ බළලගේ ශාපෙන් මිදෙන්න පවුලේ හැමෝම සම්පූර්ණයෙන්ම ඇහිබැම කපලා දැම්මලු.

පෙනුම වැඩි කරගන්න ගෑනු ඇහිබැමේ දුම්මලයි අඟුරුයි ගානවා කියලා ප්‍රසිද්ධ රෝම කවියෙක් වුණු ඔවිඩ් කියලා තියෙනවා. ස්ත්‍රී ඇහිබැම දේදුන්නට සමාන කරලා ලියාපු කාව්‍ය වර්ණනා අපේ සාහිත්‍යයෙත් නැතිව නෙමේ.

මධ්‍යතන කාලේ ජපන් ගෑනු දේදුනු තාලෙට ඇහිබැම හදද්දි ඒ කාලෙම එංගලන්ත ගෑනු ඇහිබැම බූ ගාලා. ඒක ඒ කාලේ හිටපු පළමු එළිසබෙත් රැජිනගේ නීතියක්.

හැට හැත්තෑව දශකවල ඉඳළම අපේ රටේ අයත් ඇහිබැම හදන්න අරන්. හීන් නූල් ගාණට ඇහිබැම හීනි කරන එකලු ඒ කාලේ විලාසිතාව. ඉතින් ඒ කාලේ සමහරු සම්පූර්ණයෙන්ම වගේ ඇහිබැම කපලා සිහින්වට පැන්සලකින් පාට කරනවලු. වතුර, දහදිය වගේ දේවල් අපේ ඇහැට යන එක වළක්වන්න තමයි ස්වභාවික ඇහිබැම හැදිලා තියෙන්නේ. ඒ නිසා ඇහිබැම සම්පූර්ණයෙන්ම ඉවත් කරන එක ඇහැට හොඳ නැහැ.



## ඇහිබැම එකට හාවුණු ගෑනු දඩබ්බරයිලු

දැන් ට්‍රෙන්ඩ් එක ඇහිබැම මහතට හදන එක. ඒ නිසා දැන් ඇහිබැම කපන එක කෙසේ වෙතත් වවාගන්න තමයි ගොඩක් අය දත කන්නේ. ඇහිබැම මහතට දිගට පෙන්නන්න දැන් මයික්‍රෝබ්ලේඩින්, අයිබ්‍රෝව් ටැටූ වගේ දේවලුත් කරනවා.

ඇහිබැම සම්පූර්ණයෙන්ම අයින් කරලා අයිබ්‍රෝව් වගේ පේන්න ටැටූ එකක් ගහන එකටයි අයිබ්‍රෝව් ටැටූ කියන්නේ. මේ විදියට ටැටූ එකක් ගැහුවහම ගලේ කෙටූ අකුරු වගේ ඒ පච්චේ ජීවිතේට යන්නේ නැති නිසා මූණේ ටැටූ කොටන්න කලින් දෙපාරක් හිතන එක හොඳයි.

මයික්‍රෝබ්ලේඩින් කියන්නෙත් කැමති විදියට ඇහිබැම අඳින්න පුළුවන් තාක්ෂණයක්. වසර කිහිපයකින් ඉවත් වෙලා යන නිසා අයිබ්‍රෝව් ටැටූ වෙනුවට ගොඩදෙනා කරන්නේ මේක. අයිබ්‍රෝව් ටැටූ එකක් කළත් මයික්‍රෝබ්ලේඩින් එකක් කළත් පළපුරුදු රූපලාවණ්‍ය ශිල්පියෙක් තෝරගන්න එකයි අංක එක. නැත්තම් සම ආශ්‍රිත ආසාදන ඇතිවෙලා මූණේ නොමැකෙන කැළැල් ඇතිවෙන්නත් පුළුවන්.

මයික්‍රෝබ්ලේඩින් එකක් කළාට පස්සේ දවස් හතක් සැර සබන් ගන්න එපා, මේකප් කරන්න එපා, අව්වේ මුහුදේ ඇළදොළවල යන්න එපා, එතකොට අත්වලින් අල්ලන්න, කසන්න යන්න එපා කියලා රූපලාවණ්‍ය ශිල්පියා උපදෙස් දෙනවා. ඒ උපදෙස් අනිවාර්යයෙන්ම පිළිපදින එකත් හරි වැදගත්.

මේ වගේ ක්‍රමවලට හැමකෙනාම යොමුවෙන්නේ නැහැනේ. ගමනක් බිමනක් යනකොට ඇහිබැම අඳින එකයි ගොඩක් අය කරන්නේ. ලස්සන වැඩි කරගන්න ඕනේ නම් බලි කුරුටු ගාන තාලෙන් ඇහිබැම ඇඳලා වැඩක් නෑ.

මුලින්ම මූණේ හැඩේට ගැළපෙන ඇහිබැම හැඩේ හොයාගන්න. හදවත් හැඩේ මූණකට ගැළපෙන්නේ රවුම් දෙබැමක්. මූණ හතරැස් නම් කෝණ හැඩය නැත්තම් වක්‍රාකාර බැම වැඩිය හොඳයි. රවුම් මූණට හොඳ පිරුණු කෙටි ආරුක්කු හැඩය. ඕවල් මූණක් තියෙනවා නම් ඕනම හැඩයක් ගැලපෙනවා. හැබැයි මෘදු ආරුක්කු හැඩේ වැඩිය ලස්සනයි. දියමන්ති හැඩේ මූණට රවුම්, වක්‍රාකාර, කෝණ ඔය ඕන හැඩයක් කැපෙනවා. පැතලි බැම තමයි දිගටි මූණට හොඳ.

හැඩේ තෝරගත්තයින් පස්සේ ඇහිබැම පාට කරන්න අයිබ්‍රෝව් ආලේපන තෝරගන්න. පැන්සල්, දියර, ජෙල් විදියට මේ ආලේපන තෝරගන්න පුළුවන්. අයිබ්‍රෝව් ආලේපන ගන්නකොට කළු පාට ගන්න එපා. කළු පාටින් පාට කළාම ඇහිබැමට එන්නේ නිකන් විකාර පෙනුමක්. අලු නැත්තම් දුඹුරු පාටින් පාට කළොත් ස්වභාවික පෙනුමක් මතු කරගන්න පුළුවන්.

මුලින්ම ඇහිබැම දෙක එක පැත්තකට පීරගන්න. ඊටපස්සේ මුලින්ම යට අවුට් ලයින් එක අඳින්න. දෙවනුව උඩ ලයින් එක. මුල තියෙන ඇහිබැම කෙස් ටික පාට කරන්නේ නැතිව ඊටපස්සේ තියෙන බැම පාට කරන්න. ගොඩාක් තදට පාට කරන්නත් එපා. සියුම්වට ස්වභාවික විදියට පාට කරන්න. ඇහිබැම අඳිනකොට ඇද වුණොත් කන්සීලර් එකකින් මකාගන්න පුළුවන්.

ඇහිබැම අඳිනකොට උඩින් නැවෙන තැනක් එනවනේ. අපේ නහයේ කොණයි කෙළින් බැලුවහම ඇහේ අක්ෂි කාචයයි හරහා සරල රේඛාවක් ඇන්දහම එන තැනට තමයි ඒ නැම්ම එන්න ඕනේ. ඇහිබැම අඳිනකොට ඒ නැම්ම ගොඩාක් වක්‍ර කරන්න එපා. ඒකෙන් නපුරු පාටක් එනවා. අර සමහර ෆිල්ම්වල නපුරු මායාකාරියන්ගේ ඇහිබැම ඇඳලා තියෙන්නෙත් එහෙමයි. නහයේ කොණයි ඇහේ අගයි හරහා සරල රේඛාවක් ගැහැව්වම එන තැන තමයි ඇහිබැම අවසාන කරන්න ඕනේ.

දැන් බහුතරයක් දෙනා මාස කීපයකට සැරයක් හරි සැලෝන් එකකට ගිහිල්ලා ඇහිබැම ලස්සනට හදනවනේ. ලස්සන කරගන්න ගිහිල්ලා සැලෝන් එකෙන් තියෙන ඇහිබැම ටිකත් කැපුවයි කියලත් සමහරු කනුකුණු ගානවා. ඇහිබැම ඉක්මනින්ම වවාගන්න පුළුවන් සත්කාර ටිකක් කියන්නේ අන්න එහෙම අයට. ඇහිබැම ඝන කරගන්නත් මේ සත්කාරවලට පුළුවන්.

වීදුරු බෝතලේකට එඬරු තෙල් ටිකක් දාන්න. ඒකට විටමින් B කරල් පහක්, ඔලිව් තෙල් ටිකක් එහෙමත් එකතු කරලා හොඳට මිශ්‍ර කරන්න. මේ මිශ්‍රණය දිනපතාම ගාලා ඇහිබැම හොඳට සම්බාහනය කරන්න.

ඔලිව් තෙල්, එඬරු තෙල් එක්ක කෝමාරිකා මිශ්‍ර කරලා ගාන්න. සුදු පොල්තෙල්වලට ආමන්ඩ් තෙල් එක්ක විටමින් E කරලක් එක්කාසු කරලා ඇහිබැමේ ගාන්න. හැමදාම සුදු පොල්තෙල් ගාලා සම්බාහනය කරන්න පුළුවන් නම් ඒත් හොඳයි.

කිරි, වෝල්නට්, නිවිති, කෙසෙල්, අලිගැටපේර, කැරට්, ඇට වර්ග වගේ බයෝටීන් බහුල කෑම කන්න. ඇහිබැම වැවීම වැඩි කරන්න එච්චට පුළුවන්.

ඇහිබැම එකට හාවෙලා තියෙන ගෑනු දඩබ්බරයි නාහෙට අහන්නේ නැතැයි කියලා සමහරු කියනවනේ. ඔය කතා හින්දම අකමැත්තෙන් සමහරු ඇහිබැම හදනවා. එක එක්කෙනාගේ බැම් ගණන් ගන්නේ නැතිව උපතින් ලැබුණු යාවෙච්චි දෙබැම් එහෙමම තියාගෙන අනන්‍යතාවක් හදාගත්තු ගෑනුත් ඉන්නවා. මෙක්සිකානු අධිරාජිනිය තියඩෝරා කොල්-රීම්, මෙක්සිකානු චිත්‍ර ශිල්පිනිය ෆ්‍රීඩා කාලෝ, ඉන්දියාවේ නිළිය කාජල් ඒවට උදාහරණ කියන එක අවසානෙදි කියන්න කැමතියි.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි

ශ්‍රී ලංකාවේ අංක එකේ කාන්තා පුවත්පත

# ධරණී

සතුටින් ජීවිතය දරන්නී

2023 පෙබරවාරි 15 වන බදාදා
3 කාණ්ඩය 11 කලාපය
මිල රු. 80 යි




විශේෂ අතිරේකයක් නොමිලේ

**ක්‍රිකට් ගහන අයත් දුවන නිසා දුවන්න දන්න මම ක්‍රිකට්වලට ආවම මොකද?**

සුසන්තිකා ජයසිංහ

**වමනය සාම්පලයකින් මහාධිකරණ විනිසුරු සරත් අඹේපිටියගේ ඝාතකයින් සොයාගත් හැටි**

**සයිමන් සීයා නැතුව ඉස්කෝලේ නොගිය විජය කුමාරතුංග ගැන අක්කා, රූපා කුමාරතුංග කියන කතාව**

**බළල් ශාපයෙන් මිදෙන්න අපිත් ඇහිබැම කපමුද?**

මහාචාර්ය වාසනා මෛත්‍රී හේරත්

# රත්තරන් දුවේ



**අත්තනායක එම්. හේරත්**

## රත්තරන් දුවේ



# පැනලා යයි කියන බයට ඒ මනුස්සයා මේ කෙල්ලට ඇඳුමක්වත් අඳින්න දීලා තිබුණේ නෑ


අද මගේ දූලාට මං ඉදිරිපත් කරන කතාව දුවේ, මාව ඉතාම සංවේගයට පත්කරපු වගේම අවසානයේ ඉතාම ප්‍රීතියට පත්කළ කතා පුවතක්. මේ සිද්ධිය වුණේ පේරාදෙණිය පොල්ගහමුල අධ්‍යාපන ආයතනයේ බාහිර උපාධි පන්තිවලට උගන්වමින් ඉන්න කාලයේදියි. උපාධි පංතියට නිර්දේශිත පොත් අතර තිබුණා 'ගුස්ටාව් ප්ලෝබෙයා' ලියූ 'එමා බෝවාරි' නවකතාව. ඒකේ හිටියා 'එමා' කියලා දුවෙක්. අම්මා හදිසියේ මියගියාම තාත්තා ඇයව පල්ලියේ කන්‍යාරාමයකට ඇතුළු කරා. ඇගේ ළමා කාලය පල්ලියේ කන්‍යාවන්ගේ සුදු රෙදිකඩින් වැහිලා ගියා. ඇයට සැබෑ ලෝකය නැතිවුණා. පල්ලියේ දැඩි නීතිරීති මැද ඇගේ නවයොවුන් ජීවිතය ගෙවුණා. ඇය විනෝදෙට කළේ බයිබලයේ කවරය තුළම තුට්ටු දෙකේ සුරංගනා ප්‍රේම කතා හංගාගෙන කියැවීමයි. ඇගේ මනසේ ඒවායේ දර්ශන ස්ථිර වුණා මට එහෙම ජීවිතයක් ඇත්නම් කියලා. ඉතින් මේ පුංචි දුවගේ නවකතා කියවීම පූජකවරියන්ට අහුවෙලා ඇයව යළිත් බෝවාරි මහතාට භාරදුන්නා. එතැන් පටන් ඇගේ ජීවිතය රුවල් නැති නෞකාවක් බවට පත්වෙලා ජීවිතය ඉබාගාතේ ගෙවිලා දරුණු වේදනාත්මක සිදුවීම්වලින් හෙම්බත් වෙලා ජීවිතය නසාගත්තා. ඇය පිරිමින්ගේ අතින් අතට මාරුවුණා. හැමෝටම ඇය දූහය නිවාගන්න ජල ධාරාවක් වුණා. ඉතින් දුවේ මං ඔය කතාව කියද්දී මුළු පංතියම නිහඬව අසාගෙන හිටියා. ටික දවසකට පස්සේ මගේ විශ්වවිද්‍යාලයේ ලිපිනයට එක්තරා දුවෙක් ලිපියක් එවලා තිබුණා.

**"සර් ඒ එමා බෝවාරි තරම් දරුණු ඉරණමකට මං තාම මුහුණ දීලා නැහැ. ඒත් කතාව අහලා මට බය හිතුණා. කවදහරි දවසක මං සර්ව හම්බවෙලා මට දැනට වෙච්ච දේ කියන්නම්. අනේ සර් මට උදව් කරන්න."** අද මෙන් ජංගම දුරකතන නොතිබූ සමයක් ඒක. ඇගෙන් මට යළිත් ලිපියක් ආවෙත් නැහැ. කාලය ඔහොම ගෙවිලා යද්දී දවසක් අම්මෙකුයි තාත්තෙකුයි මාව හොයාගෙන පංතියට ආවා. **"සර්, අපිට සර් එක්ක කතා කරන්න ඕන. අපිට ඉන්නෙ එකම දුවයි. පුත්තු දෙන්නයි. ඔය දුව සර්ගේ පංතියට එනවා උපාධි විභාගය ලියන්න. එයා හරිම මුරණ්ඩුයි. දඩබ්බරයි. අකීකරුයි. අපිට පේන විදියට සර් මෙයා කසාද බැන්ද මිනිහෙක්ව ආශ්‍රය කරනවා. මොකද සර් මේකට කරන්නේ?"**

**"අම්මේ, තාත්තේ ඔය දෙන්නට බැරිද දුවත් එක්ක මාව හම්බවෙන්න?"** දෙන්නා එකඟ වෙලා ගියා.

එක දිනයක මේ තුන්දෙනා අපේ ගෙදර හොයාගෙන ආවා. එතකොට මම හිටියේ කුලී ගෙදරක. ඒ දුව මගේ පංතියේ හිටියට මං එයාව දැක්කේ එදා. ඒත් අර අම්මයි තාත්තයි කිව්ව අකීකරු පෙනුමක් මං ඇගෙන් දැක්කෙ නැහැ. ඇගේ අම්මයි තාත්තයි එක්ක මං කතා කරනකොට මේ ළමයා අපේ ගෙදර අයත් එක්ක ගේ ඇතුළට වෙලා කතා වෙනවා, මගේ දුවව එයා වඩාගෙන. පස්සේ ඒ ගොල්ලෝ ගියා. මගේ ගෙදර තිබුණේ පංතිය ළඟමයි. එදා ඉඳලා මේ දැරිය අපේ ගෙදරට යන දියණියක වුණා. පංතියේ අය තේ බොන වෙලාවට මේ දරුවා අපේ ගෙදරට ගිහින් ගෙදර අයගේ නෑයෙක් වෙලා. මං අම්මා තාත්තා කිව්ව කිසිදෙයක් ඒ දුවගෙන් ඇහුවෙ නැහැ. දුවගෙ අම්මයි තාත්තයි නිතර අප බලන්නට ආවා. ඒ අය ආයෙත් දුව ගැන පැමිණිල්ලක් කළෙත් නැහැ. කාලය මෙහෙම ගෙවිලා යන අතරේ එක දවසක් අපේ පංතිය ඉස්සරහ මැදිව්වියේ පිරිමි කෙනෙක් මං එනකල් බලන් හිටියා. එයා මට කතා කරා. **"සර්, මං සර්ගේ පංතියේ කාන්තිත් එක්ක යාළුයි. අපි අද පැනලා යනවා. කියලා යන්න ආවේ."** මං ඇහුවා **"කියලා යන්න ඕන මේ දරුවගෙ අම්මලට නේද? මට කියලා වැඩක් නැහැ."** එතකොටම කාන්ති පංතියේ ඉඳලා දුවගෙන ඇවිත් මෝටර් සයිකලයට නැගලා ගියා. ඊට පහුවෙනිදා අර අම්මයි තාත්තයි අඬාගෙන ආවා. **"අනේ සර් ඒකි පැනලා ගිහින්."** මං කිව්වා **"මට කියලා ගියේ. අම්මලා කෑගල්ල පොලිසියේ පැමිණිල්ලක් දාන්න. ඒ ආවේ අම්මලා කියපු මනුස්සයද?" "ඔව් සර්. ඒ මනුස්සයා තමයි."**

දැන් කාන්ති පන්ති එන්නෙ නැහැ. අම්මලා තාත්තලගෙන් සද්දයකුත් නැහැ. අවුරුද්දක් විතර ගෙවිලා ගියා. අපි කාටත් කාන්ති අමතක වුණා. එක දවසක් රාත්‍රී 1.00ට පමණ අපේ දුරකතනය නාද වුණා. ගෘහස්ත දුරකතනයට මේ වෙලාවට කවුරුවත් කතා කරන්නෙ නැහැ. මං ගිහින් කතා කරනකොට



**ඇඳ රෙද්දකින් ඔතලා ඇයව පොලිසියට ගෙනාවා. ඊටපස්සේ කෑගල්ල රෝහලට ඇතුළත් කරා. කන්න විතරක් දීලා ඇයව සිරකරගෙන සිටියත් ඔහු ඇයට කිසිඳු ලිංගික හිරිහැරයක් කරලා තිබුණේ නැහැ**

ඒ කතා කළේ කාන්ති. ඇගේ කටහඬ අඳුනාගත් මම දුරකතනය විසන්ධි කළා. හැබැයි කාන්ති ඉකි ගහහ අඬ අඬා කතා කළේ. ඊට පසුදාත් දුරකතනය නාද වුණා. මම ගත්තෙ නැහැ. එකදිගට සතියක් ගනිද්දි එක දවසක් මං කතා කරා. **"අනේ සර් මේ මිනිහා මාව හිර කරගෙන දැන් අවුරුද්දක්. අනේ සර් මේ දුරකතන අංකය කෑගල්ල පොලිසියට දීලා මාව මෙතැනින් ගලවගන්න."** මම අංකය ලියාගත්තට මට මේ ළමයා විශ්වාස නැහැ. මොකද එයා අප ඉදිරියේ හිටියෙත් සියල්ල වහගෙන. මං හිතුවේ මේකත් එයාගේ බොරුවක් කියලයි. ඒත් මං ඒ අංකය කාන්තිගේ තාත්තා අතට පත්කරා. කෑගල්ල පොලිසිය ඒ දුරකතන අංකය ඔස්සේ ගිහින් ඇයව සඟවාගෙන හිටිය තැනින් මුදාගත්තා. ඒ මොහොත වනවිට ඇය ළඟ ඇඳුමක්වත් තිබිලා නැහැ. ඇය පැනලා යයි කියන බයට. ඇඳ රෙද්දකින් ඔතලා ඇයව පොලිසියට ගෙනැවිත් තිබුණා. ඊටපස්සේ කෑගල්ල රෝහලට ඇතුළත් කරා. අර පුද්ගලයාව අල්ලගත්තා. කන්න විතරක් දීලා ඇයව සිරකරගෙන සිටියත් ඔහු ඇයට කිසිඳු ලිංගික හිරිහැරයක් කරලා තිබුණේ නැහැ. මේ සිද්ධිය සිදුවෙලා වසර පහළොවක් විතර ඇති. ඇයට වෙච්ච දේ අද වෙනතෙක් ඇය කාටවත් කියලා නැහැ. ඔහු ඇයව ගෙන ගියේ ඇයි? ඇය එය කිසිදක හෙළිකළේ නැහැ.

ඇයට උපාධිය අහිමි වුණා. ඇයව විවාහ කරදීමට අම්මා තාත්තා තැත් කළත් ඒ දෙදෙනා ගැන ඇයට විශ්වාසයක් තිබුණේ නැහැ. ඇයට මනමාලයෙක් සෙවීමට මමත් මගේ බිරිඳත් දරුවනුත් මනමාල ගමන් ගියා. එය අපේ දරුවන්ට විනෝදජනක ඇත්දැකීමක් වුණා. අවසානයේ අපි එකතු වී කොළඹ කෙනෙකුට ඇයව විවාහ කර දුන්නා. විවාහයවත් දෙමව්පියන්ගේ නිවසේ ගැනීමට කාන්ති අකමැති වුණා. එය සිදුකළේද අපේ නිවසේයි. අද එක දියණියකගේ මවක් වන කාන්ති ඉතාමත් ප්‍රීතිමත් ජීවිතයක් ගෙවනවා. ඇයට ලැබුණේ ලෝකයකින්වත් හොයාගත නොහැකි වාසනාවන්ත ස්වාමි පුරුෂයෙක්. එමා බෝවරි ඉගැන්වූ පසු මට ලිපියක් ලියා තිබුණේ ඇය බව මා දැනගත්තේ ඊට බොහෝ කලකට පසුයි. සංවේගයටත් ප්‍රීතියටත් පත්වූ කතාවක් යැයි මා කී දේ මගේ දූලාට පැහැදිලි වෙතැයි හිතෙනවා. ඇයගේ



ජීවිතයට සිදුවූ වරද ලෙස මා දකින්නේ දෙමාපියන්ගේ දරදඬු ස්වභාවයයි. මම ඇගේ පියා නොවෙයි. ලේ ඥාතියෙකුත් නොවෙයි. මගේ පමණක් නොව මගේ බිරිඳගේ, දරුවන්ගේ රැකවරණය ඇයව ජීවත් කළා. දැන් ඇගේ දෙමාපියෝ මියගිහින්. ගුරුවරයෙකුට සිය දියණියකට මේ සා විශාල යුතුකමක් ඉටු කිරීමට ලැබීම මට ජීවිතයේ සැඳෑ සමය තුළ ලද මිහිරි මතකාවලියක්. එක්කෝ ඇය මගේත් බිරිඳගේත් ගිය ආත්මයේ දියණියක්ද වූවා විය යුතුයි. ඇත්තටම එසේ විය හැකියි.

කෙනෙකුට හිතෙන්න පුළුවන් ඇයි මේ දුවට මෙහෙම වුණේ කියලා. එයාගෙ පවුලේ තවත් සහෝදරයින් දෙදෙනෙකු හිටියා. ඉතින් ඇගේ අම්මයි තාත්තයි කොල්ලො දෙන්නා රත්තරන් කියලා හිතාගෙන උන් දෙන්නට සැලකුවට මේ දුවව නොසලකා හැරලා තිබුණා. ඒ නොසලකාහැරීම තමයි ඇයව ඒ තැනට තල්ලු කරලා තිබුණේ. ඒ නිසා මේ ලිපිය බලන අම්මලාට මම මතක් කරන්න කැමතියි, මුලදී නොසලකා හැරලා පස්සේ දුවලා හිතුවක්කාර වුණා කියලා චෝදනා කරලා වැඩක් නෑ. එතකොට නොවිය යුතු ගොඩක් දේ සිද්ධ වෙලා තියෙන්න පුළුවන්.

අත්තනායක එම්. හේරත්

ශ්‍රී ලංකාවට මුල්ම ඔලිම්පික් පදක්කම දිනාදුන්නේ ඩන්කන් වයිට් ය. ඒ 1948 වසරේ ලන්ඩන් ඔලිම්පික් උළෙලේදී මීටර් 400 කඩුලු පැනීමේ ඉසව්ව නියෝජනය කරමිනි. එදා ඔහු දිනූ රිදී පදක්කමෙන් පසු වසර 52ක් ගියත් ශ්‍රී ලංකාවට යළිත් ඔලිම්පික් පදක්කමක් දිනාගැනීමට හැකියාවක් ලැබුණේ නැත. එහෙත් 2000 වසරේ පැවති සිඩ්නි ඔලිම්පික් උළෙලේදී ඒ හපන්කම කරන්නට තරුණියක් සමත්වූවාය. ඒ 'ආසියාවේ කළු වෙළඹ' ලෙසින් නම් දරා සිටි සුසන්තිකා ජයසිංහ ය. ක්‍රීඩාවට සමුදීමත් සමඟ ඇය ගැන කතා වරින්වර මතු වුණත් පසුගිය කාලයේ තිබුණේ දිගු නිහැඬියාවකි. නමුත් ඒ නිහඬ බව බිඳිමින් මේ දිනවල සුසන්තිකා යළිත් කරළියට පැමිණ ඇත. ඒ ශ්‍රී ලංකා කාන්තා ක්‍රිකට් කණ්ඩායමේ උපදේශක තනතුරකට ඇයව පත්කිරීමත් සමඟය. ධාවන ශූරියක්ව ක්‍රිකට් තනතුරකට පත්කිරීම ගැන සියල්ලෝ අදහස් දක්වමින් සිටිති. එවන් මොහොතක ඇගේ අදහස දැනගන්නට අපි සුසන්තිකා ජයසිංහට කතා කළෙමු.



# දුවන්නේ නැතුව කාටවත් ක්‍රිකට් ගහන්න බෑනේ ඒ නිසා මං මේ තනතුරට සුදුසුයි

## සුසන්තිකා ජයසිංහ

**සුසන්තිකා දැන් ගෙවන ජීවිතේ කොයි වගේද?**

මං දැන් පදිංචි කොළඹ. මට දරුවෝ දෙන්නෙක් ඉන්නවා. පුතාට වයස අවුරුදු 14යි. දුවට 10යි. අම්මා තාත්තත් දැන් ගොඩාක් වයසයි. ඒ වගේම එයාලා අසනීපයි. එයාලගේ හැමදේමත් කරන්නේ මගේ අතින්. එතැනින් ගියාම රාජකාරී ජීවිතය ගත්තොත් ආයෙත් මට ක්‍රීඩාවත් එක්ක කටයුතු කරන්න අවස්ථාව ලැබිලා තියෙනවා. ඉතින් ඒ හැමදේම එක්ක මං දැන් හරිම කාර්යබහුල අවිවේකී ගැහැනියක් වෙලා.

**පසුගියදා ඔබට ක්‍රිකට් ක්‍රීඩාව තුළ ලොකු තනතුරක් ලැබුණා. ඒ ගැන කිව්වොත්?**

ඔව් මට ශ්‍රී ලංකා ජාතික කාන්තා ක්‍රිකට් කණ්ඩායමේ සංවර්ධනය පිළිබඳ උපදේශක තනතුරක් ලැබුණා. ඒ ගැන ලොකු සතුටක් තියෙනවා. මොකද මලල ක්‍රීඩාව තුළින් සමුගැනීමත් එක්ක මට ලොකු ආසාවක් වගේම අවශ්‍යතාවයක් තිබුණා ක්‍රීඩාව වෙනුවෙන් යම්කිසි දෙයක් කරන්න. මං ඒ වෙනුවෙන් දීර්ඝ කාලයක් බලාගෙන හිටියා. ඒත් මට එහෙම අවස්ථාවක් ලැබුණේ නෑ. හැබැයි ඔන්න දැන් මට ඒ අවස්ථාව ලැබිලා තියෙනවා.

**ඔබ ඔලිම්පික් ධාවන ශූරියක්. ක්‍රිකට් කියන්නේ ඊට හාත්පසින්ම වෙනස් ක්‍රීඩාවක්. ඉතින් කොහොමද සුසන්තිකාව මේ තනතුරට ගැළපෙන්නේ?**

ක්‍රිකට් ක්‍රීඩාවේ මලල ක්‍රීඩාව තියෙනවනේ. මොකද දුවන්නේ නැතුව ක්‍රිකට් ගහන්න බෑනේ. ක්‍රිකට් ගහන ඕනෑම කෙනෙක්ට දුර දුවන්න පුළුවන් වෙන්නත් ඕන කෙටි දුර දුවන්න පුළුවන් වෙන්නත් ඕන. මොකද වේගය හරහා තරඟයක් කණපිට පෙරළෙන්න පුළුවන්.

**අපට කියන්නකෝ ලැබුණු තනතුරේ ස්වාභාවය කොයි වගේද?**

මේ ලැබුණු තනතුර ගැන ගොඩාක් අය එක එක කතා කියලා තියෙනවා දැක්කා. ඒ ඉතින් අවබෝධයක් නැතිකමනේ. මෙහෙමයි, මට තියෙන්නේ ක්‍රිකට් ගහන්න නෙවෙයි. ඒ වගේම ක්‍රිකට් ගහන කෙල්ලෝ ටිකට ක්‍රිකට් ගහන හැටි උගන්වන්නත් නෙවෙයි. ප්‍රධාන වශයෙන් මට තියෙන්නේ තරඟයට කලින් ක්‍රීඩිකාවන් නිවැරදි ක්‍රීඩිකාවක් විදියට සූදානම් කරන එක. ඒ කියන්නේ ඒ අයගේ ශාරීරික යෝග්‍යතාවය බලන එක. ඒක හරියට නැත්නම් ඒක හදන එක. එතැනින් ගියාම එයාලට ඉලක්කයකට යද්දි කොයි වගේ කැපකිරීමක්ද කරන්නේ කියලා පෙන්නලා දෙන එක, අභියෝග ජයගන්න හැටි කියලා දෙන එක. ඒ වගේ දේවල් තමයි මට කරන්න තියෙන්නේ.

**අපි දැක්කා මේ තනතුර ලැබීම ගැන ඔබ ගොඩාක් සතුටු වෙනවා. ඒ සතුට අස්සෙත් අපි නොදන්න කතාවක් තියෙනවද?**

ඔව් තියෙනවා. මුලදිත් මං කියපු විදියට කාලයක් තිස්සේ මං බලාපොරොත්තුවෙන් හිටියා මං ලබපු ක්‍රීඩා ජයග්‍රහණ හා සමාන සේවයක් මේ රටේ ක්‍රීඩාව වෙනුවෙන් කරන්න. ඒත් කවුරුත් මට ඒකට ඉඩක් දුන්නේ නෑ. ඒත් මෙදා සැරේ වත්මන් ක්‍රීඩා අමාත්‍ය රොෂාන් රණසිංහ මහත්තයා ඒකට ඉඩක් හදලා දුන්නා. මං ගමේ අවුරුදු උත්සවේ ඉඳන් ඔලිම්පික් දක්වා ගිය කෙනෙක්. ඉතින් ඒ කාලසීමාව තුළ ලබපු අත්දැකීම් එක්ක දෙයක් කරන්න ලැබුණු මේ අලුත් තනතුර ගැන සතුටු නොවී කොහොමද?

**හැබැයි සුසන්තිකා සහ ක්‍රිකට් කියන්නේ බෝල්ට් ඇණයි කිරි හොදියි වගේ ගැළපීමක් නැති යුගළයක් කියලා සමහරු ඔබව හාස්‍යයට අරන් තිබුණා?**

මමත් දැක්කා. අතේ ස්මාර්ට් ෆෝන් එකක් තියෙනවා නම් ෆේස්බුක් ඉන්නවා නම් ඕන කෙනෙක්ට ඕන දෙයක් කියන්න පුළුවන්. මං ඉතින් ඒ වගේ දේවල්වලට උත්තර දෙන්න යන්නේ නෑ. අනික ඉතින් ක්‍රිකට් බෝඩ් එක තීරණය කරලා තියෙනවා නම් මං මේ ක්‍රිකට් උපදේශක තනතුරට සුදුසුයි කියලා එතැනින් එහා කතාවක් නෑනේ.

**කවුරු හරි ඔබේ මූණටම කිව්වොත් ඔබ ක්‍රිකට් උපදේශක වගේ තනතුරකට ගැළපෙන්නේ නෑ කියලා?**

එහෙම කියන්න බෑනේ. මොකද ඕනෑම ක්‍රීඩාවකට ශාරීරික යෝග්‍යයතාව කියන එක හරියට තියෙන්න ඕනේ. යම්කිසි ක්‍රීඩකයෙක්ට ශාරීරික යෝග්‍යතාව නැත්නම් ඒක හදාගන්නේ නැත්තම් ශක්තිමත් නැත්නම් ධෛර්යමත් නැත්නම් ආත්ම විශ්වාසයක් නැත්නම් කවදාවත් ජයග්‍රහණයක් ලබන්න බෑනේ. ඒක ඕනම ක්‍රීඩාවකට පොදුයි. ඒ නිසා කාටවත් කියන්න බෑ මාව මෙතැනට ගැළපෙන්නේ නෑ කියලා.

**සුසන්තිකාට හිතෙන විදියට ඔබෙන් වැඩක් ගන්න මෙච්චර ප්‍රමාද වුණේ ඇයි?**

ක්‍රීඩාව ගැන නොදන්න උදවිය ක්‍රීඩාවේ මුල් පුටුවලට ආවම එහෙම වෙනවා. උදාහරණක් විදියට මොකක් හරි ක්‍රීඩා සංගමයක මුල් පුටුවකට දිස්ත්‍රික් මට්ටමින් ජයග්‍රහණයක් ලබපු කෙනෙක් ආවා කියලා හිතන්නකෝ. ඉතින් එයා කීයටවත් මං වගේ ඔලිම්පික් ගිය කෙනෙක් එතැනට ගන්නේ නෑනේ. මොකද බයයි. අපේ රටේ ක්‍රීඩාව වළපල්ලට යන්න හේතුවත් ඒකයි. ඒත් දැන් දුර දක්නා නුවණක් තියෙන ක්‍රීඩා අමාත්‍යවරයෙක් පත්වෙලා ඉන්නවා. ඔහු ක්‍රීඩාව සුද්ධ කරමින් ඉන්නේ. මට මේ තනතුර ලැබීමත් එහි සුබවාදී ප්‍රතිඵලයක්. කවුරුහරි කමක් නෑ ප්‍රමාදවෙලා හරි මගෙන් වැඩක් ගත්ත එක ගැන නම් අවංකවම සතුටුයි.

**මේ වෙනකොට කාන්තා ක්‍රිකට් කණ්ඩායම එක්දින ලෝක කුසලානය වෙනුවෙන් විදෙස්ගත වෙලා ඉන්නේ. ඒත් ඔබ ලංකාවේ. ඒක හරිද?**

මං කණ්ඩායම එක්ක යන්න ඕන නෑ. මොකද මං මේ තනතුරට ආවේ එහෙම යන්න නෙවෙයිනේ. හැබැයි කණ්ඩායම යන්න කලින් මං එයාලව මුණගැහිලා අවශ්‍ය කරන ශාරීරික යෝග්‍යතාවය හරියට තියාගන්න හැටි, ඉලක්කයකට නිවැරදිව යන හැටි, තරඟය තුළ සාමූහික හැඟීම වර්ධනය කරගන්න හැටි, ලෝක ශූරියක් වෙන හැටි වගේ අවශ්‍ය උපදෙස් ටික දුන්නා. කෙටියෙන්ම කිව්වොත් කෙල්ලෝ ටික ලෝක කුසලානයට ජයග්‍රාහී මනසකින් තමයි යැව්වේ.

**ඔබේ ක්‍රිකට් ආගමනයත් එක්ක සමාජ මාධ්‍යයේ අපි දැක්කා අපේ ක්‍රීඩිකාවෝ ආයෙත් දුවද්දී දැවී යන්නේ (Run Out) එහෙම නැතිවෙයි කියලා තිබුණා. ඇත්තටම එහෙම වෙයිද?**

(සිනාසෙමින්) එක එක අය ඉතින් එක එක කතා කියනවා. අපි බලමු.

**සුසන්තිකාට අලුත් තනතුරත් එක්ක දැන් පැහැදිලි ඉලක්කයක් තියෙනවද?**

මේ වෙනකොට ගොඩාක් රටවල ප්‍රධාන ආයෝජන මාර්ගය වෙන්නේ මොකක්ම හරි ක්‍රීඩාවක්. මං හිතනවා ක්‍රිකට් හරහා අපේ රටෙත් ඒක කරන්න පුළුවන් කියලා. අපට හැමෝගේම සහයෝගය ලැබුණොත් ඒක කරන්න බැරි නෑ. රට ආර්ථික අතින් පහලින් තියෙන මේ වගේ වෙලාවක අපි එකතු වෙලා මේ ක්‍රීඩාව තුළින් ජයග්‍රහණය ලබාගත්තොත් රටත් නිකන්ම ගොඩ එයි. ඉතින් ඒ වෙනුවෙන් මං මගේ කොටස හරියටම ඉටුකරන්න බලාපොරොත්තු වෙනවා.

■ රුවන් එස්.සෙනවිරත්න



අතේ ස්මාර්ට් ෆෝන් එකක් තියෙනවා නම් ෆේස්බුක් ඉන්නවා නම් ඕන කෙනෙක්ට ඕන දෙයක් කියන්න පුළුවන්. මං ඉතින් ඒ වගේ දේවල්වලට උත්තර දෙන්න යන්නේ නෑ



# ආදරය සංකේතවත් කරන්න පුළුවන්

# ආදරණීය වීමෙන් විතරයි!

## මහාචාර්ය වාසනා මෛත්‍රී හේරත්

**"ආදරය කියන හැඟීම හරියටම විස්තර කරන්න බැහැ. කොයිතරම් නිර්වචන දුන්නත් තාම මේ හැඟීම නිර්වචනය කරන්න කාටවත් පුළුවන් වෙලා නැහැ. එම හැඟීම ඇතුළේ එක එක්කෙනාට දැනෙන දේ වෙනස්. එක එක්කෙනා හැසිරෙන විදිහ වෙනස්. හිතන විදිය වෙනස්. වෙන කෙනෙක්ට දැනෙන ආදරයක් මට විස්තර කරන්න බෑ වගේම මගේ හැඟීම තව කෙනෙකුට විස්තර කරන්න බෑ. ඒ නිසා හැමෝම නිර්වචන දෙන්නේ ආදරය ගැන තමන්ට දැනෙන විදියට."**

**ආදරය පිළිබඳ වැඩිපුරම කතා කරන පෙබරවාරි 14 දිනට දිනක් ඉතිරිව තිබියදී එම ආදරණීය වදන් පෙළ ගොනුකළේ මෙරට සන්නිවේදන විද්‍යාව පිළිබඳ එකම මහාචාර්යවරිය වන වාසනා මෛත්‍රී හේරත් මහත්මියයි. ඇය සේවය කරන්නේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ වන අතර එහි වෘත්තීය මාර්ගෝපදේශනය සම්බන්ධ අධ්‍යක්ෂවරියද ඇයයි.**

**එමෙන්ම කැලණිය විශ්වවිද්‍යාලයේ සන්නිවේදන කුසලතා පිළිබඳ ආචාර්ය උපාධිධාරිනියකද වන ඇය, තරුණ සරසවි සිසු සිසුවියන්ගේ ආදරයෙන් බිඳුණු හිත් සුවපත් කිරීම ඇතුළු මනෝවිද්‍යා උපදේශකවරියක ලෙසද කටයුතු කරන්නීය.**

**මෙවර 'ධරණී' මුල් පිටුව සැරසෙන්නේ ඇයගේ රුවෙනි.**



දෙවන ක්ලෝඩියස් රජුගේ සමයේ රෝම සොල්දාදුවන්ට ආදරයත් විවාහයත් තහනම් මාතෘකා විය. ඔවුන් රාජ්‍ය වෙනුවෙන් කැපවීම විනා ඔවුන්ට වෙනත් ජීවිතයක් නැති ලෙසින් එකල නීතිරීති පැනවිනි.

එහෙත් ආදරයත් කැස්සත් සැඟවිය නොහැකි යැයි කියන්නා සේ, ඔවුන් රහසේ ප්‍රේම කරන්නට වූහ. මෙහිදී ඔවුන් වෙනුවෙන් ඉදිරිපත් වූයේ ශාන්ත වැලන්ටයින් පූජකවරයාය. ඔහු රහසිගත ක්‍රිස්තියානි උත්සවවලදී ඔවුනට විවාහ වීමට අවස්ථාව සලසා දුන් අතර, ආදරය වෙනුවෙන් පරිත්‍යාගශීලී මෙහෙවරක නිරතවිනි. අවසානයේ රජුගේ උදහසට ලක්ව පූජකවරයාට ජීවිතයෙන් වන්දි ගෙවන්නට සිදුවිය.

එහෙත් ආදරය වෙනුවෙන් ඔහු කළ දේ කොතරම්ද? සෑම වසරකම පෙබරවාරි 14දා ලොව පුරා වැසියන්, වැලන්ටයින් දිනය සමරන්නේ, ආදරය ප්‍රේමය ආදී බැඳීම් මුල්කර ගනිමිනි.

"ආදරය කියන්නෙම හැඟීමක්..." වාසනා මෛත්‍රී මහාචාර්යවරිය අප කතාබහට අවතීර්ණ වූයේ එලෙසිනි.

**"මේ හැඟීමත් එක්ක තවත් බොහෝ හැඟීම් සම්බන්ධයි. හැඟීම් කියන්නේ අපිට අත්‍යවශ්‍ය දෙයක්, ලස්සන දෙයක් වගේම එක් පැත්තකින් බැලුවොත් හරි භයානක දෙයක්. ඒ නිසා හැමකෙනෙක්ම හැඟීම් ගැන අවබෝධයකින් ඉන්න ඕන. ඒක තරුණ අයට විතරක් අදාළ දෙයක් නෙමෙයි. ආදරය කියන හැඟීම ගැන ගොඩක් අයට තියෙන්නේ වැරදි අවබෝධයක්. මේ අවබෝධය එන්නේ අහන දකින දේවල් නිසා. වැරදි අවබෝධය වගේම වැරදි ආදර්ශයන් නිසා ගොඩක් අයගේ ජීවිත විනාශවෙන අවස්ථා තියෙනවා. ඒ හින්දා හැමකෙනෙක්ම ආදරය කියන හැඟීම ගැන වගේම බිය, සතුට, දුක, ඊර්ෂ්‍යාව, තරහව වගේ අනෙකුත් හැඟීම් ගැනත් අවබෝධයක් ලබාගන්න ඕන."**

එම හැඟීම් සමඟින් තවත් කාරණා කිහිපයක් බැඳී තිබේ. සතුට, සැනසීම, ආකර්ෂණය, රැකබලාගැනීම්, විඳීම් වැනි සාධනීය දේත් දුක, කේන්තිය, ඊර්ෂ්‍යාව, බිය වැනි නිශේධනීය දේත් ඒ තුළ තිබේ. ආදරය කියන 'හැඟීම' ප්‍රධාන දේ නම්, ඒ සමඟින් බැඳුනු අනෙකුත් හැඟීම් අඩුවැඩි වීමෙන් ප්‍රධාන හැඟීම ලස්සන වීමක් සිදුවේ.

"උදාහරණයක් විදිහට සතුට, කැපවීම වැඩිනම් ආදරය ලස්සන වැඩියි. තරහා, ඊර්ෂ්‍යාව, සැකය වැඩිනම් එතැන ප්‍රශ්න, රණ්ඩු වැඩියි. එතැනදී තමන්ගේ ආදරය ලස්සන කරගන්න තමන් ඉගෙනගන්න ඕන. ඒක අනිත් කෙනාටත් කියලා දෙන්න ඕන. ඕනම කෙනෙක් ඉවසීම, දරාගැනීම, පිළිගැනීම වගේ දේවල් ජීවිතයට එකතු කරගන්න අවශ්‍ය වෙනවා ආදරය වෙනුවෙන්. ඒ වගේම තමන්ගේ සතුට, යහපත වෙනුවෙන්.

ඒ වගේම එක හැඟීමක් ඇතුළේ අනිත් හැඟීම් හසුරුවාගන්න, තෝරාගන්න හැමකෙනෙක්ම ඉගෙනගන්න ඕන. එහෙම නැති වුණාම හැමදේම පටලවා ගන්නවා අපි. ජීවිතයම කරදරවල දා ගන්නවා. ඒ නිසා ආදරය කියන හැඟීම ඇතුළේ වැඩියෙන් තියෙන්න ඕන මොනවද කියලා තීරණය කරන්න ඕන. ඒ අනුවයි ඒ ආදරය ලබන කෙනයි දෙන කෙනයි අතර තියන සමස්ථය තීරණය වෙන්නේ. ආදරයේ සංකේතයක් හැටියට රෝස මල ගත්තත් රෝස මලකින් ආදරය පෙන්වන්න බැහැ. ආදරයේ සංකේත කියලා අපි හදාගත්තට ආදරය සංකේතවත් කරන්න පුළුවන් ආදරණීය වීමෙන්ම විතරයි. ආදරයේ සංකේතය වෙන්න තමන් ආදරය කරන කෙනාට. එයයි වැදගත් වෙන්නේ.

'සිහින දෙව්දුවේ නුඹට තුන්ලොවේ එකම නමයි මා දන්නේ ඒ නම ආදරේ...'

තමන් ආදරය කරන කෙනාගෙන් ඒක දකින්න පුළුවන්නම් ඒක තමයි ආදරය. ආදරයේ සංකේතය පොදු දෙයක් කරගන්න එපා. තමන් ආදරය කරන කෙනාට ඒ ආදරයේ සංකේතය වගේම ආදරයේ අර්ථය වෙන්න."

එසේ නොවුණු විට බැඳීම් බිඳීයන අතර සමාජය දෙස බලද්දීද අපට පෙනෙන්නේ වැඩිපුරම ඇත්තේ බිඳෙන බැඳීම් බවයි. ඇතැම්විටක බැඳීම ආරක්ෂා කරගැනීම උදෙසා ගනු ලබන වැරදි ක්‍රමවේද නිසාම බැඳීම් බිඳීයාම සිදුවිය හැකිය. ආදරය කරන අයෙකු බලාපොරොත්තු වන්නේ ආදරය, සැනසීම, ජීවිතයට සවියක් මිස විඳවීම හඬාවැටීම නොවේ. කොතරම් ආදරය වුවත් රිදවීම්, වදදීම් වේ නම් එම ආදරයෙන් ලැබෙන දෙයක්ද නොවේ.

උදේ සිට රෑ වෙනතුරු අවලාද නගනවානම්, ගරහනවා නම්, එය අන්තිමට නවතින්නේ හිසරදයක් වීය. එවිට එතැනින් ඉවත්වයාමට ආදරවන්තයාට හෝ ආදරවන්තියට සිතීම අරුමයක් නොවේ. එවිට ඒ හැරයන කෙනා දෙස ද්වේෂසහගත වීමද තේරුමක් නැති දෙයකි.

'ආදරය' පුහුණු විය යුතු දෙයක් වන්නේ එහි විවිධ පැති තිබෙන බැවිනි. දෙමාපියන්ට, නෑ හිතවතුන්ට, යහළුවන්ට අපි දක්වන ආදරය එකකි.

"ආදරය පුහුණුවෙන්න දරුවෙකුට ආදරය හොඳ අත්දැකීමක් වෙන්න ඕන. පුංචිම කාලෙ දරුවාට ආදරය ගැන අවබෝධයක් ලබාදෙන්න ඕන. ගොඩක් අය ආදරය නිසා දුක් විඳින්නේ නොගැළපෙන අය එක්ක සම්බන්ධයක් ගොඩනගාගත්තමයි. සමහර අය ඒ සම්බන්ධතාවලදී කුහකයි. තමන් ගැන පමණයි හිතන්නේ. ඒකෙන් දුක් විඳින්නේ ඒ කෙනාට ආදරේ කරන අනිත් කෙනා. කුහකකම්, දුෂ්ටකම් ඒ අය අරන් එන්නේ ගොඩක් වෙලාවට පවුල තුළ ලැබූ කටුක අත්දැකීම් එක්ක වෙන්න පුළුවන්. එහෙම අය එක්ක ජීවත්වෙන්න පහසු නෑ. ඒ අය එක්ක ඉන්න අයත් ජීවිතේ විඳවනවා. ඒ නිසා ආදරය පවුල් පසුබිම ඇතුළෙම අත්දකින්න දරුවන්ට සලස්වන්න ඕන. ඒ ගැන කියලා දෙන්න ඕන. වැරදි නිවැරදි කරවන්න ඕන. මේවා දෙමාපියන් කළ යුතු දේවල්. හැබැයි එහෙම කරන්න නම් දෙමාපියනුත් තමන්ගේ ආදර්ශය දෙන්න ඕන."

ආදරය හේතුවෙන් ඇතිවන සතුට වාගේම දුක වේදනාව දරාගැනීමේ ශක්තිමත් හිතක් ඕනෑම කෙනෙකුට වැදගත්ය. එය පුරුදු පුහුණු කළ යුතු ජීවන කුසලතාවයක් යැයි කීම වැරදි නැත. විශේෂයෙන් ජීවිතයේ දිනුම වාගේම පැරදුමට මුහුණ දෙන්නට හැකිවන්නේ එමගින් තමන්ට යමක් අවබෝධ කරගැනීමට ඇති පරාසය අනුවය. එය ළමාවිය හා බැඳී පවතී.

**"දරුවෙකුට ජීවිතයේ දිනුම පැරදුම දෙකම අත්දකින්න දෙන්න ඕන. එතකොට තමයි අත්දැකීම් එක්ක ඔවුන් පන්නරය ලබන්නේ. එතැනදී අත්දැකීම් ලබන්න පරාද විය යුතුයි කියලාම දෙයක් නැහැ. දෙමව්පියන්ට පුළුවන් ඔවුන්ට ඒ දේවල් කියලා දෙන්න. මේ දේ මෙහෙම වුණත් තවත් අවස්ථා ජීවිතයට තියෙනවා කියලා. ඒ අවස්ථාව මේ අවස්ථාව වඩා සාර්ථක පියවරක් වෙන්නත් ඉඩ තියෙන බව පහදා දෙන්න පුළුවන්. ඒ වගේම දරුවෙකුට නිතරම හොඳ නරක ගැන කියලා දෙන්න ඕන. හැඟීම් ගැන දැනෙන්න දෙන්න ඕන. යමක් මැදහත්ව දරාගන්න පුළුවන් වෙන්නේ එතකොට."**

ඇය කියන්නේ ආදරයෙන් පරාජය වෙන්නට වුවහොත්, ඊට වර්තමානයේ බොහෝදෙනා ඊට ප්‍රතිචාර දක්වන්නේ ප්‍රචණ්ඩකාරීව බවයි. එමෙන්ම ඊට විසඳුම් සොයන්නේ අනෙකාට ජීවත්වීමේ වරම අහිමි කරමිනි. නොයෙකුත් පලිගැනීමේ ක්‍රමවලටද ඔවුන් පෙළැඹේ. එහෙත් විය යුත්තේ එය නොවේ.

"මෙය වෙනස් කරන්න නම් තව කෙනෙකුට ආදරය කරන්න කලින් තමන් තමන්ට ආදරය කරන්න ඉගෙනගන්න ඕන. තමන්ගේ ජීවිතය තමන්ට වටිනබව අවබෝධ වෙද්දි තව කෙනෙක් නිසා අනුචණ දේවල් කරන්න පෙළැඹෙන්නේ නැහැ. ඒ තමන් ගැන අවධානය තමන්ට තියෙන නිසයි."

එහෙම අයෙකුගෙන් තවත් අයෙකුගේ ජීවිතය යහපත්ව පවත්වාගෙන යන්නට උදව්වක් තල්ලුවක් ලැබෙනවා විනා නරකක් අවැඩක් සිදුවන්නට ඉඩක් නැත.

■ දීපා වසන්ති එදිරිසිංහ

# ලෝකෙට ලොක්කෝ නෝනා ළඟ සොක්කෝ

## මහාචාර්ය අත්තනායක එම් හේරත් කියයි

'සක්විති නුඹය හිස මිනි මුතු නැති වෙච්චි
හිත ගත නුඹේ අප රැකි දඬු වැට වෙච්චි
ඒ සා විසල් රැකවල් කොහි සැඟ වෙච්චි
නුඹ කොතැනද කියපන් අපෙ අප්පච්චි'

ඒ කාලේ අපේ අම්මලා ගොඩක් දෙනෙක් අද වගේ රස්සාවල්වලට ගියේ නෑනේ. ඒ නිසා පීතෘ මූලික සමාජයේ ගම්දෙරවල්වල 'සශ්‍රීකත්වය' කියන එක ගොඩක්වෙලාවට රඳා පැවතුනේ අප්පච්චිගේ අනුහස නිසා. ඉතින් මේ ජනකවියෙන් කියැවෙන්නේ අප්පච්චි නැතිවුණාට පස්සේ නැතිවෙච්ච ඒ සශ්‍රීකත්වය ගැන.

අප්පච්චි නැතුව හිස්වුණ කෙත්වතු පාළුවට ගිහිල්ලා. මායිම් නියරවල් වල් වැදිලා. ගෙදර බුදුපහන ළඟ මල් හිඟවෙලා. රත්තිත් වහු පැටියත් බලාගත්තු අත බලාගෙන. අපි ඔක්කොටම මේ තරම් ජීවයක් දුන්නෙ අපේ අප්පච්චි. එහෙව් අප්පච්චි නැතිවුණ දාක සශ්‍රීකත්වයත් ඉවරයි කියලයි මේ කියන්නෙ.

අද අපි ඔහොම කවියකින් කතාව පටන්ගත්තෙ අද කතා කරන්නෙත් අප්පච්චිලා ගැනම නිසයි. මේ කියන විදියට ඒ කාලෙ පවුල්වල වීරයා වුණේ අප්පච්චිලා. ඒ වගේම දුවෙකුට ඇගේ පළවැනි පෙම්වතා වෙන්නෙත් එයාගේ අප්පච්චි කියලා කියනවානේ. අනික එදා අම්මලා බත්හැලියෙන් මුල්ම බත් හැන්ද බෙදුවෙත් දරුවන්ගෙ අප්පච්චිට. ඒ විතරක් නෙවෙයි "උඹලගෙ අප්පච්චි නිසයි අපි හැමෝගෙම බඩ කට පිරෙන්නෙ" කියලා දරුවන්ට ඇහෙන්න අප්පච්චිට ස්තූති කළා කියලත් කියනවා. සමහරවිට ඒ කාලෙත් උදේ ඉඳන් මහ රෑ වෙනකන් හේන් කොටලා, දස මහා යෝධයෙක් වගේ මහපොළොවත් එක්ක ඔට්ටු වෙලා රෑට ගෙදරට එන අප්පච්චිලා ඇඟේපතේ විඩාවට රා ටිකක් තොල ගාගෙන එන්නත් ඇති. ඒත් ඒ බවක් කියලා එදා අම්මලා කවදාවත් දරුවෝ ඉස්සරහා ඔහුව හෑල්ලුවට ලක්කළ බවක්නම් අපි අහලා නෑ.

හැබැයි අද කාලේ බහුතරයක් අම්මලාගේ ජීවිතවල ලොකුම වීරයා දරුවන්ගේ අප්පච්චි නම් නෙවෙයි. ඒ අය කැමතිම හින්දි ටෙලිනාට්‍යයේ රඟපාන ප්‍රධාන නළුවා තමයි ගොඩක් වෙලාවට ඒ අයගේ වීරයා වෙන්නේ.

ඒ නිසාම පියවරුන්ගේ පෞරුෂය අද මව්වරුන් විසින්ම දරුවන් ඉදිරියේදී හෑල්ලුවට ලක්කරන තත්ත්වයකට පත්වෙලාද කියලත් අපිට හිතන්න වෙලා තියෙනවා.

ඒ ගැන මේ කතාබහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මහාචාර්ය අත්තනායක එම්.හේරත් මහතා සමඟයි.

ඇත්තටම අද වෙනකොට ඔය ප්‍රශ්නෙ නගරබදව විතරක් නෙවෙයි ගම්බදවත් ඕනතරම් දකින්න තියෙනවා. ඒ නිසාම දරුවෝ ඉස්සරහා හෑල්ලුවට, සමච්චලයට ලක්වෙලා මගේ ළඟට ඇවිත් දුක කියපු පියවරුත් ඕනතරම් ඉන්නවා.

මෑතකදී මේ නුවර පළාතෙම එක මහත්තයෙක් මාව හොයාගෙන ආවා. ඇවිත් කිව්වා **"අනේ අත්තනායක මහත්තයෝ මම මුළු ජීවිතේම දියකරලා ඇරියේ ගෑනිටයි දරුවන්ටයි හරිහමන් ජීවිතයක් හදලා දෙන්න. නමුත් අද මට සිද්ධවෙලා තියෙන්නේ වහ කන්න"** කියලා.

පස්සෙ මම ඇහුවා එහෙම කියන්න කාරණාව මොකක්ද කියලා. කියපු විදියට එතුමා රජයේ සේවකයෙක්. පවුලේ ඉන්නෙ දුවලා දෙන්නයි, ඒ අයගේ අම්මයි. මේ මහත්තයා හැමදාම මහන්සිවෙලා යන්තම් හවසට ගෙට ගොඩවෙනකොටම හැමදාම අර ගෑනු මනුස්සයා කියනවලු **"මම දවස තිස්සෙම ළමයින් එක්ක ඔට්ටු වෙලා ඉන්නේ. රෑට කන්න ඕනනම් කුස්සියට ගිහින් පොල් ටිකක් ගාලා දෙන්න"** කියලා. ඕන් ඉතින් ඒක කරලා තිබ්බම කියනවලු **"දුවලා දෙන්නට උදේට ඇඳගෙන යන යුනිෆෝම් දෙක අයන් කරලා තියන්න" කියලා. ඒ කරලා නිකමටවත් ප්‍රවෘත්ති ටිකක් බලන්න රූපවාහිනිය ඉස්සරහින් වාඩි වුණොත් හනිකට දුවලා ගිහින් බෙහෙත් තෙල් බෝතලයක් අරන් ඇවිත් කුමාරිහාමි වගේ අර මහත්තයගේ ඇඟ උඩින් කකුල් දෙක තියාගෙන කියනවලු "ළමයි එක්කම ඔට්ටු වෙලා මගේ කකුල් කඩිත්තුව වගේ. අනේ ඒයි මේ තෙල් ඩිංගක් ගාලා අතුල්ලන්නකෝ"** කියලා. ඉතින් අර දූලා දෙන්නත් පැත්තක ඉඳන් අම්මගේ මේ කෙරුවාවල් ටික හොඳට බලාගෙනලු ඉන්නේ. ඊටපස්සේ නිකමටවත් අර තාත්තා ඒ දූලාට අවවාදයක් උපදෙසක් දෙන්න ගියොත් ඒ අය කියනවලු **"අම්මට වහල්කම් කරලා අපිට වීරයෙක් වෙන්න එපා"** කියලා. හරිනම් දරුවෝ ඔහොම කියනවා ඇහුන ගමන් අම්මෙක් කරන්න ඕනෙ මොකක්ද කියලා මම ආයේ අමුතුවෙන් පැහැදිලි කරන්න ඕන නැහැනේ. ඒත් මේ අම්මා **"ළමයි ගැන මම බලාගන්නම් තමුන් තමුන්ගේ වැඩක් බලාගෙන ඉන්න"**ය කියලා ළමයි ඉස්සරහා ආපහු සැරයක් අර මහත්තයට බනිනවලු.

අද ඉන්න සමහරක් අම්මලා එයාලා කරන ගේ දොර වැඩකටයුතු ටික ගැන ටිකක් ඕනවට වඩා හිතට අරන් කියලයි මට නම් හිතෙන්නේ. ඒ නිසා දරුවෝ ඉස්සරහා අප්පච්චිගෙ කොඳුනාරටිය කඩලා දාලා අප්පච්චි කියන චරිතය දරුවන්ට එපා කරවලා වගේ පේන්න තියනවා. ඔය සමහරක් නෝනා මහත්තුරු හරි උජාරුවට ලෝකෙටම ඇහෙන්න කියන්නේ මහත්තයා ලෝකෙටම ලොක්කා වුණත් ගෙදරට ලොක්කි මමයි කියලා. සමහරු ඉන්නවා ඒ අය ලොකු තනතුරුවලට ගියාම අර පුටුවේ තියෙන රස්නේ ගෙදර මහත්තයටත් පෙන්නනවා. හැබැයි ඉතින් ඔය අතරෙ ලෝකෙට කොයිතරම් ලොක්කියක් වුණත් ගෙදර මහත්තයට දාසියක් වගේ ඉන්න නෝනා මහත්තුරුත් නැතුවම නෙවෙයි.

ඊළඟට සමහරක් පියවරු අවුරුදු ගණන් පිටරටවල්වල දුක් විඳනවා. දරුවො පුංචි කාලෙදිම දාලා ගියාම සමහරක් දරුවන්ට තාත්තලගේ මූණවත් කොයිවගේද කියලා මතක නෑ. ඒත් කාන්තාරවල නොකා නොබී මොන දුක විඳලා හරි ඒ තාත්තලා තමන්ගේ දුවට ඉගෙනගන්න, දෑවැද්ද හදන්න, ගෙවල් හදන්න වගේම ගෙදරදොරේ වියදම්වලට සල්ලි ටික එවනවා. හැමෝම නැති වුණත් සමහරක් අම්මලා ලොක්කි වගේ බැංකුවට ගිහින් අර සල්ලි අරගෙන ළමයි ඉස්සරහා වියදම් කරනවා. ඒ ඇරෙන්න "උඹලගෙ අප්පච්චි අර කාන්තාරේ දුක් විඳින නිසයි අපි මෙහෙම ගෙට වෙලා දුකක් කරදරයක් නැතුව කාලා ඇඳලා ඉන්නෙ" කියලා නිකමටවත් කියන්නෙ නෑ.

දැන් බලන්න ඉස්සර අපේ දුවලා කසාදයක් කරගන්න යනකොට හෙව්වේ තමන්ගේ අප්පච්චි වගේ උස, ඒ වගේ ගති පැවතුම් සහ ගාම්භීරකම තියෙන කෙනෙක්. මොකද ඔය කලින් කියලා තියෙන විදියට දුවෙකුගේ පරමාදර්ශීම පෙම්වතා තමයි එයාගෙ අප්පච්චි කියන්නේ. හැබැයි සමහර අම්මලා දුවලගෙ ඒ පරමාදර්ශී පෙම්වතාව දුව ඉස්සරහාම හෑල්ලුවට ලක්කළහම අන්තිමට දුවලා සමාජෙට ගිහිල්ලා වෙන පඹගාල්වල පැටලෙනවා. දුවලා විතරක් නෙවෙයි ගෙදර අප්පච්චිගෙ කොඳුනාරටිය පණ නෑ කියලා හිතුණ හැටියේ අපේ පුතාලා වුණත් ගිහිල්ලා වැරදි ආශ්‍රයට වැටෙන්න පුළුවන්.

අන්න ඒ නිසා අවසාන වශයෙන් මම මව්වරුන්ට කියන්නේ දරුවෝ ඉදිරියේ කවදාවත් ඒ වරද කරන්න එපා. හැමවෙලාවෙම දරුවන්ට එයාලගේ අප්පච්චි වීර චරිතයක් කියන එක ඒත්තු ගන්වන්න උත්සාහ කරන්න. මොකද පවුලක ශක්තිමත්ම මුදුන් මුල තමයි අප්පච්චි. ඒ මුදුන් මුල ශක්තිමත් නෑ කියලා දරුවොන්ට වගේම රට්ටුන්ට ඇහෙන දැනෙන විදියට අම්මලා හැසිරෙන්න පටන්ගත්තොත් ඔබේ පවුල කියන මහා වෘක්ෂය ඔබටත් නොදැනිම කඩන් වැටෙන්න පුළුවන්.

■ ලිහිණි මධුෂිකා


සුද්දෙක් වගේ A to Z කථාකරමුද?

දැනට රැකියාවන් හී නියුතු හා උසස්වීම් අපේක්ෂිත

ගම්පහ, කළමණාකරණ හා උසස් වෘත්තීය පුහුණු අභ්‍යාස ආයතනයේ හිටපු
ජ්‍යේෂ්ඨ ඉංග්‍රීසි භාෂා උපදේශක
ලසන්ත ප්‍රියංකර සර්

නව පංති ආරම්භය
පෙබරවාරි මස
12 ඉරිදා
වේලාව උදේ 10.30 - 1.30



පැවැත්වෙන ස්ථානය : කඳුඹළුවාව සණස ශාලාව, බෙම්මුල්ල | 077 110 15 63 (ප්‍රියංකර ගමගේ) 074 227 17 39 (ප්‍රබුද්ධික)




BOC රන් කැකුළු SMART

දැනට පවත්නා හෝ අලුතින් අරඹන රන් කැකුළු ගිණුමක, රන් කැකුළු SMART ගිණුමක, ළමා අත්ථාල් ගිණුමක, හරිත කැකුළු හෝ දියවර කැකුළු ගිණුමක...

- රු. 5,000/- ක් හෝ ඊට වැඩි ගණනක් තැන්පත් කිරීමෙන් අගනා පාසල් බෑගයක්
- රු. 2,500/- සිට රු. 4,999/-ක් දක්වා තැන්පත් කිරීමෙන් වටිනා පින්තූර පොතක්
- රු. 1,000/- සිට රු. 2,499/-ක් දක්වා තැන්පත් කිරීමෙන් පාසල් මතක පොතක්
- රු. 1,000/-ට අඩු තැන්පතු සඳහා පැන්සල් කට්ටලයක්

*මෙම දීමනාව ත්‍යාග තොග අවසන් වනතුරු පමණයි.

*කොන්දේසි සහිතයි

1975 BOC CALL CENTRE www.boc.lk

A (lka) Fitch ශ්‍රේණිගත කිරීම AAA- Brand Finance ශ්‍රේණිගත කිරීම.
ලංකා බැංකුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අධීක්ෂණය කරනු ලබන බලපත්‍රලාභී වාණිජ බැංකුවකි.

ප්‍රධාන කාර්යාලය, BOC චතුරස්‍රය, අංක 1, ලංකා බැංකු මාවත, කොළඹ 1.

ලංකා බැංකුව BOC ජාතියේ මහා පහන් ටැඹ

# මහන්සියයි කාන්සියයි නිවාගන්න එන මිනිස්සු ටිකක් චිල් වුණාම ආපහු යනවා

මයික්‍රොසොෆ්ට් සමාගමේ නිර්මාතෘ බිල් ගේට්ස් කියනවා මරු කතාවක්.

**මොකක්ද?**

ඔබට ව්‍යාපාරයේ පාඩම් ඉගෙනගැනීමට තිබෙන හොඳම ක්‍රමය ඔබේ වඩාත් අසතුටු වුණු පාරිභෝගිකයින් කියලා.

**හරි... ඉතින්?**

මට හිතෙනවා ජීවිතේටත් ඔය කතාව අදාළයි කියලා.

**ඒ කොහොමද?**

ඔය අසතුටු, එහෙම නැත්නම් අතෘප්තිමත් පාරිභෝගිකයෝ කියන එකට අපි අතෘප්තිමත් ප්‍රේමවන්තයෝ, අතෘප්තිමත් නෑදෑයෝ, අතෘප්තිමත් යාළු මිත්‍රයෝ ආදී වශයෙන් ආදේශ කරලා බැලුවොත් මට හිතෙනවා ජීවිතේ පාඩම් ඉගෙනගන්න එකත් ගොඩක් ලේසියි කියලා.

**යාළුවෝ, නෑදෑයෝ පැත්තකින් තියමුකෝ. හැබැයි ඔය ප්‍රේමවන්තයෝ කියන ජාතිය ඉන්නවා නේද? ඔලුවෙන් හිටගත්තත් උන්වනම් සන්තෝස කරනවා බොරු. හරි දැන් කොහොමද**

එක කරන්න පුළුවන් වැඩක් නෙවෙයි. ඒක ආදර සම්බන්ධතාවලට වගේම අනිත් සියලු සම්බන්ධතාවලටත් පොදුයි. ඒ නිසා මේ ඉන්න ටිකේ අනිත් මිනිස්සු සන්තෝස කරන්න කියලා හිතාගෙන තමන්ගේ ආතල් කුඩු කරගන්න එක මහ අපරාධයක් කියලයි මට හිතෙන්නේ.

මොකද කොහොම කළත්, මොනවා කළත් යන එකා අර කිව්වා වගේ කොරහත් බිඳගෙනම යනවනම් අපි පිළිගන්න ඕන එක කාරණාවක් තියනවා. ඒ තමයි අපේ ජීවිතත් හරියට 'අම්බලම්' වගේ කියන එක. ඒ නිසා කැමැත්තෙන් හෝ අකමැත්තෙන් අපිට ඒ ලේබල් එක ගහගන්නම වෙනවා.

මොකද අම්බලමට මිනිස්සු වැස්සටත් ගොඩවෙනවා. හැබැයි වැස්ස පායපුවම ආපහු යනවා. දහය නිවාගන්න ඕන මිනිස්සුත් අම්බලමට ගොඩවෙනවා. හැබැයි ටිකක් චිල් වුණාට පස්සේ උනුත් යනවා. ඒත් මිනිස්සු එන එන පාරට හෝ යන යන පාරට අම්බලම රීකන්ඩිෂන් කරන්නේ නෑනේ. ඒ කියන්නේ අව්වට, වැස්සට

**අම්බලමත් කඩා බිඳගෙන. තව කෙනෙකුට මහ වැස්සකට තියා පොඩි පොදේකටවත් හෙවන වෙන්න බැරි විදියට කඩා බිඳගෙන.. ඒ නිසා ජීවිතේ අම්බලමක් කියලා හිතාගෙන තාවකාලික නැවතුම්පොළවල් හොයාගෙන එන හැමෝටම හෙවන දෙන්න ඉක්මන් වෙන්න ඕන නෑ කියන එකයි මගේනම් අදහස.**

එහෙම කියද්දී මට සේකරගේ 'ප්‍රබුද්ධ' පොතේ තියන කවියක් මතක් වුණා. ගමේ ගොඩේ මිනිහෙක් වගේම සංගීතකාරයෙක් වෙච්චි ප්‍රබුද්ධ, නගරෙදි මුණගැහුණු සංකර ජීවිතයක් උරුම යසෝද ජීවිතේට ආවම, ඇයට යන්න නොදී නතර කරගන්න පුළුවන් හැම උත්සාහයක්ම දරනවා. ශාස්ත්‍රීය ගායන ශෛලිය අතැරලා මාකට් කරන්න පුළුවන් සින්දු කැසට් පටි ගණන් ගහනවා. ඒත් යසෝදව ජීවිතේ රඳවාගන්න කරපු ඒ කිසි දේකින් පලක් නොවුණු තැන ප්‍රබුද්ධට දැනෙන හැඟීම ගැන සේකර හරි ලස්සනට මෙහෙම ලියනවා.

මට හිතෙන්නේ අවාරයේ එන මිනිස්සු නතර කරගන්න, ඒ මිනිස්සු සන්තෝස කරන්න නොයෙක් විදියට උත්සාහ කරන හැමෝගෙම ඉරණම ඔය හා සමානයි. ඒ නිසා ජීවිතේ කියන්නේ අම්බලමක් කියලා හිතාගෙන ජීවත්වෙන එක නෙවෙයිද ඇඟට ගුණ?

**එහෙම අයගෙන් පාඩම් ඉගෙනගන්නෙ?**

මෙහෙමනේ... සමහර මිනිස්සු නොහිතන වෙලාවට අපේ ජීවිතේට එනවා. ඇවිල්ලා අපේ ජීවිතවල සදාකාලික කොටස්කාරයො වෙලා නතරවෙනවා. ඒ වගේ සමහර බැඳීම්වලට දෙන්න නමක් නැතිවෙන්නත් පුළුවන්.

තවත් සමහරු දීර්ඝ කාලයක් නැවතිලා ඉඳලා ආපහු යනවා. තවත් සමහරු කෙටි කාලෙකින්ම යනවා. හැබැයි එහෙම ඇවිල්ලා ඉන්න කාලසීමාව ඇතුළත ඒ අය අපේ ජීවිතවල යම් යම් දේවල් වපුරනවා. එක්කො ආදරේ වෙන්න පුළුවන් නැත්නම් යාළු මිත්‍රකම් වෙන්න පුළුවන්. ඒ වපුරන දේවල්වලට නෙළාගන්න පුළුවන් අස්වැන්නේ ප්‍රමාණය මත ඒ අය ඉන්න හෝ යන්න හේතු හදාගන්නවා.

**මං ඒ කතාවට එකඟ නෑ...**

ඇයි?

**ඔය වපුරනවා කියන දේවල්වලට අටුකොටු පුරවන්න තරම් අස්වැන්න ලැබුණත් යන්න ඕන මිනිස්සු පැදුරටත් නොකියාම යනවා.**

ඉතින් ඒකම නෙවෙයිද අපිට ඉගෙනගන්න තියෙන පාඩම? සමහර වෙලාවට අපි කතාවටත් කියනවනේ අසවලාගේ පශ්චාත් භාගය හෝදන්න බැරිවුණු ටික විතරයි, අනිත් සියලු දේ කළා කියලා. ඉතින් එච්චර දේවල් කළාට පස්සෙත් මිනිස්සු අපෙන් ඈතට යනවනම් තේරුම්ගන්න තියෙන්නේ එක දෙයයි.

**මොකක්ද?**

මේ භද්‍ර කල්පයේම උත්සාහ කළත් සීයට සීයක් මිනිස්සු තෘප්තිමත් කරන

ගොඩවෙන මිනිස්සු නවත්තගන්න අම්බලම අමුතු උත්සාහයක් දරන්නේ නෑ. හැබැයි එන උන් ගියා කියලා අලුතෙන් ගොඩවෙන මිනිස්සුන්ට හෙවන දෙන එක නවත්තන්නෙත් නෑ.

මං කියන්නේ අපේ ජීවිතත් එහෙම වෙන්න ඕන. එන මිනිස්සුන්ට එන්න දොරවල් ඇරලා තියන්න ඕන. ඉන්න අය ඉඳියි. යන අය යයි. හැබැයි ඒ කිසි කෙනෙක් නවත්ත ගන්න අමුතුවෙන් උත්සාහ කරන්න අවශ්‍ය නෑ.

**එතැනදීත් මම ඔයා එක්ක එකඟ නෑ මිත්‍රයා...**

ඇයි?

**ඔය චිල් වෙන්න බලාගෙන එහෙමත් නැත්නම් පොඩි රෙස්ට් එකක් ගන්න බලාගෙන අම්බලමට ගොඩවෙන මිනිස්සු ඉන්නවා නේද? ඒ අතරෙ කළගුණ දන්න මිනිස්සු වගේම නොදන්න මිනිස්සුත් ඉන්නවා. එහෙම කෙළෙහි ගුණයක් නැති උන් අන්තිමට යන්නේ හෙවන දුන්නු**

*' යසෝද!*
*එහෙත් මට ඔබ අතැර යා නොහැක*
*විකුණුවෙමි වෙළෙඳුන්ට ආත්මය*
*ඔබ සිත පිනවනු පිණිස*
*විකුණුවෙමි වෙළෙඳුන්ට ආත්මය*
*ඔබ හා සමවනු පිණිස*
*එදා සිට අද තෙක්*
*නැත සිතට සැනසුමක්*
*මහා කලකිරීමක්*
*හිස්බවක්*
*පසුතැවිල්ලක් මිසක*
*මිදෙන්නට ඒ කලකිරීමෙන් පසුතැවිල්ලෙන්*
*මිතුරන් හා සුරා බොමි*
*රෑ මැදියම වනතුරු*
*සිහිසන් නැතිවන තුරු*
*සමාජ ශාලාවල දාදු කෙළිමි*
*උනන ධනය සිඳෙනාතුරු*
*එහෙත් සිතට සතුටක් නැත*
*සිහියෙන් සිටිනා විට*
*මුර ගා වැළපෙයි සිත*
*'නුඹ මෙයින් යා යුතුය.*
*එහෙත් මට ඔබ අතැර යා නො හැක'*

අනික තව දෙයක්... විවිධ කාලවල මුණගැහෙන සමහර ආගන්තුකයො අව්වට, වැස්සට අහුවෙලා පීඩා විඳිනකොට හෙවන දෙන්න හිතාගෙන ඒ මිනිස්සු බලෙන් ගෙනැල්ල අම්බලමට දාගන්නෙත් අපිමයි. හැබැයි ධාරාණිපාත වැහි වැටිලා, සුළි කුණාටු, සැඩ සුළං ඉවරවෙලා සියල්ල සාමකාමී වුණාට පස්සේ ඒ මිනිස්සුන්ට ආපහු සුපුරුදු වාසස්ථාන මතක් වෙලා අම්බලම අතහැරලා යනවා. සමහරවිට කෘතවේදී බව ඇතුව හෝ නැතුව. හැබැයි එහෙම වෙලාවටත් ඒක ඒ අයගේ විදිය කියලා හිතලා සැනසීමෙන් යන්න දෙනවා මිසක්, හිත් රිද්දගන්න හෝ බලෙන් රඳවාගන්න උත්සාහ කරන්න අවශ්‍ය නෑ.

මොකද පාරෙතොටේ ඉන්න සිවුපා සතෙක් rescue කරලා ගෙදර ගෙනාවට පස්සේ උං වලිගෙ වැනුවට දෙපා සත්තු rescue කළාම ඒ කෘතවේදී බව ඒ විදියටම ලැබෙයි කියලා හිතන්න නරකයි.

සූරා





නිදහසේ 75
දියමන්ති සැමරුමේ
ඉසුරුමත්
උදානය
Isuru Udana 25th Anniversary
ශ්‍රී ලාංකේය 75වෙනි නිදහස් සැමරුම සහ ඉසුරු උදාන ගිණුමේ 25වෙනි සංවත්සරයට සමගාමීව පෙබරවාරි 01 වෙනිදා සිට 14වෙනිදා දක්වා උපදින සෑම බිළිඳෙකුටම මහජන බැංකුවේ ඉසුරු උදාන ගිණුමෙන් රු. 2000/-ක් වටිනා තිළිණපතක්
මහජන බැංකුවේ තවත් එක් සමාජ මෙහෙවරකි.
*කොන්දේසි සහිතයි
මහජන බැංකුවේ පවතින සියලුම තැන්පතු, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ ක්‍රමය යටතේ ආවරණය කර ඇත.
www.peoplesbank.lk
1961 PEOPLE'S BANK CALL CENTRE
PEOPLE'S BANK
Pride of the Nation
A (lka) Fitch ශ්‍රේණිගත කිරීම AAA- සන්නාම මූල්‍ය ශ්‍රේණිගත කිරීම
මහජන බැංකුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අධීක්ෂණය කරනු ලබන බලපත්‍රලාභී වාණිජ බැංකුවකි.



# දෙයියෝ දුවපන් කිව්වම ‘ඇනමිති රාළ’ සරම කරේ තියාගෙන දුවනවා

නුවර කලාවිය නමින් හැඳින්වෙන අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගැමි සමාජ, සංස්කෘතික ලක්ෂණ පිළිබඳව මම නොයෙකුත් විමසුම් සිදුකොට ඇත්තෙමි. ඒ අනුරාධපුර රුවන්වැලි සෑ විහාරයේ හිටපු කැපකරුවකු වන ඩී.එම්. මුතු බණ්ඩා මහතා මා හට හඳුන්වා දුන් පාරම්පරික ගැමියන්ගෙන් අසා දැනගත් කරුණු පදනම් කරගනිමිනි. අනුරාධපුර කුරුන්දන්කුලමේ පදිංචිකරුවකු වන ඩී.එම්.සේතුහාමි මහතාගේ ළමාවිය ගතවී ඇත්තේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ මරදන්කඩවලට නුදුරු මානෑව නම් ඓතිහාසික ගම්මානයේය. තම මුත්තනුවන් එක්දහස් නවසිය ගණන්වල තමන් හා කී මානෑව ගමේ රස තොරතුරු රැසක් තවමත් මතකයේ පවතින බව 2016 වසරේ මට හමුවූ සේතුහාමි මහතා කීය. එවිට ඔහුගේ වයස අවුරුදු අසූහයකි.

දහනව වන සියවසේ ඉංග්‍රීසි ජාතිකයන් විසින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ පාට පාට බෙහෙත් වතුර බෙදන ඉංග්‍රීසි බෙහෙත්ශාලා හෙවත් ඩිස්පැන්සරි ක්‍රමය (ඔවුන් එවක එය හඳුන්වා ඇත්තේ ‘දිස්පැන්සලේ’ යන අමුතුම නමකිනි.) අරඹනතෙක් එහි වැසියන්හට පිහිට වූ ‘රාළලා පස්දෙනෙකු’ පිළිබඳ අපූරු තොරතුරක් සේතුහාමි මහතා මා හමුවේ විස්තර කළේය.

“ඒ කාලේ අපේ ගම්වල ගම්මුන්ගේ දුක් කරදරවලට පිහිටවෙන රාළලා පස්දෙනෙක් ඉඳලා තියෙනවා. මුල්ම කෙනා වෙද රාළ, ඊළඟට නැකත් රාළ, ඊළඟට කපු රාළ, ඊළඟට තමයි ඉඳලා තියෙන්නේ යද්දෙහි රාළ; ඒ කියන්නේ යක්දෙස්සා, නැත්තම් කට්ටඩියා. අන්තිමට තමයි ඇනමිති රාළ කියන අමුතුම චරිතය ඉඳලා තියෙන්නේ. හැබැයි මම අහලා තියෙන විදියට ඔය ඇනමිති රාළලා ඉඳලා තියෙන්නේ මේ නුවර කලාවියෙයි, හත්කෝරළෙයි විතරයි. මොකක්හරි දේකට දෙවියන්ගෙන් අනුමැතිය ලබාදෙන හින්ද ‘අනුමැති රාළ’ කියලා හඳුන්වපු මේ ඇනමිති රාළ සමහර පළාත්වල වෙද ගුරුන්නාන්සේ, දෙයියා කිරි අත්තා වගේ නම්වලිනුත් හැඳින්විලා තියෙනවා.” සේතුහාමි මහතා කීය.

ඔහු වැඩිදුරටත් මා හා විස්තර කළ අන්දමට එවන් පැරණි ගමක කිසියම් කෙනෙකුට අසනීපයක් වූ පසු ගමේ වෙද රාළ හමුවුවද ඒ සඳහා වන මූලික ප්‍රතිකාර කරන වෙද රාළ ඉන් රෝගය සුව නොවීම මත දෙවනුව ගනු ලබන තීන්දු තීරණ කිහිපයක් විය. කසාය වට්ටෝරු

> **ඇනමිති රාළ එකදිගට දෙවියන්ට යාතිකා කර කර ඉඳලා එකපාරටම දියෙන් ගොඩදමපු කාවයියෙක් වගේ ගැහෙන්න පටන්ගන්නවා**

කිහිපයකින් එම රෝගයට නිසි සුවයක් නොලදහොත් එම රෝගියාගේ ග්‍රහචාරය පරීක්ෂා කරනු පිණිස ඔහු ගමේ නැකත් රාළ වෙත යොමු කිරීම ඉන් පළමු පියවරය. යම්හෙයකින් එම රෝගියාගේ ජන්ම පත්‍රයේ යම් ග්‍රහදෝෂ සහගත බවක් පැවතියහොත් වෛද්‍ය ප්‍රතිකාර කරන අතරේ එම ග්‍රහදෝෂ භංග කෙරෙන යම් යම් පුද පිළිවෙත්ද කරනු ලැබේ. ඒ නමුදු එසේ වෛද්‍ය ප්‍රතිකාර කරන රෝගියා සම්බන්ධ ග්‍රහ අපලමය තත්ත්වයක් නොමැතිවද රෝගයට නිසි සුවයක් ලැබෙන බවක් නොපෙනේ නම් ඊළඟට වෙද රාළ විසින්ම රෝගියා කපු රාළ වෙතටත්, ඉනික්බිතිව යද්දෙහි රාළ වෙතටත් යොමුකොට දේවශාන්තිකර්ම සහ යක් තොවිල් මගින් වෙනයම් ගුණදෝෂ නිවාරණය කිරීමට ඇති හැකියාව විමසා බලනු ලැබේ.

මිනිසුන් ග්‍රහ අපල, යක්ෂ, දේව බලපෑම් මත රෝගී වන බවක් සේම ඒ ඒ අංශ වෙත පුද පිළිවෙත් සිදුකිරීමෙන් ඒ රෝග පීඩා සුවකළ හැකි බවක් පිළිගැනීම විද්‍යාවට හා යථාර්ථයට එරෙහි වූවකි.

එහෙත්, ඒ සම්බන්ධයෙන් සියුම් ලෙස විමසීමේදී පෙනී යනුයේ එම ගුප්තමය කටයුතු තුළ කිනම් හෝ නොවිධිමත් මනෝ චිකිත්සක අංග ගැබ්ව ඇති බවකි. එය වඩාත් තහවුරු වන්නේ සේතුහාමි මහතා ඊළඟට හෙළිකළ ඇනමිති රාළගේ කාර්යභාර්ය පිළිබඳව සියුම් ලෙස විමසා බැලීමෙනි.

“හුඟක් වෙලාවට ලෙඩෙක් ඇනමිති රාළ ළඟට ගේන්නේ මැස්සක් වගේ දේක දමාගෙන. මොකද ඒ වෙනකොට ලෙඩාගේ තත්ත්වය ඒ තරමටම නරක අතට හැරිලා. ඔය හැම ඇනමිති රාළ කෙනෙකුගේම ගේ ඉස්සරහා තියෙනවා පහන්පැලක්. ඒ පහන්පැල ඇතුළේ ‘සලඹක්’ වගේ පූජා වස්තුවකුත් තියෙනවා. ඉතින් මැස්සක දාගෙන තමන් ළඟට ගෙනාපු ලෙඩාව ඒ පහන්පැල ඉස්සරහා තියාගත්තු ඇනමිති රාළ එකදිගට දෙවියන්ට යාතිකා කර කර ඉඳලා එකපාරටම දියෙන් ගොඩදමපු කාවයියෙක් වගේ ගැහෙන්න පටන්ගන්නවා. ඊටපස්සේ පහන්පැලේ තිබුණු අර සලඹත් අතට අරගෙන ඒ ලෙඩේ ගැන දෙවියෝ කියන දේ එක හුස්මට කියාගෙන කියාගෙන යනවා. කොහොමත් ඔය වගේ සිද්ධියක් වෙනකොට ඒක බලන්න ගමෙන් බාගයක් විතර ඒ ඇනමිති රාළගේ පහන්පැල වටේ එකතු වෙනවාමයි.” සේතුහාමි මහතා කීය.

ඉන්පසු ඔහු කීයේ එසේ දේවාරූඪයට පත්වන ඇනමිති රාළ ඇතැම්විට ඒ සලඹ සොලවමින් හිස හැරුණු අතේ දුවන්නට පටන්ගන්නා බවකි. එවිට ඔහු අවට සිටින්නවුන්ද ඇනමිති රාළ පිටුපසින් දිව යා යුතු බවද සේතුහාමි මහතා කීය.


“ඔහොම ඔලුව හැරුණු අතේ දුවගෙන යන ඇනමිති රාළ සමහර වෙලාවට ආපහු එන්නේ මොකක්හරි ගහක කොළම්ටක් අරගෙන. පස්සේ ඒ කොළම්ට රෝගියාගේ නෑදෑයන්ගේ අතට දෙන ඇනමිති රාළ ඒ කොළ ජාතිය බේත් හැටියට ඒ ලෙඩාට දෙන හැටි ආරූඪයෙන්ම කියනවා. ඒත් ඊටපස්සේ මල්පැල ළඟට ගිහින් තවත් කන්නලව්වක් කරපු හැටියේ ඇනමිති රාළගේ ආරූඪය එතැනින්ම ඉවරයි.” කී සේතුහාමි මහතා කීයේ අතීතයේ ගමේ රෝගියකු සඳහා දිය හැකි අවසාන ප්‍රතිකාරය ඇනමිති රාළගේ එම ශාකසාර ඖෂධ ප්‍රතිකාරය බවය.

ඒ සමඟම ඔහු පවසා සිටියේ එම ඖෂධයෙන් සම්පූර්ණ සුවය ලැබීම කෙසේ වෙතත් ඇතැම් රෝගීන් මරණයට පෙර යම් සුවපත් බවක් පළ කළ වගකි.

නමුදු මෙහි ඇත්තේ ඒ පරිසර පද්ධතියෙන් ලබාගත් කිසියම් ශාකයක ඇති ඖෂධීය ගුණයකින් එම රෝගය යටපත් වීමක් නොවේ. දේවාරූඪය ලෙසින් ඇනමිති රාළ ගොඩ නංවාගන්නා මානසික සමාරෝපණය මතින් එම රෝගියාගේත් ඔහුගේ ඥාතීන්ගේත් මානසික ව්‍යුහයන්හි යම් වෙනසක් ඇතිවීම සිදුවේ. මෙම මානසික සමාරෝපණය (Impersonation) යනු ඇතැම් පුද්ගලයන්ගේ පෞරුෂය හා කුසලතාවය මත ගොඩනගාගත හැකි තත්ත්වයකි. එහිදී එය දේවාරූඪයක් වශයෙන් සලකන රෝගියාට ඇනමිති රාළ ගෙන එන කොළම්ට දිව්‍යමය ඖෂධයක් සේ හැඟී යාම මත ඉන් ඔහුගේ රෝගයේ යම් සුවදායක තත්ත්වයක් පෙන්නුම් කිරීම සාමාන්‍ය වූවකි. මෙම තත්ත්වය විද්‍යාත්මකව හඳුන්වනුයේ තුෂ්ටක බලපෑම (Placebo Effect) යනුවෙනි.



මාධ්‍යවේදී
**තිලක් සේනාසිංහ**



# කසිප්පුවාට බෙහෙත් කරන්න මට උගේ කරේ නගින්නත් වුණා



තොරතුරු
පශු වෛද්‍ය
**තරිඳු විජේකෝන්**
(ශ්‍රී දළදා මාලිගාව, Millennium Elephant Foundation සහ Vetcare සත්ව රෝහල)

පශු වෛද්‍යවරුන්ට වැඩි වශයෙන් රාජකාරි කිරීමට සිදුවන්නේ බල්ලන්, බළලුන් සහ හරක් වැනි සතුන් සමඟය. සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට සම්බන්ධ වන පශු වෛද්‍යවරුන්ට නම් ඊට වෙනස් අත්දැකීම් ලැබීමට ඉඩ හිමි වේ. පශු වෛද්‍ය තරිඳු විජේකෝන් විශ්වවිද්‍යාල අධ්‍යාපනය හැදෑරූ ආරම්භක අවදියේ සුරතල් සුනඛයන්ට ප්‍රතිකාර කිරීමට යොමුව සිටියේය. උදේ 7 ට පටන්ගන්නා රාජකාරි හමාර කරද්දී රාත්‍රී 7 පමණ වේ. එබැවින් සුනඛ රෝහලින් පිටත රාජකාරියක යෙදීම ඔවුන්ගේ බලාපොරොත්තුවයි. ඒ සඳහා හොඳම ඉඩ ලැබෙන්නේ අලියෙකුට ප්‍රතිකාර කිරීමේදී හෝ පෙරහර රාජකාරි කරන වෛද්‍යවරයාගේ ගෝලයා තනතුර ලැබීමෙනි. හිතේ හැටියට රවුමක් ගසා, කඩ කෑම රස විඳීමටත් එවිට ඉඩ ලැබේ.

එකල සායනික අංශ ප්‍රධානී වූ මහාචාර්ය අශෝක දංගොල්ල දිනක් ශිෂ්‍ය තරිඳු විජේකෝන්ට දැනුම් දුන්නේ සේලයින්, විටමින් ආදී බේත්හේත් සූදානම් කරගන්නා ලෙසයි. එවකට මේ දෙපළ අතර එතරම් ඇයිහොඳයියක්ද නොවීය. එබැවින් ගුරාගේ උපදෙස් පරිදි ශිෂ්‍යයා අවශ්‍ය දේ සූදානම් කළේ වැඩි තැකීමක් නැතිවය. දෙදෙනාම මහාචාර්ය දංගොල්ලගේ පෞද්ගලික මෝටර් රථයට ගොඩවූහ. ගමනාන්තය ශ්‍රී දළදා මාලිගාවයි. ඒ වනවිට ඇසළ පෙරහර ආරම්භව තිබිණ. මහාචාර්ය දංගොල්ල අලි ඇතුන් සැම කෙරෙහි අවධානය යොමු කළේය. ගමන අතරතුර මහාචාර්යවරයා අලි සම්බන්ධ යම් යම් දේ ගැනද පැවසීය.

"පිරිමි අලියෙක් ඉන්නවා. හැමෝම ඒ සතාට කියන්නෙ කසිප්පුවා කියලා. එයා තරුණ කාලේ හරිම දරුණුයි. ඕන වැඩක් කරන්නත් පුළුවන්කම තිබුණා. කාලයක් මෙයාව බලාගන්න කිසිම ඇත්ගොව්වෙක් ඉදිරිපත් වුණේ නෑ. එතකොට මාස ගාණක් එක තැන තියාගෙන සාත්තු කරන්න වුණා."

ඒ වෙද්දී අලියෙකු අතපත ගෑමට හෝ අවස්ථාවක් නොලබා සිටි පශු වෛද්‍ය තරිඳුට මෙය ත්‍රාසජනක කතාවකට සවන් දෙන්නාක් මෙනි. එහෙත් සැබෑවටම ඔහුට ත්‍රාසය දැනුණේ මේ ගමන කසිප්පුවාට බෙහෙත් කිරීමට යැයි මහාචාර්ය දංගොල්ල දැනුම්දීමෙන් පසුවය. මාරාන්තික ගමනකට සහභාගි වන නියාවෙන් හෙතෙම මහාචාර්යවරයා සමඟ දළදා මාලිගාවට ළඟා විය. පසුව බේත් පෙට්ටියද රැගෙන සිය ගුරුවරයා පසුපස ගමන්ගත්තේ වෙනත් විකල්පයක් නොවූ බැවිනි.

දළදා මාලිගාවේ විෂ්ණු දේවාල පරිශ්‍රයේ පිටත ගේට්ටුව අසළ ඉතා උස දැවැන්තයකු අපහසුතාවකින් සිටින අයුරු පෙනේ. ඒ දුටු වහාම පශු වෛද්‍ය තරිඳුට සිය ආචාර්යවරයාගේ දේශනයක් සිහියට නැගිණ. අලියෙකු අසනීප වූ විට වැඩියෙන් කේන්ති ගන්නා බවට ඔහු කළ ප්‍රකාශය මතක් වීමෙන් හෙතෙම වඩාත් බිය විය.

"සර්, බෙහෙත් විදින්න අලියව නිදි කරවන්නද?"

හස්තිපාලකවරයා ඇසීය. එවිට වෙදුන් ආරක්ෂිතය. මක්නිසාදයත්, අවට සිටින්නකුට පහරදීමට සිත් වුවහොත් නැගී සිටීමට අලියාට සැලකිය යුතු කාලයක් ගතවන බැවිනි. එහෙත් මහාචාර්ය දංගොල්ල හස්තිපාලකවරයාගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළේය. නිදි කළහොත් අලියාට නැවත නැගී සිටීම අපහසු බව ඔහුගේ ස්ථාවරය විය.

"නිදි කරවන එක හොඳයි නේද සර්?"

හොඳටම බියව සිටි ගෝලයා ගුරුතුමාගෙන් විමසීය. ඊට ප්‍රතිචාරය රවා බැලීමක් පමණි.

"අර කණ්ඩියට නැගලා සේලයින් දෙමු."

මහාචාර්ය දංගොල්ල පැවසීය. සාමාන්‍යයෙන් අලින්ට සේලයින් ලබාදෙනුයේ කනේ රුධිර නාලයකිනි. අලි කෙරෙහි බියෙන් පසුවූ ගෝලයා හිත හදාගත්තේ, "කණ්ඩියට බැරිනං කොහෙ නැග්ගත් ඒ සර් නේ" යනුවෙන් සිතීමෙනි.

එසේ සිතමින් සිටියදී තවත් ගැටලුවකි. කණ්ඩියේත් අලියාගේත් උස එක හා සමානය. සේලයින් බෝතලය ඊට වැඩි උසකින් එල්ලිය යුතුය. පීඩන වෙනස අනුව අලියාට සේලයින් ශරීරගත වන්නේ එවිටය. මහාචාර්ය දංගොල්ල විසඳුම ප්‍රකාශයට පත් කළේය.

"පොඩි දෙස්තර මහත්තයා අලියා පිටේ නග්ගලා සේලයින් බෝතලේ අල්ලන් ඉන්න කියමු. මම එතකොට කනට සේලයින් බටේ ගහන්නං."

පශු වෛද්‍ය තරිඳු අවට බැලීය. පැමිණියේ තමා සහ ගුරුතුමා පමණි. වෙනත් පොඩි දෙස්තරයෙකු නැත. මේ කියන්නේ තමා ගැනමය. අලි මදිවාට හරක් කිව්වාක් මෙන් කරදර පිට කරදරය.

වවුලාගේ මඟුලට ගියානං එල්ලී සිටිය යුතුය. ඒ අනුව අණ කිරීමට අනුව අලියා එසවූ කකුලට ගොඩවී, කනේ එල්ලී අමාරුවෙන් පශු වෛද්‍ය තරිඳු ජීවිතයේ පළමු වරට අලියෙකු පිට නැංගේය. අලියාගේ පැද්දීමට අනුව පැද්දෙමින් පොල් ගස්වල කරටි මට්ටමේ සිට හෙතෙම රෝගියාගේ සේලයින් බෝතලය ඔසවා සිටියේය. මෙම අලියා ඇත්ගොව්වාගේ බිරියට පවා ඉතා කීකරු බව පශු වෛද්‍ය තරිඳු දැනගත්තේ රාජකාරිය හමාර කිරීමෙන් පසුවය.

**රජනිකා ලියනගේ**



ඔබට මුදල් හදිස්සියක්ද?
නැත්නම් ඔබේ වටිනා
රන් භාණ්ඩ
සින්න වෙන්න
යනවාද?

F.A.Ads

ඕනෑම බැංකුවක උකස් තබා ඇති රන් භාණ්ඩ ගණුදෙනුවක් සඳහා
පවුමට රු. 43,000/- ක් ම වැඩිපුර
1% ක අඩුම පොලියට ලබා ගන්න
ඔබ දැනට උකස්තබා ඇති රිසිට් පත අපට 0767 888 222 අංකයට WhatsApp කරන්න
විශේෂ සහන රැසක් සමගින්
නැවත බේරා ගැනීමේදී පහසු ගෙවීමේ ක්‍රමයට Loan එකකුත්

*කොන්දේසි අදාළවේ

| | | | |
|---|---|---|---|
| කොළඹ | 0771 408 547 | මීගමුව | 0766 227 056 |
| කොටහේන | 0702 539 382 | ගම්පහ | 0779 230 549 |
| වැල්ලවත්ත | 0710 870 686 | කළුතර | 0776 167 149 |
| ග්‍රෑන්ඩ්පාස් | 0742 379 739 | හලාවත | 0779 256 191 |
| මොරටුව | 0766 227 059 | මාතර | 0705 979 237 |
| පානදුර | 0767 952 286 | ගම්පොල | 0710 870 735 |
| වෙන්නප්පුව | 0710 869 378 | නාවලපිටිය | 0710 870 706 |
| ගාල්ල | 0705 979 274 | හැටන් | 0778 790 372 |
| කුරුණෑගල | 0766 227 061 | කෑගල්ල | 0703 583 363 |
| දිගන | 0778 156 738 | ත්‍රිකුණාමලය | 0771 201 854 |
| බේරුවල | 0740 920 356 | පුත්තලම | 0771 201 861 |
| මතුගම | 0771 201 860 | මහියංගනය | 0771 201 862 |
| මොණරාගල | 0771 201 852 | වත්තේගම | 0742 551 103 |
| බදුල්ල | 0771 201 863 | හපුතලේ | 0760 677 018 |
| කල්පිටිය | 0761 605 803 | මාතලේ | 0702 539 389 |
| කටුගස්තොට | 0779 476 206 | තලවකැලේ | 0710 871 009 |
| නාඋල | 0763 226 230 | රාගල | 0710 870 703 |
| කන්තලේ | 0742 572 585 | පූඩළුඔය | 0740 929 541 |
| පොතුවිල් | 0771 201 855 | මස්කෙලිය | 0760 909 822 |
| වැලිමඩ | 0778 764 751 | පුස්සැල්ලාව | 0742 531 360 |
| බගවන්තලාව | 0742 588 267 | අච්චුවේලි | 0743 865 368 |
| ආගරපතන | 0742 499 563 | මට්ටක්කුලිය | 0742 127 665 |
| ඇලකන්ද | 0771 201 857 | | |
| හාවඑළිය | 0773 394 209 | | |


# වමනය සාම්පලයක් ඔස්සේ ගොස් මහාධිකරණ විනිසුරු සරත් අඹේපිටියගේ ඝාතකයින් සොයාගනියි

## විත්තිකරුවකු වරදකරුවකු කිරී... ඩී.එන්.ඒ. තාක්ෂණය මෙරටදී භාවි... ප්‍රථම අවස්ථාව මෙයයි



**ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න යනු විද්‍යාත්මකව සහ කලාත්මකව පැමිණිලි මෙහෙයවීමට නම් දරා ඇති විශිෂ්ටයෙකි. කොබෙයිගනේ රූප සුන්දරී ඝාතනය, ටෝනි මාටින් ඝාතනය, මහාධිකරණ විනිසුරු සරත් අඹේපිටිය ඝාතනය සහ හෝකන්දර සය පුද්ගල ඝාතනය ආදී ආන්දෝලනාත්මක නඩු රැසක පැමිණිලි මෙහෙයවීමට ඔහු දායක වී ඇත. සිය අත්දැකීම් නිර්මාණශීලීව යොදාගනිමින් නීතියද පැහැදිලි කරමින් ඔහු විසින් රචිත 'යළි මැවෙන අපරාධයක්' කෘතියේ සංස්කරණය කළ දෙවන මුද්‍රණයද පසුගියදා ජනගත කෙරිණ. ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න නීතිපති දෙපාර්තමේන්තුවෙන් පසුගිය වසරේදී සමුගත්තේ ජ්‍යේෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්වරයකු ලෙස කටයුතු කරමින් සිටියදීය.**

**මේ, ඔහුගේ අත්දැකීම් අලලා ලියැවෙන ලිපි මාලාවේ තුන්වැන්නයි.**



මහාධිකරණ විනිසුරු සරත් අඹේපිටිය ඍජු තීරණ ගන්නා අභීත අයෙකු ලෙස ප්‍රකටය. හෙතෙම මෙරට සුප්‍රසිද්ධ නඩු ගණනාවක් විභාග කළ විනිසුරුවරයෙකි. මහබැංකු බෝම්බ නඩුව විභාග කර, එල්.ටී.ටී.ඊ. නායකයා ඇතුළු සැකකරුවන් වරදකරුවන් කළේ ඔහුය. එමෙන්ම මිරුසුවිල් සමූහ ඝාතන නඩුව විභාග කෙරෙමින් තිබුණේද අඹේපිටිය විනිසුරුතුමන් යටතේය. එවැනි ආන්දෝලනාත්මක නඩු කටයුතු ගණනාවකට ඔහු සම්බන්ධ වී ඇත.

2004 වර්ෂයේ නොවැම්බර් මස විසිවනදා මහාධිකරණ විනිසුරු සරත් අඹේපිටිය තවත් වැදගත් නඩු තීන්දුවක් ලබා දුන්නේය. මාස ගණනාවක් පුරා විභාග කෙරුණු මත්ද්‍රව්‍ය ජාවාරමකට අදාළ නඩුවක සැකකාරිය, වරදකාරිය කර දඬුවම් නියම කෙරුණේ එදිනයි. තීන්දුව දීමෙන් අනතුරුව සිය නිල මැදිරිය වෙත පැමිණි විනිසුරුවරයා එහි පැය දෙක තුනක කාලයක් ගත කළේය. අනතුරුව නිවස වෙත යාමට පිටත් වූයේ සිය දෙළොස් හැවිරිදි පුතණුවන් ටෙනිස් පුහුණුවට රැගෙන යාමට නියමිතව තිබූ බැවිනි. ඔහු පදිංචිව සිටියේ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවට යාබද සරණ පාරේ වරාය අධිකාරියට අයත් නිල බංගලාවකය. එය තට්ටු දෙකකින් සමන්විතය. එහි ඉහළ මාලයේ සිටි බිරිය සහ පුතා විනිසුරුතුමන්ගේ පැමිණීම අපේක්ෂාවෙන් පසුවූහ. උපපොලිස් පරීක්ෂක උපාලි විසින් පදවනු ලැබූ නිල රථය විනිසුරු නිල නිවසට ළඟා විය. ඒ වනවිට ගරාජයේ ගේට්ටුව විවරව තිබිණ. වාහනයේ මුහුණත ගරාජයේ ඇතුල් පැත්තට වන සේ නැවතූ රියදුරු වාහනයෙන් බැස්සේය. පසුව ඔහු වාහනයේ ඩිකිය වෙත පැමිණියේ එහි තිබූ බඩු බාහිරාදිය ගැනීමටයි. පිටුපස ආසනයේ පැමිණි විනිසුරුතුමන් බිමට බැස නැවත වාහනයේ පසුපස අසුනට නැමුණේ සිය ලිපිලේඛන ගැනීමේ අපේක්ෂාවෙනි. ඒ අවස්ථාවේදීම එම ස්ථානයට වෑන් රථයක් ළඟාවිය. ඉන් බිමට බැසගත් ආයුධ සන්නද්ධ සිව්දෙනකු විනිසුරුතුමන්ට සහ ඔහුගේ රියැදුරුට වෙඩි ප්‍රහාර එල්ල කළේ කිසිවක් හිතාගැනීමට හෝ ඉඩක් ඉතිරි නොකරමිනි. විනිසුරුගේ රියැදුරු සහ ආරක්ෂක වූ උපපොලිස් පරීක්ෂකවරයාට සිය ඉනේ රඳවා තිබූ පිස්තෝලය ගැනීමට තරම්වත් කාලයක් නොවීය. වෙඩි ප්‍රහාරයට ගොදුරු වූ දෙදෙනා එසැනින් බිම ඇද වැටුණාහ. රෝහලට රැගෙන යනවිටද ඔවුන් ජීවිත හැර ගොසිනි.

වෙඩි ප්‍රහාරයෙන් අනතුරු වෑන් රථයට ගොඩවන තුවක්කුකරුවෝ රියැදුරාට පරුෂ වචනයෙන් බැන වැදී ඔහු පිටතට ඇද දැමූහ. දැඩි සේ බියට පත්වන රියැදුරා එම ස්ථානයෙන් දුවගොස් අසළ වූ නිවසකින් පොලිසියට ඇමතුමක් ලබාදුන්නේය. ඔහු කුලියට වාහන සපයන ආයතනයක සේවකයෙකි. හෙතෙම සිය රැකියා ස්ථානයටද දුරකතනයෙන් ඇමතීය. මෙම සිදුවීම ඇසින් දුටු එකම සාක්ෂිකරුවා ඔහුය. විනිසුරුවරයාගේ බිරිය සහ පුතා වෙඩි හඬ ශ්‍රවණය කළද ඔවුන් සිදුවීම දුටුවේ නැත.

**"මම වැඩ කරන්නෙ නාවල ප්‍රදේශයේ තියෙන රථවාහන කුලියට දෙන තැනක රියදුරෙක් විදියට. මේ වෑන් රථය අයිතිත් එතැනට. එදා දවල් 12ට විතර මම වෑන් එක අරන් රාජගිරිය පැත්තෙන් යද්දි කාර්යාලයෙන් පණිවිඩයක් ලැබුණා, මොරටුවට යන කට්ටියක් මරදාන එල්ෆින්ස්ටන් ශාලාව අසළ ඉන්නවා කියලා. මම එතැනට ගියා. වෑන් එකේ බඳේ ආයතනයේ අංකය ගහලා තිබුණා. හයර් එක දාපු අය ඒක දැකලා අත දමලා වෑන් එක නැවැත්තුවා. එතැන හතරදෙනෙක් හිටියා. එයාලා අතේ මලු තිබුණා."**

සිදුවීම ගැන ඔහු පවසන කතාව අනුව වාහනයට ගොඩ වූ ගනුදෙනුකරුවන් පවසා තිබුණේ ඔවුන්ට නාට්‍යයක් රූගත කිරීම සඳහා මොරටුවට යා යුතු බවයි. අධ්‍යක්ෂවරයා ප්‍රමාද වන ලකුණු ඇති බවද ඔවුහු පැවසූහ. අනතුරුව ජෝන් ද සිල්වා රඟහල අසළ යම් වේලාවක් රථය නවතා තබාගත් පිරිස පසුව ග්‍රෙගරි පාර අසළ වූ සුප්‍රසිද්ධ අවන්හලකට ගොස් දිවා ආහාරය ගත්හ. රියදුරුද ඔවුන් සමඟිනි. ඔවුන් ෆ්‍රයිඩ් රයිස් ඇණවුම් කළ අතර රියැදුරු හැර සෙසු සියල්ලෝ මත්පැන් පානය කළහ. අනතුරුව යළි වාහනයට ගොඩවෙන කණ්ඩායම බොරැල්ල කනත්ත අසළට ගොස් කාසල් වීදිය ඔස්සේ ගමන් ගත්හ. ඒ මාර්ගයේ තියෙන මත්පැන් අලෙවිසැලකින් තවත් මත්පැන් බෝතලයක්ද මිලදී ගෙන තිබේ. පසුව ඩී.එස්.සේනානායක විදුහල ඉදිරිපිටින් ගොස් සරණ පාරේ සමාජ ශාලාවක් අසළ පදික වේදිකාවේ වාහනය නවතා තැබීමට රියැදුරාට අණ ලැබිණ. ටික වෙලාවකට පසු එම මාවතේ මදක් ඉදිරියට ගමන් කිරීමෙන් පසු යම් ස්ථානයකදී වාහනය නවතන ලෙස රියැදුරාට නියෝග කෙරිණ. ඒ, සරත් අඹේපිටිය මහාධිකරණ විනිසුරුවරයාගේ නිලනිවස අසළයි. ඔවුන් එම ස්ථානයට පැමිණෙන විට මහාධිකරණ විනිසුරුවරයාගේ රථය ගරාජයේ නවතා තිබිණ. අනතුරුව වෙඩි තැබීම සිදුවූ අතර රියැදුරා පන්නා දමා තිබේ.

රියැදුරාගේ ප්‍රකාශයේ සත්‍යතාව සැක සහිතය. අපරාධකරුවන් තමන් සමඟ පැමිණි ඇසු දුටු සාක්ෂිකරු දමා යන්නේ ඇයි? ඔහුත් අපරාධයට සම්බන්ධද? කලබලය හේතුවෙන් වාහනයට ගොඩවීමට නොහැකි වීද? ආදී ප්‍රශ්න ගණනාවක් විමර්ශකයින් ඉදිරියේ විය. රියැදුරු වාහනයේ පැමිණි සිව්දෙනාගෙන් කිසිවකු පුද්ගලිකව හඳුනන්නේද නැත. ඔහු පවසන පරිදි පළමුවරට ඔවුන් දැක ඇත්තේද එදිනමය.


මහාධිකරණ විනිසුරුවරයා ඝාතනය කිරීමේ අවශ්‍යතාව තිබුණේ කාහටද යන්න විමර්ශකයින්ට මතු වූ අනෙක් ගැටලුවයි. විමර්ශනය ආරම්භ කළ යුත්තේ එතැනිනි. ඒ අනුව සැකසහිත සියලු කරුණු අධ්‍යයනය කෙරිණ. එහිදී අර්බුදය වඩා සංකීර්ණ විය. වෙඩි තැබීම වූ දිනයේ තීන්දු වූ නඩුවේ වරදකාරිය ආසන්නතම පෙළඹවීම සහිත සැකකාරියයි. මහබැංකු බෝම්බ ප්‍රහාර නඩුව විභාග කර එල්.ටී.ටී.ඊ. නායකයා ඇතුළු පිරිස වරදකරුවන් කළේද සරත් අඹේපිටිය මහාධිකරණ විනිසුරුවරයායි. එබැවින් මෙම ඝාතනයේ සැකය එල්.ටී.ටී.ඊ.ය වෙතටද යොමුවිය. එම කාලයේදීම ත්‍රිපුද්ගල මහාධිකරණ විනිසුරු මඬුල්ලක් ඉදිරියේ මිරුසුවිල් සමූහ ඝාතන නඩුව විභාග වෙමින් පැවතිණ. සරත් අඹේපිටිය එම විනිසුරු මඬුල්ලේ සභාපති ධුරය දැරීය. යුද හමුදා සාමාජිකයකු එහි විත්තිකරුවකු වීමද සැකයට බඳුන් වූ කරුණකි. ඊට අමතරව නවුෆර් නමැත්තෙකුට එරෙහිව තවත් ආන්දෝලනාත්මක මිනීමැරුම් නඩුවක් මහාධිකරණ විනිසුරු සරත් අඹේපිටිය ඉදිරියේ විභාග වෙමින් තිබිණ.

ඊට අදාළව ඇසු දුටු සාක්ෂිකරුවන් දෙදෙනෙකු සාක්ෂි දීමට නියමිත විය. මහේස්ත්‍රාත් අධිකරණයේ මූලික නඩු විභාගයේදී ඔවුන් දෙදෙනාම සාක්ෂි දී තිබිණ. පසුව ඉන් අයෙකු ඝාතනයට ලක් වූ අතර අනෙකා රටින් පිටමං වී තිබුණි. එබැවින් සාක්ෂි ආඥා පනතේ ප්‍රතිපාදන යටතේ ඔවුන් පහළ උසාවියේ දුන් සාක්ෂි මහාධිකරණයට අනුගත කරන්නැයි රජයේ අධිනීතීඥවරිය ඉල්ලීමක් කළාය. එහෙත් ඉන් සිය සේවාදායකයාට අගතියක් වන බව පවසා ඊට ඉඩ නොදෙන්නැයි විත්තියේ නීතීඥවරයා ඉල්ලීය. එනිසා විත්තිකරු බොහෝ සේ බියට පත්ව සිටියේය. ඒ පිළිබඳ නියෝගය ලබාදීම විනිසුරුවරයා සති දෙකකට කල් තැබීය. මෙම ඝාතනය වූයේ නියෝගය ලබාදීමට පෙරයි. එයද ප්‍රබල සාධකයකි. මේ සියලු දැවැන්ත සාධක හමුවේ නිරීක්ෂකයන් පැටලුණේ පහසුවෙන් ලිහාගත නොහැකි පඹගාලකය. එබැවින් මේ සංකීර්ණ තත්ත්වය විසඳගත යුත්තේ එකම ඇසු දුටු සාක්ෂිකරු හඹායාමෙනි. ඒ අනුව කොළඹ අපරාධ විමර්ශන කොට්ඨාසය නැවතත් ඔහුගෙන් දීර්ඝ ලෙස ප්‍රශ්න කළේය. වත්මන් ජ්‍යේෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයකු වන නුවන් වෙදසිංහ එහි ප්‍රධාන විමර්ශක ලෙස කටයුතු කළේය.




මහාධිකරණ විනිසුරු සරත් අඹේපිටිය

පොට්ට නවුෆර්



නැවත ප්‍රශ්න කිරීමේදී රියැදුරා වැඩිදුරටත් තොරතුරු ලබා දුන්නේය.

"අපි අවන්හලකින් කෑම අරන් සරණ පාරේ වෑන් එක නවත්තගෙන හිටියා. එහෙම ඉන්නකොට එක්කෙනෙකුට වමනෙ ගියා. එයා වමනෙ දැම්මෙ වාහනෙන් බිමට බැහැලා පේමන්ට් එකට." පරීක්ෂණ සඳහා වමනය සාම්පලයක් ලබා ගැනීමට ඒ අනුව විමර්ශකයෝ ක්‍රියා කළහ. මෙම සිදුවීමට වසර කිහිපයක පෙර හෝකන්දර ඝාතන නඩුවේදී ඩී.එන්.ඒ. තාක්ෂණය භාවිත කර තිබීමේ අත්දැකීම්ද ඊට පදනම් විය. ඒ කෙසේ වුවද තවමත් කිසිඳු සැකකරුවකු ගැන හෝඩුවාවක් නැත. තවත් වැදගත් තොරතුරක් රියැදුරු විසින් හෙළිකරනු ලැබුවේ ඒ අතරයි. ජෝන් ද සිල්වා රඟහල අසළ සිටියදී වාහනයේ සිටි අයට දුරකතන ඇමතුම් ලැබුණු බව ඔහු පැවසීය. එහෙත් කතා කළ කිසිවක් ඔහුට ඇසී නැත. ඒ, ඇමතුමක් ලැබෙන සෑම අවස්ථාවකම ඔවුන් වාහනයෙන් පිටතට යාම හේතුවෙනි. සරණ පාරේ නවතා සිටියදීද එයම සිදුව ඇත. මෙවැනි සංකීර්ණ අවස්ථාවලදී විමර්ශකයින්ට නීතිපති උපදෙස් ලැබිය හැකිය. ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න ඒ සඳහා පත්කර තිබිණ. රියැදුරු පැවසූ කරුණු අනුව පෙනී ගියේ කිසියම් තැනැත්තකු ඝාතනයට ලක්වූ මහාධිකරණ විනිසුරුවරයා අධීක්ෂණය කර ඇති බවයි. ඔවුන් අවස්ථා කිහිපයකදී වාහනය නවතා බලා සිටින්නට ඇත්තේ කිසියම් පණිවිඩයක් ලැබෙන තුරු විය හැකිය. ඒ ප්‍රබල සැකය මතුවුවද, දුරකතන තාක්ෂණය භාවිත කිරීම ගැන මෙරටේ පූර්වාදර්ශ නොවූ බැවින් කිසිවකුටත් ඉදිරිය ගැන පැහැදිලි තත්ත්වයක් නොතිබිණ. ඒ අනුව ඉතිහාසයේ තවත් සුවිසල් සන්ධිස්ථානයක් සනිටුහන් කිරීමේ කටයුත්තකට දායක වීමට ජනාධිපති නීතිඥ සරත් ජයමාන්නට අවස්ථාව හිමිවිය. දුරකතන විශේෂඥයින් නීතිපති දෙපාර්තමේන්තුවට කැඳවා සාකච්ඡා ඇරඹිණ. කෙතරම් උපායශීලී අපරාධකරුවකු වුවද විශ්වයේ කොතැනක හෝ හෝඩුවාවක් ඉතිරි කරයි. ඒ බව සනාථ කරමින් දුරකතන විශේෂඥයින්ගෙන් හෙළිවූයේ ඕනෑම කෙනෙකු දුරකතන ඇමතුමක් ගන්නා විට ඇමතුම්කරු සහ ග්‍රාහකයාට ආසන්නතම සම්ප්‍රේෂණ කුලුනුවල යම් යම් දත්ත වාර්තා වන බවයි. අදාළ දුරකතන අංක, පණිවිඩකරුවන් සිටි ප්‍රදේශ, ඇමතුම් කාලය ආදී වැදගත් තොරතුරු හෙළිකර ගැනීමට ඉන් ඉඩ හිමිවේ. මේ සිදුවීම්වලට අදාළ වේලාවන් සහ ස්ථාන දන්නා බැවින් ඒ ඔස්සේ තොරතුරු සොයාගත හැකිය. විශේෂඥ සහාය අනුව අදාළ දුරකතන අංක සොයා ගැනිණ. ඒවා කාඩ් ක්‍රමය යටතේ ලබාගත් සම්බන්ධතා බවද හෙළි විය. අලුත්කඩේ ප්‍රදේශයේ සිටි පුද්ගලයකු සහ තුවක්කුකරුවන් යැයි සැක කරන අය අතර එදින පණිවිඩ අටක් පමණ හුවමාරු වී තිබිණ. කෙසේ වෙතත් අදාළ දුරකතන අංක දෙකටම අනන්‍යතාවක් නොමැත. එමෙන්ම ඒවා මෙම සිදුවීමෙන් පසු කිසිදු භාවිත කර නැත. ඒ අනුව එම අංක මෙම ඝාතනය සඳහාම යොදාගත් බව පෙනී යයි. නැවතත් සත්‍යය සෙවීම අසීරු තැනකට පත්වේ. යළි නීතිපති දෙපාර්තමේන්තුවෙන් දුරකතන විශේෂඥයින්ට දැනුම් දුන්නේ අලුත්කඩේ ප්‍රදේශයේ සිට භාවිත කෙරුණු දුරකතනයෙන් තුවක්කුකරුවන් යැයි සැක කරන අයට පරිබාහිර වෙනත් අයට ඇමතුම් දී ඇතිද යන්නයි. විමර්ශකයින්ට සැනසීමක් ගෙන දෙමින් තවත් එක් අංකයකට ඉන් ඇමතුමක් ලබාගෙන තිබිණ. ඒ ඝාතනයට පෙරයි. අදාළ අංකය ලියාපදිංචි එකකි. ඒ අනුව විමර්ශකයෝ එහි හිමිකරු හමුවූහ.

**"මම කණ්ඩායමක් තිස්සමහාරාමයට අරන් ගියා. ඒ ගමන යන්න මං වෙනත් කෙනෙකුගේ වෑන් එක ඉල්ලා ගත්තා. ඔය කියන දවසෙ එයා මට කතා කරලා කිව්වා වෑන් එක ආයෙ ගෙනත් දෙන්න කියලා."**

මේ ඔහුගේ ප්‍රකාශයයි. ඔහු ලබාගත් වෑන් රථයේ හිමිකරුට ස්ථාවර දුරකතනයක් මෙන්ම ජංගම දුරකතනයක්ද ඇත. ඒ අංක දෙකම මෙම පුද්ගලයා සතු විය. මේ සියල්ල අනුව සොයායෑමේදී හෙළිවූයේ එම වෑන් රථයේ හිමිකරු නවුෆර් නමැත්තා බවයි. මුල සිටම විමර්ශකයින්ගේ සැකයට හේතු වූ අයෙකු සිද්ධියට සම්බන්ධ බවට තොරතුරු පවතී. ඒ අනුව සිද්ධියේ පළමු සැකකරු වූ නවුෆර් පොලිස් අත්අඩංගුවට පත්විය. ඝාතනයට සම්බන්ධ අනෙක් සිව්දෙනා සොයාගැනීමට ඉන්පසු ඉඩ ලැබිණ. ඔවුන් සිව්දෙනා හඳුනාගැනීමේ පෙරෙට්ටුවකට ඉදිරිපත් කෙරුණේ රියැදුරා විසින් හඳුනාගනු ලැබීම වෙනුවෙනි. එහිදී නීතියේ ප්‍රතිපාදන අනුව සැඟවී සිට හඳුනාගැනීමේ ඉඩ ලබා ගැනුණේ රියැදුරාගේ ආරක්ෂාව සහතික කිරීම සඳහායි. එහිදී නඩුවේ දෙවන, තුන්වන, සිව්වන සහ පස්වන සැකකරුවන් ඔහු හඳුනාගත්තේය. මෙම විත්තිකරුවන්ගේ රුධිරය සාම්පලද ලබා ගැනිණ. ඒවා පරීක්ෂා කර, කලින් ලබාගත් වමනය සාම්පලය සමඟ සැසඳීමේදී හෙළිවූයේ ඒවා තෙවන විත්තිකරුගේ බවයි.
මීට පෙර හෝකන්දර ඝාතන නඩුවේදී ඩී.එන්.ඒ. තාක්ෂණය හඳුන්වාදීමේ විමර්ශන අවස්ථාවට ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න සහභාගි විය. එහෙත් අධිකරණයේදී එම සාක්ෂිය මෙහෙයවනු ලැබූයේ ජනාධිපති නීතිඥ පාලිත ප්‍රනාන්දු විසිනි. සරත් අඹේපිටිය ඝාතන නඩුවේදී එම අවස්ථාව ජනාධිපති නීතිඥ සරත් ජයමාන්නට හිමිවිය. විත්තිකරුවකු වරදකරුවකු කිරීමට ඩී.එන්.ඒ. තාක්ෂණය මෙරටදී භාවිත කළ ප්‍රථම අවස්ථාව මෙයයි. ඊට පෙර හෝකන්දර නඩුවේදී ඩී.එන්.ඒ. තාක්ෂණය පිළිගත්තද විත්තිකරුවන්, වරදකරුවන් කිරීමට එය භාවිත කෙරුණේ නැත. ඝාතන සැකකරුවන් භාවිත කළ වෑන් රථයද බේස්ලයින් මාර්ගයේ ඇල්විටිගල මහල් නිවාස අතර දමාගොස් තිබියදී සොයාගෙන තිබිණ. එහි තිබූ ඇඟිලි සලකුණු තුන්වන සහ පස්වන විත්තිකරුවන්ට සසැඳිණ. ඝාතනයට පෙර සැකකරුවන් දිවා ආහාරය ගත් අවන්හලේ තිබූ මත්පැන් බෝතලවලින් විමර්ශකයින් ලබාගෙන තිබූ ඇඟිලි සලකුණු දෙවන සහ තුන්වන විත්තිකරුවන්ට ගැලපී තිබිණ. දෙවන විත්තිකරුගේ නිවසින් සොයාගත් පිස්තෝලයක් සහ අපරාධ ස්ථානයේ වූ භාවිත කළ පතොරම්ද ගැළපින. දෙවෙනි සැකකරුගේ ප්‍රකාශයක් මත සොයාගත් රිවෝල්වරයක්ද අපරාධ ස්ථානයේ තිබූ වැය වූ පතොරම් සමග සසැඳිණ. දෙවැනි විත්තිකරු සන්තකයේ දුරකතනයක් විය. එය පළමු විත්තිකරු සමඟ පණිවිඩ හුවමාරු කරගත් එකයි.

නඩුවේ පළමු විත්තිකරු හෙවත් මෙහි මහමොළකරු වූ නවුෆර්ට එරෙහි ප්‍රබල සාධකයක් වූයේ විනිසුරුතුමන් ඝාතනය කිරීමට දැඩි පෙළඹවීමේ හේතුවක් තිබීමයි. ඒ තමාට එරෙහි ව විභාග වූ මිනීමැරුම් නඩුවයි. ඔහු ඝාතකයින්ට දුන් ඇමතුමද සාධාරණ සැකයකින් තොරව තහවුරු කර තිබිණ. එසේ වුවද නවුෆර් නිදහසට කරුණු ඉදිරිපත් නොකළේය. එවැනි කිසිඳු පැහැදිලි කිරීමක් නොකරන විට අධිකරණය විත්තිකරුට එරෙහි අගතිගාමී අනුමිතියකට එළැඹීම සාධාරණයැයි සැලකේ. මෙම සංකල්පය 'එලන්බරෝ ආප්තය' ලෙස සැලකෙයි. එම සිද්ධාන්තය භාවිත කළ හැක්කේ විත්තිකරුට එරෙහි ප්‍රබල නඩුවක් පවතින විටදීය. ඒ අනුව මෙහිදීද එය යොදා ගැනිණ. බොහෝ පිරිසකගේ කැපවීමෙන් සත්‍යය හෙළි කෙරිණ. එමෙන්ම එය කළ යුතුව තිබූ බව ජනාධිපති නීතීඥ සරත් ජයමාන්න පෙන්වා දෙයි.

**"අඹේපිටිය විනිසුරුතුමා ඝාතනයට ලක්වුණේ ඔහුගේ පෞද්ගලික හේතුවක් නිසා නෙමේ. යුක්තිය පසිඳලීමේ ක්‍රමය නගා සිටුවීමට ක්‍රියා කරමින් සිටියදීයි ඔහුට මේ ඉරණම අත්වුණේ. එතුමා යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය සඳහා කළ මෙහෙය අපි අගයන්න ඕනෙ. ඔහුගේ ඝාතනයෙන් පසුවයි විනිසුරුවරුන්ගේ ආරක්ෂාවට වෙනම ඒකකයක් ස්ථාපිත කෙරුණේ. කුඩා දෙයකින් පවා කොහොමද සාක්ෂි තහවුරු කරගන්නෙ කියන දේ වැනි බොහෝ කරුණු මේ නඩුවෙන් අපි ඉගෙනගත්තා."**

**විශේෂඥ සහාය අනුව අදාළ දුරකතන අංක සොයා ගැනිණ. ඒවා කාඩ් ක්‍රමය යටතේ ලබාගත් සම්බන්ධතා බවද හෙළි විය. අලුත්කඩේ ප්‍රදේශයේ සිටි පුද්ගලයකු සහ තුවක්කුකරුවන් යැයි සැක කරන අය අතර එදින පණිවිඩ අටක් පමණ හුවමාරු වී තිබිණ. කෙසේ වෙතත් අදාළ දුරකතන අංක දෙකටම අනන්‍යතාවක් නොමැත.**

■ රජනිකා ලියනගේ

**ඒ 2018 අගෝස්තු 12 වැනිදාය. එදා කොළඹ ආර්.ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණයට දහස් ගණනක් වූ ක්‍රිකට් ප්‍රේක්ෂකයින් පැමිණ තිබුණේ ශ්‍රී ලංකාව සහ දකුණු අප්‍රිකාව අතර පැවති එක්දින තරඟාවලියේ පස්වන සහ අවසන් එක්දින තරඟය නැරඹීමටය. තරඟයේ මුලින්ම පන්දුවට පහරදුන් ශ්‍රී ලංකාව පන්දුවාර 50 අවසන කඩුලු අටක් දැවී ලකුණු 299ක් ලබාගැනීමට සමත්වූයේ දකුණු අප්‍රිකාවට ලකුණු 300ක ඉලක්කයක් ලබාදෙමිනි. නමුත් දඟපන්දු යැවූ අකිල ධනංජයගේ සුපිරි පන්දු යැවීම හමුවේ දකුණු අප්‍රිකානු කණ්ඩායම පන්දුවාර 24.4කදී ලකුණු 121කට සීමාවිය. ඒ අනුව ශ්‍රී ලංකාවට ලකුණු 178ක විශිෂ්ට ජයග්‍රහණයක් හිමිවූ අතර තරඟයේ වීරයා වූයේ ලකුණු 29කට කඩුලු 06ක් දවාගත් අකිල ධනංජයයි. ඉතින් මේ සොඳුරු කතාබහ එවන් විශිෂ්ට ජයග්‍රහණය රැසක්ම ශ්‍රී ලංකාවට අත්කරදුන් අකිල ධනංජයගේ ආදරණීය බිරිඳ වන නෙතලි ටෙක්ෂිනී සමරවික්‍රම සහ මව වන ජයලතා ප්‍රනාන්දු සමඟිනි.**



# බැඳලා හනිමූන් යන්නෙ නැතිව පහුවදාම එයා ක්‍රිකට් ගහන්න ගියා

## අකිල ධනංජයගේ බිරිඳ නෙතලි ටෙක්ෂිනී සමරවික්‍රම

**නෙතලි ක්‍රිකට්වලට ආස කරන්නේ කොයි කාලේ ඉඳන්ද?**

මං නම් පුංචි කාලේ ඉඳන් ක්‍රිකට්වලට ආසයි. මොකද ඉස්කෝලේ යන කාලේ මමත් ක්‍රිකට් ගැහුවා. ඒ 2007 අවුරුද්දේ ඉඳන් වගේ. හැබැයි උසස් පෙළ කාලේ ක්‍රිකට් ගහන එක නතර කළා.

**අකිලව ඔයාට මුණගැහෙන්නෙත් ක්‍රිකට් නිසාලු නේද?**

ඔව් ඔව් අකිලයි මමයි දෙන්නම එකම ඉස්කෝලේ. ඒ කියන්නේ පානදුර මහානාම විද්‍යාලයේ. එයා මට වඩා අවුරුදු තුනක් විතර වැඩිමල්. ඉතින් මං ක්‍රිකට් පුහුණුවීම් කරද්දි එයත් එතැනට එනවා. මොකද එයත් ක්‍රිකට් ගැහුවනේ. ඒ අතරේ තමයි 2010 අවුරුද්දේ එයා මගෙන් යාළුවෙන්න ඇහුවේ.

**ඉතින් එයා කැමතිද කියලා අහපු ගමන් ඔයා කැමැත්ත දුන්නද?**

අපොයි නෑ. මං එකපාරට උත්තරයක් දුන්නේ නෑ. චුට්ටක් විතර ගණන් ඉස්සුවා. හැබැයි කතාබහ කරලා හිටියා. ටික දවසක් යනකොට තේරුණා අකිල කියන්නේ හොඳ කෙනෙක් කියලා. පස්සේ අපි ආදරේ කළා. අවුරුදු හතක් ආදරේ කරලා 2017 අවුරුද්දේ විවාහ වුණා. විවාහයට කලින් එයා ජාතික කණ්ඩායමටත් තේරුණා.

**මට මතක විදියට දෙන්නගේ විවාහ මංගල්‍යය තිබුණේ ක්‍රිකට් තරඟාවලියක් අතරතුරේ. මං හරිද?**

ඔව් හරි. ඒ වෙනකොට ඉන්දියාව එක්ක එක්දින තරඟමාලාවක් තිබුණා. අකිලත් කණ්ඩායමේ හිටියා. ඒ තරඟමාලාව මැද තමයි විවාහයත් තිබුණේ.

**එතකොට ඒ විදියට තරඟාවලියක් අස්සේ විවාහ වෙන්න හිතුවේ ඇයි?**

අපි කලින් ඉඳන් විවාහයට නැකැත් බලලා තිබුණේ. ඉතින් එදට තමයි නැකැත් දවස තිබුණේ. ඒ නිසා ක්‍රිකට් තරඟාවලියක් අස්සෙම විවාහය සිදුවුණා. වැඩේ කියන්නේ ඒ දවසට පහුවද මැච් එකකුත් තිබුණා. ඉතින් අකිලට විවාහ වුණු ගමන් අනික් පැත්තට මැච් එකට නුවර යන්න වුණා.

**එදා හනිමූන් එක පැත්තක දාලා මැච් එකට ගිය කොල්ලා ගැන තරහක් ආවේ නැද්ද?**

අනේ එහෙම නෑ. මොකද ඒ වෙනකොට මං එයාව හොඳට තේරුම් අරන් හිටියේ. ඒ නිසා ඒක ගාණක් නෑ.

**ඇත්ත කියන්න, ඔයාට මාවද ලොකු නැත්නම් මැච් එකද ලොකු කියලා එදා ඇහුවෙම නැද්ද?**

(සිනාසෙමින්) අයියෝ එහෙම ඇහුවේ නෑ.

**හැබැයි හනිමූන් එකත් පැත්තකට දාලා මැච් එකට ගිය අකිල ඔයාට හිතාගන්න බැරි මංගල තෑග්ගක් දුන්නා නේද?**

ඒක නම් හීනයක් වගේ. එදා එයා ලකුණු 29ට කඩුලු හයක් අරන් එයාගේ ක්‍රිකට් ජීවිතේ හොඳම පන්දු යැවීම වාර්තා කළා. එදා නම් මට අමතක නොවෙන දවසක්. ඒත් ඒ මැච් එක අපි පැරදුණා. එදා දිනුවා නම් තවත් සතුටුවෙන්න තිබුණා.

**ක්‍රිකට් ක්‍රීඩකයින්ට ලොකු කාන්තා ආකර්ෂණයක් තියෙනවනේ. විවාහයෙන් පස්සේ අකිලට කොන්දේසි දැම්මා කියන්නේ ඇත්තද?**

(සිනාසෙමින්) විහිලුවට වගේ පොඩි පොඩි කොන්දේසි ටිකක් දැම්මා ඉතින්. හැබැයි ඒ එයාව අවිශ්වාසෙට එහෙම නෙවෙයි.



**අපි දෙන්නම ඉස්කෝලෙදි ක්‍රිකට් ගහපු හින්දයි අපිට අපිව මුණගැහුනේ**

**නෙතලි දැන් අකිල එක්ක ගෙවන ජීවිතේ කොයි වගේද?**

අපි විවාහ වෙලා දැන් අවුරුදු හයක්. ඒත් අද ඊයේ විවාහ වුණු දෙන්නෙක් වගේ අපි දෙන්නා හරිම ආදරෙන් ඉන්නවා. අපිට දැන් අවුරුදු හතරක පුතෙක් ඉන්නවා. අකිලගේ අම්මලා ඉන්නෙත් අපිත් එක්කමයි.

**අකිල ඔයාට සැරවෙන්නේ එහෙම නැද්ද?**

(සිනාසෙමින්) එයාට ලේසියකට තරහා යන්නේ නෑ. නිවිලම තමයි ඉන්නේ. ඒත් තරහා ගිය වෙලාවට හොඳටම තරහා යනවා. ඒ වෙලාවට මං මුකුත් කියන්නේ නෑ. ඒත් මට තරහා ගියොත් එහෙම එයා ඒක ජෝක් එකට වගේ ගන්නවා.

**පසුගිය කාලයේ අකිලගේ පන්දු යැවීම නීති විරෝධියි කියලා එයාට ලොකු ප්‍රශ්නයකට මුහුණදෙන්න වුණා. ඒ වෙලාවේ එයා හැසිරුණේ කොයි විදියටද?**

ඇත්තටම එයා ගොඩාක් දුක්වුණා. ඒත් එයාට පුළුවන් ඉක්මනට පන්දු යැවීමේ ඉරියව්ව හදාගන්න ඕන වුණා. ඊටපස්සේ දිගටම පුහුණුවීම් කළා. කොරෝනා කාලේ පවා එළියට ගිහින් පුහුණුවීම් කළා. මං බයේ යන්න එපා කිව්වත් එයා ගියා. අන්තිමේ එයා එයාගේ කැපවීමෙන් ආයෙත් පන්දු යැවීමේ ඉරියව්ව හරියට හදාගත්තා.

**අකිල ටිකක් විලාසිතා කරන්න කැමතියි වගේ නේද?**

ඔව්. කොණ්ඩේ එහෙම වෙලාවකට කලර් කරනවා. මමයි අම්මයි කැමති වුණාට එයාගේ තාත්තා නම් ඒ දේවල්වලට ටිකක් අකමැතියි.

**ඉදිරියේදී එක්දින ක්‍රිකට් ලෝක කුසලානයක් එනවා. මෙවර අකිල ධනංජයට කණ්ඩායමේ තැනක් ලැබෙයිද?**

එහෙම අවස්ථාවක් ලැබෙනවා නම් හොඳයි. මොකද ලෝක කුසලානයට අවස්ථාව ලැබුණොත් රට වෙනුවෙන් හොඳටම සෙල්ලම් කරන්න එයා බලාගෙන ඉන්නවා. මමත් ආසයි ඒ ලෝක කුසලානය වෙනුවෙන් එයා සෙල්ලම් කරනවා දකින්න.

අකිල ධනංජයගේ බිරිඳ නෙතලි සමඟ කළ කතාබහෙන් පසු අප ඊළඟට හැරුණේ අකිල අද ඉන්නා තැන ගැන වැඩිපුරම ආඩම්බර වෙන ඇය දෙසටය. ඒ අකිලගේ ආදරණීය මව වන ජයලතා ප්‍රනාන්දු පැත්තටය.

**අකිල ධනංජය අද ඉන්න තැන ගැන අම්මට තියෙන්නේ මොන වගේ හැඟීමක්ද?**

මට අකිල ගැන ගොඩාක් ආඩම්බරයි. මොකද අපි ලොකු මිනිස්සු නෙවෙයි. ගොඩාක් දුෂ්කරතා එක්කයි එයා අද ඉන්න තැනට ඇවිත් ඉන්නේ. මට තාම මතකයි පුතා කෝච්චියේ අර ලොකු ක්‍රිකට් බඩු බෑග් එකත් එල්ලගෙන හිරවෙලා පුහුණුවීම්වලට කොළඹ ගියපු හැටි. ඒ කැපකිරීම්වල ප්‍රතිඵල දැන් තියෙනවා. ඉතින් ඒ දේවල් එක්ක අකිල පුතා දැන් ඉන්න තැන ගැන එයාගේ අම්මා විදියට ආඩම්බරයි.

**පුතා පොඩි කාලේ නම් ටිකක් දඟයි කියන්නේ ඇත්තද?**

(සිනාසෙමින්) ඔව් ඔව් ටිකක් දඟ කළා. මොන්ටිසෝරි කාලේ එහෙම ළමයෙක්ට ගහලා මටත් මොන්ටිසෝරි යන්න වුණා. මට මතකයි ඒ කාලේ සත්තු පාරේ එහෙම පන්නනවා. එතකොට ගස් ගල් දිගේ නගිනවා. හැබැයි ලොකු වෙනකොට ඒ දඟ වැඩ නැවතුණා.

**එතකොට අකිලට ක්‍රිකට් ගහන්න ආසාවක් ආවේ කොහොමද?**

අකිලගේ අයියා ක්‍රිකට් ගැහුවා. ඉතින් එයාට පුහුණුවීම් තියෙන දවස්වලට මං කෑම එකක් අරන් යනවා. අකිලත් මාත් එක්ක යන්න එනවා. එයා එතකොට හරි පොඩියි. දිගටම එහෙම එද්දි තමයි එයාටත් අයියා වගේ වෙන්න ඕන වුණේ. ක්‍රිකට් ගහන්න පටන්ගත්තේ එහෙමයි.

**අකිල ගෙදරදී එහෙම කොයි වගේද?**

එයා ගුණධර්ම අතින් පොහොසත් දරුවෙක්. අපේ හිත් කවදාවත් රිදවලා නෑ. මටයි එයාගේ තාත්තටයි හරිම ආදරෙයි. එයාට ඉන්නේ අයියයි, නංගියි. ඒ දෙන්නටත් පණ ඇරලා. එයාගේ වාසනාවට වගේ හොඳ බිරිඳකුත් එයාට ලැබුණා.

**අකිලගේ ක්‍රිකට් ජීවිතයේ අම්මා දකින්න කැමතිම හීනයක් තියෙනවද?**

මගේ ලොකුම ආසාවක් තමයි ඉදිරියේදී තියෙන එක්දින ලෝක කුසලානයට එයා ක්‍රීඩා කරනවා දකින එක. අපි බලමු.

■ රුවන් එස්.සෙනවිරත්න

ධරණී

**ලිබර්ටි පබ්ලිෂර්ස් ප්‍රයිවට් ලිමිටඩ්**

අංක 91, විජේරාම මාවත,
කොළඹ 07.
දුරකථන 0115 200 900
බෙදාහැරීමේ අංශය 0112 127204
දැන්වීම් අංශය 0112672801 0112672603
ෆැක්ස් 0112 673 451



දැන්වීම් සඳහා අමතන්න

**0112 672 601**
**0112 672 603**








ධරණී

**පුවත් පත**
**නිවසටම ගෙන්වාගන්න**
**අමතන්න**
**076 1367 623**


දැන්වීමයි

# ආර්ථික අභියෝග ජය ගැනීම උදෙසා කාන්තාවන් සවිබල ගන්වමු







ලෝක ශ්‍රම බලකායෙන් 40% ක් නියෝජනය කරන්නේ කාන්තාවන්ය. ආර්ථික සංවර්ධනයෙහිලා මොවුන්ගෙන් ඉටුවන කාර්යභාරය සුවිශාලය. උදාහරණ වශයෙන් ලොව කෘෂිකාර්මික ශ්‍රම බලකායෙන් 43% ක් කාන්තාවන්ගෙන් සමන්විත වේ. විවිධ රටවල ආර්ථික සංවර්ධනයෙහිලා කාන්තාවන්ගේ සහභාගිත්වය නොයෙකුත් සමාජ, සංස්කෘතික හා දේශපාලන බලපෑම් මත සීමා වී පවතී.

එහෙත් පොදුවේ ගත් විට සමස්ත ලෝකයෙහි ම සංවර්ධනයෙහිලා කාන්තාවෝ විශාල දායකත්වයක් දක්වමින් සිටියි. එපමණක් නොව එය තවදුරටත් පෙර නොවූ විරූ පරිදි වර්ධනය වෙමින් පවතී.

කාන්තාවන් ආර්ථිකයට දායක වීමට අමතරව දැනුවත් විය යුතු කරුණු කිහිපයකි. එනම් අධ්‍යාපන, සෞඛ්‍ය, සමාජීය, සංස්කෘතික කාරණා මෙන්ම පෝෂණ අවශ්‍යතා, ළමා හා කාන්තා හිංසනයෙන් ආරක්ෂා වීම, ලිංගික අධ්‍යාපනය සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ආදියයි.

හේලීස් වැවිලි සමාගම කාන්තාවන්ගේ අධ්‍යාපන, සෞඛ්‍ය, සමාජීය, සංස්කෘතිකමය අවශ්‍යතාවයන් සපුරාලීම වෙනුවෙන් කැපවෙයි. එමෙන්ම ළමා හා කාන්තා හිංසනයෙන් ආරක්ෂා වීම, ලිංගික අධ්‍යාපනය සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කරන අතර වතු සේවක පිරිස් වෙනුවෙන් යටිතල පහසුකම් ද සපයනු ලබයි. ප්‍රධානතම කරුණක් වන්නේ වතු ප්‍රජාවට අවශ්‍ය පෝෂණ අවශ්‍යතා සහ සෞඛ්‍ය පිළිබඳව හේලීස් වැවිලි සමාගම විශේෂ අවධානයක් යොමු කිරීමයි.

හේලීස් වැවිලි සමාගමට අයත් තලවකැලේ වැවිලි සමාගමේ පාමර්ස්ටන් වතුයායේ සේවය කරන වසන්තමලර් මහත්මිය තම අත්දැකීම් මෙසේ දක්වයි.

“මම පාමර්ස්ටන් වතුයායේ සේවයට ඇවිල්ලා දැනට වසර 20 ක් වෙනවා. මේ රැකියාව නිසා තමයි මම මගේ දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබාදෙමින් සතුටින් ජීවත් වෙන්නේ. ගෙදර දී අපි අපගේ උපන්දිනය සැමරුවේ නැතත් වත්ත එය සමරන්න අමතක කරන්නේ නෑ. ඒ වගේම අපිව විනෝද චාරිකා එක්කන් යනවා. ලෝකය නොදකින අපිට එම අවස්ථාව ගොඩක් වැදගත්.”

වතු ප්‍රජාවගේ පෝෂණය හා සෞඛ්‍ය පිළිබඳව සැලකිලිමත් වීම සිය මූලික ප්‍රතිපත්තියක් බවට පත්කර ගනිමින් පාමර්ස්ටන් වතුයායේ සේවයේ නිරත පිරිස් වලට දිවා ආහාරය, උදෑසන තේ හෝ කිරි මෙන්ම වැසි දිනවලට කොත්තමල්ලි වැනි පානයන් ලබාදීම පිළිබඳව වසන්තමලර් මහත්මිය ස්තූති පූර්වක වූවාය.

තේ දළු නෙළන්නියන්ගේ සිට කළමණාකරුවන් දක්වා වූ සියලු කාන්තාවන් තුළ ආත්ම විශ්වාසය ඇති කරමින් ඔවුන් තුල කුසලතා වර්ධනය කිරීම සඳහා විවිධ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස ලිංගික හිංසනය, කාන්තා හිංසනය මෙන්ම මත්ද්‍රව්‍ය භාවිතය ද අවම වී ඇති අතර ආර්ථික, සමාජීය, අධ්‍යාපන, සෞඛ්‍ය සහ සංස්කෘතික යන සෑම අංශයකින්ම කාන්තාව පුළුල් ලෙස දැනුවත් වී සිටින්නීය.

කාන්තාවන් නිරෝගී, සෞඛ්‍ය සම්පන්න සහ දැනුමින් පොහොසත් දරු පරපුරක් බිහි කිරීම සඳහා සිය දිවිය කැප කරමින් සංවර්ධන ක්‍රියාවලියට ද දායක වෙයි. එවැනි කාන්තාවන් සවිබල ගන්වමින් ඔවුන්ට වෘත්තීයමය අවස්ථා ලබා දෙමින් සාර්ථක වෘත්තීය ජීවිතයකට සමගාමීව තෘප්තිමත් පෞද්ගලික ජීවිතයක් ගතකිරීම උදෙසා හේලීස් වැවිලි සමාගම ලබාදෙන ශක්තිය සැබවින්ම අගය කළ යුතුය.



# ගෑනුන්ට බාගෙට බාගයක්ම තියෙන්නේ ‘පිරිමි දාපු ප්‍රශ්න’

## සුරත් ද මැල්

තලෙයිබානුවෝ ඇෆ්ගනිස්තානය යටත්කරගත්තු කාලෙදි තුවක්කුව බිම තියලා පොතක් කියවන තලෙයිබාන් සාමාජිකයෙක්ගේ පිංතූරයක් සමාජ මාධ්‍යවල හුවමාරු වුණා. ඔව්. පොතකට පුළුවන් ආයුධයක් බිම තියන්න, ත්‍රස්තවාදියෙක් මනුස්සයෙක් කරන්න. හැමෝම කිව්වේ එහෙම.

ඇත්ත. පොතකට මොනවද කරන්න බැරි? හැබැයි හොඳ පොතකට.

මොළේ උණුසුම් කරන හොඳ පොත් ලියන පිරිස අතලොස්සයි. සුරත් ද මැල් කියන ලේඛකයා ඒ පිරිස අතරට එක් කරන්න අපි දෙපාරක් නොහිතුවේ ඔහු සමාජයට ලොකු පණිවිඩයක් එක්ක කියවන්න පිරියට පොත් ලියන්නෙක් නිසයි. ඔහුගේ ‘සී+’ පොතේ රහ ගැන අපි ‘ධරණී’ පාඨකයෝ එක්ක මීට කලින් බෙදාගත්තා මතක ඇති.

ඔන්න ඉතින් සුරත් ද මැල් තව පොතක් ලියලා. ඒ තමයි ‘ඩුඕ (දෙදෙනෙක්)’. කලින් පොතේ රස මතක හින්දා ‘ඩුඕ’ කියවන්නත් අපි ආපහු දෙපාරක් හිතුවේ නෑ.

වැස්ස දවසක හවසක කෝපි කෝප්පයක් එක්ක පොතක් කියවන එක තරම් නිවනක් කොහෙන්ද මනුස්සයෙකුට? කියව්වේ පිටුවයි දෙකයි. ‘ඩුඕ’ කෝපිවලට හොඳටම ගැළපෙන සංයෝගයක් බව තේරුණා. ඉතින් හදාගත්තා කෝපි කෝප්පයක්. කියව්වා පොත එක හුස්මට.

පොතේ ප්‍රධාන චරිත දෙකයි. උමා සහ සාරා. කාලවකවානු දෙකක, රටවල් දෙකක ජීවත්වෙන තරුණියෝ දෙන්නෙක්. මේ තරුණියෝ දෙන්නා පිරිමි ලෝකෙක විමුක්තිය හෙව්වා.

‘ඩුඕ’ පොතෙන් මට හම්බුණේ උමාවත් සාරවත් නෙමෙයි. එතැන හිටියේ මම. මේක ලියන මම ඇතුළුව කියවන ඔබත්, පිරිමින්ට යටවුණු ලෝකෙක ජීවත්වෙන ගෑනු හිත්වල අඳුරු හෙවණැලි. උමාටයි, සාරටයි, අපිටයි විමුක්තිය හම්බෙයිද? ඒක දැනගන්න නම් ‘ඩුඕ’ කියවන්නම වෙනවා.

ඔයාලට ප්‍රශ්නාර්ථයක් ඉතිරි කළාට, උත්තරේ දැනගත්තු මම ඊළඟට කළේ සුරත් ද මැල්ට කෝල් එකක් ගත්තු එක. ඒ ‘ඩුඕ’ ගැන ටිකක් කතා කරන්න.

**‘ඩුඕ’ට යන්න කලින් ‘සී+’ගෙන් කතාව පටන්ගමු. ‘සී+’ ස්වර්ණ පුස්තක ගොඩගේ සම්මානයන්ට නිර්දේශ වුණා, සරසවි ප්‍රකාශකයන්ගේ වැඩියෙන්ම අලෙවිවුණු පොතක් වුණා. එච්චරගෙන් කියැවෙන්නේ ලේඛකයෙක් විදියට සුරත්ගේ සාර්ථකත්වයද?**


ලේඛකයෙක්ට සාර්ථක වෙන්න පුළුවන් ක්‍රම කීපයක් තියෙනවා. ඉහළ අලෙවිය කියන්නේ පාඨක කැමැත්ත. සම්මාන කියන්නේ විනිශ්චය මණ්ඩලවල කැමැත්ත. ඔය දෙකම නැතිව විචාරක ප්‍රසාදය තියෙන්නත් පුළුවන්. මේ සේරම සාර්ථක ලේඛනයට සාක්ෂි. මට ඔය සේරටෝම වැඩිය වටින්නේ ලේඛකයගේ හෘද සාක්ෂිය. ලියන්නෙක් විදියට තමන් මොකක්ද සමාජගත කළේ කියන එක දන්නෙ ලේඛකයා. මට නම් හැමතිස්සෙම හිතෙන්නේ මගෙන් මගහැරුණු කොටස වැඩියි කියලයි.

**සුරත්ගේ තුන්වැනි නවකතාව ‘ඩුඕ’ කොහොම පොතක්ද?**

ඒක කාලවකවානු දෙකක, රටවල් දෙකක ජීවත්වෙන ගැහැනු දෙදෙනෙක්ගේ කතාවක්. මේ දෙන්නටම සමාන ආකාරයේ සමාජ සංසිද්ධීන්වලින් ගමන් කරන්න සිද්ධ වෙනවා. හැබැයි මේ දෙදෙනා ඒ සිද්ධි එක්ක ඇතිවෙන ප්‍රශ්නවලට මුහුණදෙන්නේ දෙආකාරයකට. එච්චරත් එක්ක මේ අයගේ ජීවිත වෙනස්වන විදිය තමයි පොතෙන් කියන්නේ.

**සුරත් නවකතාවලින් ගෑනුන්ගේ ප්‍රශ්න ගැනම කතා කරන්නේ ඇයි? පිරිමින්ට ප්‍රශ්න නැද්ද?**

ඇයි නැත්තෙ? පිරිමින්ට ප්‍රශ්න තියෙනවා. හැබැයි ගෑනුන්ට ඊටත් වැඩියි. පිරිමින්ට ප්‍රශ්න නැති ක්ෂේත්‍රවල පවා ගෑනුන්ට අඩිය තියන්න බැරිතරම් ප්‍රශ්න සහ සීමා තියෙනවා. මේ සේරම සංස්කෘතික ප්‍රශ්න. දැඩි පුරුෂ මූලික සමාජයක් තියෙන ලංකාව, ඉන්දියාව වගේ රටවල ප්‍රශ්න බරපතළයි. අනික ගෑනු ගිහින් පිරිමින්ට ප්‍රශ්න ඇති කරනවා අඩුයි. හැබැයි වැඩේ කියන්නේ ගෑනුන්ට තියෙන ප්‍රශ්නවලින් බාගෙට බාගයක් පිරිමි හදපුවා.




**ගෑනුන්ට කෑගහලා කියන්න ඕන වුණත් කියාගන්න බැරිව හිතේ තදකරගෙන ඉන්න වචන ඒ විදියටම ‘ඩුඕ’ගෙන් දැක්කා. සුරත්ට ගෑනුන්ගේ හිත් කියවන්න පුළුවන් බලයක්වත් තියෙනවද?**

කාටද හිත් කියවන්න බැරි? අපි හැමෝටම පුළුවන් හිත් කියවන්න. ඒත් අපි අනිකාගේ සිතුම් පැතුම් නොතේරෙන තාලෙට ඉන්නවා. එතකොට අපි කියන කරන දේවල වගකීමෙන් මිදෙන්න ලේසියි. විශේෂයෙන් ස්ත්‍රී පුරුෂ සම්බන්ධතාවලදි පිරිමි කරන්නෙම ඒක. සැමියා බිරිඳ, පියා දියණිය ඔය හැම සම්බන්ධයකදිම “මට මේ ගෑනු තේරෙන්නේ නෑ, ගෑනුන්ගෙ හැටි ඔහොම තමයි” කියන බොරුව ඉස්සරහට දාලා ඇඟ බේරගන්න පිරිමි දක්ෂයි.

**අසූව දශකයේ ‘කුසලා’ ප්‍රශ්න දරාගන්න බැරිව සියදිවි නසාගත්තා. ගෑනුන්ට ප්‍රශ්න උරුමයි කියලා වගේ ‘උමා’ ප්‍රශ්න දරාගත්තා. ‘සාරා’ ප්‍රශ්නෙට විරුද්ධව වැඩ කළා. ඉස්සර ගෑනු ප්‍රශ්න දරාගත්තට දැන් මොඩර්න් ගෑනු අසාධාරණේට නැගිටිනවා කියන එකද ඒකේ අදහස?**

සමාජ සංස්කෘතිය ගැනයි, තමන්ගේ බලය ගැනයි දැනුවත් වුණාහම ගෑනු වුණත් වෙනස් වෙනවා. ඒ බලය පාවිච්චි කරලා තමන් වෙනුවෙන් නැගිටින්න පටන්ගන්නවා. විසිවන ශතවර්ෂයේ බටහිර ජීවත්වෙච්ච කාන්තාවෝ බටහිර සංස්කෘතිය ගැන අධ්‍යයනය කරලා නිදහස සහ අයිතීන් වෙනුවෙන් කතා කරලා අද සාර්ථක තැනක ඉන්නවා. හැබැයි අවාසනාවකට අපේ සංස්කෘති තාම ඉන්නේ සියවස් ගාණකට පිටිපස්සෙන්.

**ඉස්සර අයට වඩා නිදහස වෙනුවෙන් කතා කරන නිසා දැන් කාලේ ගෑනුන්ට ප්‍රශ්න වැඩිවෙලා කියලා සුරත්ට දැනිලා නැද්ද?**

තමන්ට අහිමි කරලා තිබුණු පොළොවකට පය තිබ්බහම අලුත් අලුත් ප්‍රශ්න එනවා. ඒක ස්වභාවිකයි. හැබැයි නිදහස දිනාගන්න කෙටි පාරවල්වත් බයිපාස්වත් නෑ කියන එක මතක තියාගන්න.

**එක කතාවක් ඇතුළේ චරිත කිහිපයක්, ප්‍රශ්න කිහිපයක් ගැන කතා කරන්න සුරත් කොහොමටත් දක්ෂයි නේද?**

කතාවේ චරිතවලින් පුද්ගල මනෝභාවයන් හෝ සමාජ සංසිද්ධීන් විස්තීර්ණය කරන එක තමයි බහුතරයක් නිර්මාණවල තාක්ෂණය. මේ ප්‍රධාන චරිත ඇත්තටම කවුද කියන එක තීරණේ වෙන්නේ එයාලා සෙසු චරිත එක්ක කරන ගනුදෙනුව මතයි. සෙසු චරිත ප්‍රධාන චරිත පෝෂණය කරනවා. මගේ කතාවල චරිත පණ ඇති මිනිස්සු කරන්න මම කැමතියි. මේ හැම චරිතයක්ම නිර්මාණය වුණේ හැබෑම චරිතයක් මත වීම තමයි ඒකට හේතුව.

**ඇත්තටම කියවීම මිනිසා සම්පූර්ණ කරනවද? මිනිස්සු නවකතා, කෙටිකතා කියවන්න ඕනේ ඇයි?**

ඔව්. කියවීම මිනිසා සම්පූර්ණ කරනවා. අදටත් දැනුම රැස් කරන්න පුළුවන් ප්‍රධානම මාර්ගය තමයි කියවීම. හැබැයි ඔය කියමනේ තියෙන්නේ නවකතා, කෙටිකතා ගැන නෙමෙයි. පොදුවේ කියවීම ගැන. කතා කියවලා විතරක් ඔය කාරිය වෙනවා කියලා මම හිතන්නෑ. කලාව ආනන්දයෙන් ඇරඹී ප්‍රඥාවෙන් අවසන් වෙනවා කියලා කියමනක් තියෙනවානේ. ආනන්දයෙන් ඇරඹෙන බව නම් ඇත්ත. හැබැයි ප්‍රඥාවේ කොතෙක් දුරට යනවද කියන එක තමන් දැනගන්න ඕනේ. තමන්ට තියෙන්නෙ එක ජීවිත කාලයයි. ඒ ජීවිත කාලේ විඳින්න පුළුවන් හොඳ ක්‍රමයක් තමයි කලාව. පොත් කියවීම.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි

## ‘ඩුඕ’ පාඨක හමුව

සුරත් ද මැල්ගේ අලුත්ම නවකතාව ‘ DUO ඩුඕ (දෙදෙනෙක්)’ වෙනුවෙන් සංවිධානය කරන පාඨක හමුව පෙබරවාරි 18 වැනි සෙනසුරාදා උදේ 10 සිට පස්වරු 01 දක්වා නුගේගොඩ සරසවි පොත්හලේදී පැවැත්වෙයි. එහිදී කර්තෘවරයා සම්මුඛ වී ඔහුගේ අත්සන සහිතව ‘ඩුඕ’ නවකතාව ලබාගැනීමට පාඨකයන්ට පුළුවන.



# මේ දරුදෙන්නව හදාගන්න දෙන්න කියලා මමත් ඉල්ලුවා

## ගොඩිගමුව අම්බලමේදී ඝාතනය වූ දරු දෙදෙනාගේ ලොකු අම්මා කියයි

ඒ දින නවම් පෝයය. දවස පුරාම ඇසුනේ බුදු බණත් දම් ගුණත්ය. එහෙත් එවැනි වදනකින්වත් නිවී සැනසෙන්නට බැරි කේන්තියකින් වසන්ත කරුණාරච්චිගේ හිත ආකාරුණික වෙමින් තිබුණි.

පෞද්ගලික ආයතනයක රැකියාව කළ වසන්ත තිස්තුන් හැවිරිදි දෙදරු පියෙකි. ඔහුගේ නව හැවිරිදි දියණිය රිද්මානි ය. සය හැවිරිදි පුතු දෙනුවන් ය. මල් කැකුළු වන් ලස්සන දරු පැටවුන් සමඟ ලස්සන ජීවිතයක් ගත කරන්නට එම දෙන්නා දෙමහල්ලන් මැවූ සිහින කාලයත් සමඟ බොඳ වෙන්නට පටන්ගත්තේ හේතුවක් තිබුණාටම නොවේ.

වසන්තගේ ගම ගිරිඋල්ලේය. එහෙත් විවාහයෙන් පසු ඔහු පදිංචිව සිටියේ බිරිඳගේ මහගෙදර පිහිටි අරණායක ගොඩිගමුව ප්‍රදේශයේය. දරුවන් දෙදෙනා පාසල් ගියේද එහි සිටය. එහෙත් ඔහු මාස දෙකකට පමණ පෙර දරුවන් පාසලෙන් අස්කරවාගෙන ගිරිඋල්ලේ තම මවගේ නිවසට පැමිණියේය. ඒ බිරිඳත් සමඟිනි. දරුවන් ගිරිඋල්ලේ පාසලකට ඇතුළත් කළේ හොඳින් උගන්වන්නටය. එහෙත් බිරිඳගේ මහගෙදරදී ඇතිවූවා සේම පුංචි පුංචි විරසකකම්, ඒ ගෙදරදී මහා රණ්ඩු සරුවල් බවට පත්වන්නට වැඩි දවසක් ගියේ නැත. පසුගියදා එහි උච්ඡතම අවස්ථාවක් පැමිණ තිබිණි. ඒ දෙදෙනා අතර ඇතිවූ ආරවුලකින් පසු වසන්ත කඩුවක් ගෙන තම බිරිඳ එළවාගෙන ගියේයැයි කියන සිද්ධියත් සමඟය.



**"එදා දුව කෝල් කරලා කිව්වා බෑණා එයාව මරන්න එළවනවා කියලා. හැංගිලා ඉඳන් කතා කරන්නේ කියලත් කිව්වා... අපිත් බයවුණා දරුවට කරදරයක් වේවි කියලා. ඉතින් අපි ත්‍රීවිල් එකක ගිහින් දුවව ගෙදර එක්කරන් ආවා. ඒ ඇවිත් පස්වැනිදා අරණායක පොලිසියේ සිද්ධිය ගැන පැමිණිල්ලක් දැම්මා."**

ඒ වසන්තගේ මාමණ්ඩිය වන 61 හැවිරිදි නිමල් වීරසූරියගේ හඬය. එම පැමිණිල්ල විභාග කිරීමට නියමිතව තිබුණේ ඉකුත් හයවන සඳුදා උදෑසන දහයටය. ඒ බව වසන්තටද පොලිසියෙන් දැනුම් දී තිබුණි. ඊට පෙර මෙම ප්‍රශ්නය සමථයකට පත්කරගැනීමේ ඕනෑකමක්ද ඔහුට තිබුණි. ඔහු පෝයදා පාන්දර දරු දෙදෙනාවද ලෑස්ති කරවාගෙන බිරිඳගේ මහගෙදර යන්නට සූදානම් වූවේය.

**"අපි අම්මව එක්කරන් එන්නද යන්නෙ තාත්තේ...?"**

පුංචි පැටුවන්ට අම්මා ගෙදර නැති සාංකාව දැනී තිබුණෙන් ඔවුන් සිටියේ ගමන ගැන සතුටිනි. වසන්ත දරුවන් දෙදෙනා තම මෝටර් බයිසිකලයේ නංවාගෙන ගොඩිගමුව ගෙදරට ආවේය. පැටවුන් අම්මා දැකීමෙනුත්, ආච්චි සීයාගේ ආදර සැලකිලි ලැබීමෙනුත් සිටියේ සතුටිනි. වසන්ත බිරිඳ සමඟ කතා කරන්නට උත්සාහ කළත්, ඇය ඔහුට මුහුණ නුදුන්නේය. ඇය කතා කළේද වචනයක් දෙකකි. ඒ ඔහු කියන වචන ගැන ඇයට විශ්වාසයක් නොවූ නිසා වන්නට ඇත. ඇයට ඕනෑ වන්නට ඇත්තේ සිද්ධිය පොලිසියේදී සමථයකට පත්කරගැනීමටය.

**"කොහොමහරි දරුවෝ දෙන්නා එදා මගේ තුරුලට වෙලාත් හිටියා. පුතා හරිම හුරතල් දරුවෙක්. එයා දවල් කෑම කෑවට පස්සේ අයිස්ක්‍රීම් නැද්ද කියලා ඇහුවා. මම කිව්වා ෆ්‍රිජ් එකේ තියෙනවා අරගෙන කන්න කියලා. හවස් වෙද්දි බෑණා කිව්වා ගෙදර යන්න ඕන කියලා. ඒ වෙලාවේ පහට හයට ඇති. මම කිව්වා, දරුවෝ දෙන්නා තියලා යන්න, හෙට ආයේ පොලිසියටත් එන්න ඕනනේ කියලා. දරුවෝ ඉස්කෝලේ යන්න ඕන නිසා නතර කරලා යන්න බෑ කියලා බෑණා කිව්වා. දරුවෝ තියලා යනවට මං කැමති වුණාත්, බෑණා දරු දෙන්නා එක්ක ගියා."**

නිමල් වීරසූරිය තම මුනුබුරාගේත් මිනිබිරියගේත් හිස අතගා සමුදුන්නේ, තවත් හෝරා කිහිපයකින් නරකක් නපුරක් අසන්නට නම් නොවේ. **"පරිස්සමින් ගෙදර ගිහින් කෝල් කරන්න"** යැයි ඔහු හදවතින්ම කීවේ ආශිර්වාදයද සමඟිනි.

එසේ ගිරිඋල්ල ගෙදරට යනවා යැයි කියා එම නිවසින් වසන්ත පිටත් වුවත්, කිලෝමීටරයක් පමණ දුරට ගොස් නතර වුණේ කවුරුවත්ම නොදැන සිටි අරමුණ වෙනුවෙන් වන්නට ඇත. ඔහු බයික් එක කැඩුණා යැයි පුංචි පැටවුන්ටද කියන්නට ඇත. කිසිවක්ම නොදත් පුංචි උන් දෙන්නා සමඟ ඔහු අම්බලමට ගොඩවෙන්නේ මේ අතරය. ඒ වනවිට වටපිටාව කළුවරය. පුංචි උන් සඳේ රැස් දෙස බලා සිටියදී ආදරණීය පියෙකු විසින් කවදාවත්ම නොගත යුතු තීන්දුවක් ඔහු ගෙන තිබුණි.

**"රෑ දෙළහට විතර මට බෑණාගෙන් කෝල් එකක් ආවා. ඒ වෙලාවේ මම හිතුවේ එයාලා ගෙදරට ගිහින් කියලයි. ඒත් බෑණා කිව්වා බයික් එක කැඩුණා ඒක දාලා පයින් ගෙදර යනවා කියලා. මම කිව්වා දරුවෝ දෙන්නට නිදිමත ඇති, අනේ පරිස්සමින් යන්න කියලා."**

ඉන්පසු සිදුවූයේ දේ නිමල් වීරසූරියට පමණක් නොව හදවතක් ඇති කිසිවකුට දරාගත නොහැකි දේය. වසන්තගේ නිසල සිරුර අරණායක පොල් අඹේගොඩ-ගොඩිගමුව පාළු අම්බලමේ බාල්කයේ එල්ලෙමින් තිබියදී පළමුව දකින්නේ පාසල් දරුවෙකි. ඔහු ඒ බව වැඩිහිටියෙකුට කිව්වේය. පසුව ගම්මුන් අරණායක පොලිසිය දැනුවත් කර එම ස්ථානයට යද්දී දැක්කේ, පුංචි පැටවුන් දෙදෙනාගේ නිසල සිරුරුයි. දරුවන් දෙදෙනා පාළු අම්බලමේ එක ළඟ බිම සතපවා තිබුණි. පෝය සඳ පවා ඒ දසුනින් තැවෙන්නට දැවෙන්නට ඇත. දරුවන් ඝාතනය කර පියාද අම්බලමේ බාල්කයේ එල්ලී දිවි නසාගන්නට ඇතැයි පොලිසිය සඳහන් කළේය.

**"අනේ දෙවියනේ.. මොන අපරාධයක්ද මේ. මේ දරු දෙන්නව හදාගන්න මම ඉල්ලුවා. මොන හිතකින්ද මෙහෙම දෙයක් කළේ. නංගිත් මොහු එක්ක ඉන්න බැරි තැනයි ගෙදර ආවේ. කිසිම අම්මෙක් තාත්තෙක් දරුවන්ට මෙහෙම අපරාධ කරන්න එපා."**

ඒ දරුවන්ගේ ලොකු අම්මා කියන කතාවය. දෙමාපියන්ගේ මොන විරසකකම් තිබුණාත් පුංචි දරුවන්ට ජීවත්වන්නට ඇති අයිතිය මේ අයුරින් නැතිකර දැමීම කොතරම් අවාසනාවක්ද?

**"දෙමාපියන් අතර ඇතිවන ප්‍රශ්න මුල්කරගනිමින් ඇතිවන ආරවුල්වලදි දරුවන් වින්දිතයින් කරන්න එපා. මෙවැනි ආරවුල් විසඳගන්න, ඊට සහාය ලබාගන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සිටින නිලධාරීන්, පරිවාස නිලධාරීන් හෝ ප්‍රදේශයේ පොලිස් ස්ථානවල සිටින ළමා හා කාන්තා කාර්යාංශ නිලධාරීන්ගේ උපදෙස් හා සහාය පැතිය හැකියි."**

ඒ පොලිස් මාධ්‍ය ප්‍රකාශක නීතීඥ නිහාල් තල්දූව මහතායි. ඔහු කියන්නේ දරුවන් හදා වඩාගැනීමේ අපහසුතා වේ නම් අදාළ අංශ දැනුවත් කර ඊට උපකාර ලබාගත හැකි බවය.

අරණායක පොලිසිය මෙම සිදුවීම පිළිබඳ වැඩිදුර පරීක්ෂණ පවත්වන අතර එම මරණ සම්බන්ධයෙන් කෑගල්ල මහ රෝහලේ විශේෂඥ අධිකරණ වෛද්‍යවරයා ලබාදී ඇත්තේ විවෘත තීන්දුවකි. කෙසේ වෙතත් දරු පැටවුන් අවසන් වරට සතුටින් සිටි නිවසේම නිසලව සිට පසුගියදා අවසන් ගමන් ගියේ, මල් කැකුළක වටිනාකම ලොවට යළි යළිත් පසක් කරවමිනි.

■ දීපා වසන්ති එදිරිසිංහ



ඔබ දෛවයට පිටුපායිද.. ?
දෛවය ඔබට පිටුපායිද.. ?
● ජීවිතයේ අතීත සහ වර්ථමාන සිදුවීම් ඔබ විමතියට පත්වන අයුරින් පැවසුවහොත් ඔබට අනාගතයේ සිදුවන දෑ ගැන විශ්වාස නොකර සිටිය හැකිද ?
● වසර 45 කට වැඩි පර්යේෂණාත්මක අධ්‍යයනයන් සමග හස්ත රේඛා ශාස්ත්‍රයෙන් ඔබේ ජීවන ප්‍රශ්න විසඳා ගැනීමට හමුවන්න.
හස්ත රේඛා විශේෂඥ
එස්. කෝරළේගේ
520, වාසනා මාවත, කොට්ටාව, පන්නිපිටිය,
සෙනසුරාදා සහ ඉරිදා දිනයන්හි
පෙ.ව 9.00 සිට ප.ව 5.00 දක්වා හමුවිය හැක.
0112 783172 / 0773 775094

Blooming Babies
Nursing Care Services

ඔබත් දරුවකු බිහිකිරීමට
සූදානම්ව සිටින ආදරණීය මවක්ද?
දරු ප්‍රසූතියෙන් පසු ළදරු
සාත්තුව පිළිබඳ දෙගිඩියාවෙන්ද?

ආදරණීය මවුවරුණි,
ඔබගේ බිළිඳා ඉපදුණු පසු
ඔබ නිවසටම පැමිණ බිළිඳු
සාත්තුව සිදුකර ගැනීමට සහය වීමට අප සූදානම්.
අපගේ ළදරු සත්කාරය පිළිබඳව විශේෂිතව පුහුණුව
ලත් හෙදියන් විසින් අලුත උපන් ඔබගේ බිළිඳාගේ සියලුම
කටයුතු ඉතා පහසුවෙන් නිවැරදිව සිදු කර ගැනීමට ඔබව
දැනුවත් කර පුරුදු පුහුණු කරන අතර,
ඒ සඳහා ඉතා ලෙන්ගතුව සහය වනු ඇත.

අලුත උපන් බිළිඳා ආරක්ෂාකාරීව රැක බලා ගැනීමෙන්
නැවත රෝහල්ගතවීම් වළක්වා ගත හැක.
ඒ සඳහා අප හා සම්බන්ධවන්න.
0761 714 455 0716 202 997

විජය කුමාරතුංග 35වැනි ගුණ අනුස්මරණය නිමිත්තෙනි





රූපා කුමාරණතුංග

**සිංහල සිනමාවට වසර 75ක් පිරුණේ ඊයේ පෙරේදාය. එතුවක් කල් ගියත් විජය කුමාරතුංග වැනි අතිවිශිෂ්ට රංගධරයෙකුගේ අඩුව පිරවිය හැක්කෙක් සිංහල සිනමාවට බිහිවේද යන්න සැකසහිතය. එතුමා ඝාතනය වී එළැඹෙන 16 දිනට වසර 35කි. එනයින්, විජය කුමාරතුංග මහතාගේ අක්කණ්ඩිය වන රූපා කුමාරණතුංග මහත්මිය ඔහු පිළිබඳව 'ධරණී'ට කළ මතක ආවර්ජනය ඇසුරෙන් මෙම ලිපිය සකස් කර ඇත.**

# මල්ලි ඉස්කෝලෙ යනකන් සයිමන් සීයාටත් ඉස්කෝලෙ යන්න වුණා

## විජය කුමාරතුංග ගැන අක්කා රූපා කුමාරණතුංග කියන කතාව

"මගේ තාත්තා බෙන්ජමින් කුමාරණතුංග. අම්මා ක්ලෙරා බියට්‍රිස් පෙරේරා. පවුලේ දරුවෝ හතරදෙනයි. වැඩිමලා සිඩ්නි කුමාරණතුංග (ජීවන් කුමාරණතුංගගේ පියා). ඊළඟට විවියන් කුමාරණතුංග. තුන්වැනි දරුවා මම. පවුලේ බාලයා විජය ඇන්ටනි කුමාරණතුංග. මල්ලිගෙයි මගෙයි වයස් පරතරය අවුරුදු පහක්. තාත්තා ඉංග්‍රීසි පාලන කාලයේ පොලිස් විදානේ කෙනෙක් වගේම ව්‍යාපාරිකයෙක් විදියටත් කටයුතු කළා. කොහොමහරි විජය මල්ලිට අවුරුදු එකහාමරක් වගේ තියෙද්දි තාත්තා අන්ත්‍රා වුණා. ඒ නිසා මල්ලිට තාත්තා ගැන මතකයක් තිබුණෙම නැහැ. මල්ලි ඉස්කෝලෙ යන කාලය එද්දි අපේ ගෙදරට අල්ලපු වැටේ තිබුණු පාසලට යවන්න අම්මා තීරණය කළා. ඒ පාසල පවත්වාගෙන ගියේ සීදූව මීසමේ ඉඳපු ප්‍රංශ ජාතික ස්වාමි කෙනෙක්. පවුලේ අනිත් අය ඉගෙනගත්තේ වෙනත් පාසල්වල. ඒ නිසා පවුලේ හුරතලයට හැදුන විජය මල්ලි තනියම ඉස්කෝලෙ යන්න බෑම කිව්වා."

විජය කුමාරතුංග කුඩා දරුවා පාසල් යාම ප්‍රතික්ෂේප කිරීමත් සමඟ මව බියට්‍රිස් කුමාරණතුංග මුහුණපෑවේ උභතෝකෝටික ගැටලුවකටය. විජය කුඩා කාලයේ ඔහුගේ තනි නොතනියට සයිමන් සීයා නම් ඥාතියෙකු නිවසට පැමිණ සිටියේය. අවසානයේදී සයිමන් සීයා සමඟ පාසල් යෑමට විජය එකඟ විය.

"හැබැයි සයිමන් සීයා මාත් එක්කම පංතියේ ඉන්න ඕන."

ඒ කොන්දේසියක්ද දැමීමෙන් පසුවය.

ඉන් පසුව විජය පාසල් ගිය අතර, විජය සිටි පංතියේම පිටුපස ආසනයක සයිමන් සීයාටද වාඩි වී සිටින්නට සිදුවිය. විජය කැමැත්තෙන් පාසල් ගියද සයිමන් සීයා නම් පාසල් ගියේ එතරම් කැමැත්තකින් නොවේ. දින කිහිපයකට පසුව පාසල් අවසන් වී විජය සමඟ සයිමන් සීයා විජයගේ මව බියට්‍රිස් කුමාරණතුංග හමුවට පැමිණියේ එල්ලාගත් මුහුණෙන් යුතුවය.

"නෝනා තවත් නම් මට ළමයගෙ තනියට ඉස්කෝලෙට යන්න බැහැ."

"ඇයි සයිමන්?"

"කොල්ලො මට ඔච්චම් කරනවා සීයේ විභාගය කවදද? හොඳට ඉගෙනගන්න, ඉස්කෝලෙ එන්න දැන්ද මතක් වුණේ? වගේ එක එක දේවල් කියනවා."

සයිමන් සීයා බියට්‍රිස් කුමාරණතුංගට කීවේය.

විජය, සයිමන් සීයා නොමැතිව පාසල් යාමටද අකමැතිය. සයිමන් සීයා, විජය සමඟ පංතියේ සිටීමට අකමැතිය. අවසානයේදී විසඳුම වූයේ පංති කාමරය හා කොරිඩෝරය වෙන් කෙරෙන කොට බිත්තිය අසළ කොරිඩෝරයේ පුටුවක් දමා සයිමන් සීයා සිටීමයි. කොට බිත්තියට යාබදව පංති කාමරයේ විජයගේ ඩෙස්ක් එක සහ පුටුව තිබුණ අතර බිත්තියෙන් එළියේ සයිමන් සීයා සිටියේය.

"ඔය විදියට ටික දවසක් යද්දි ගුරුවරු කියන්න ගත්තා විජයගේ වැඩේ සැරෙන් සැරේ ඩෙස්ක් එක උඩට නැගලා කොට බිත්තියෙන් එහා පැත්තේ සයිමන් සීයා ඉන්නවද කියලා බලන එක කියලා. ඔහොම ටික කාලයක් යද්දි විජය ඉස්කෝලෙ ගමනට හුරුවුණා. පස්සෙනම් ගියේ කොටහේන ශාන්ත බෙනඩික්ට් ඉස්කෝලෙට."

රූපා කුමාරණතුංග විජයගේ පාසල් සමය සිහිපත් කළේ එලෙසිනි.

### එතකොට විජය රඟපෑමට ආවේ කොහොමද?

"මල්ලිගෙ පොඩි කාලේ ඉඳලම කැමැත්ත තිබුණේ පොලිස් නිලධාරියෙක් වෙන්න. ඒ නිසා උපපොලිස් පරීක්ෂක තනතුරට ඉල්ලුම් කරලා තිබුණා. ඒ අතර චිත්‍රපටයක රඟපාන්න සම්මුඛ පරීක්ෂණයකට ගිහින් තිබුණා. ඔහොම ඉද්දි තමයි එක දවසෙම ලියුම් දෙකක් ආවේ. එක ලියුමක් පොලිස් දෙපාර්තමේන්තුවෙන් සම්මුඛ පරීක්ෂණයෙන් විජයව තෝරාගෙන තිබුණා පුහුණුවට. අනිත් ලියුම අධ්‍යක්ෂ සුගතපාල සෙනරත් මහත්තයාගෙන්. ඒ 'හන්තානෙ කතාව' චිත්‍රපටයේ ප්‍රධාන චරිතයට මල්ලිව තෝරගත් බව කියන්න. මෙතැනදි මල්ලි තෝරාගත්තෙ පොලිසියේ රැකියාව. ඒ පොඩි කාලයේ ඉඳලා තිබුණ බලාපොරොත්තුව නිසා වෙන්න ඇති. ඒත් අම්මා පොලිසියේ රස්සාවට තදින්ම අකමැති වුණා.

'උඹ පොලිසියෙ රස්සාවට ගියොත් මම මහණ වෙනවා' කියලා අම්මා කීවා. මහාචාර්ය කාලෝ ෆොන්සේකා අපේ ළඟම ඥාතියෙක්. එයා කීවේ පොලිසියට යන්නෙ නැතිව රඟපෑම තෝරගන්න කියලා. ඒ විදියට තමයි විජය මල්ලි සිනමාවට ආවේ. ඊටපස්සෙ මල්ලිගෙ ගමන කාටවත් නතර කරන්න බැරි වුණා."

විජය කුමාරතුංග යනු සිංහල සිනමාවේ සිටි කඩවසම් මෙන්ම ආකර්ෂණීයම රංගන ශිල්පියෙකි. ඒ නිසා විජයට තරුණියන්ගේ ආකර්ෂණයද නොඅඩුව තිබිණි. ඒ පිළිබඳවද රූපා කුමාරණතුංගගෙන් විමසීමි.

"මල්ලි ලස්සනයි කියලා අමුතුවෙන් කියන්න අවශ්‍ය නැහැ. ඒක හැමෝම දන්න දෙයක්. ඉස්කෝලෙ යන කාලයේ සීදූවෙම අපිත් දන්න ගෑනු ළමයෙක් එක්ක ප්‍රේම සම්බන්ධයක් තිබුණා. ඒක අපිට ආරංචි වුණාම සිඩ්නි අයියා විජය මල්ලිව ගෙන්නලා ඇහුවම එහෙම සම්බන්ධයක් තියෙනවා කියලා මල්ලි පිළිගත්තා. මොකක්හරි හේතුවක් නිසා ඒ සම්බන්ධය නැතිවුණා. ඊටපස්සේ මාලිනී එක්ක ඇතිවුණ සම්බන්ධය ප්‍රසිද්ධ රහසක්නේ. මාලිනීත් ලස්සනයි, ජනප්‍රියයි. ඒ කාලයේ සිනමාවේ විජය - මාලිනී කියලා යුගයකුත් ඇතිවෙලා තිබුණා. ඒ නිසා හැමෝගෙම ප්‍රාර්ථනාව වුණේ මේ දෙන්නා එකතු වෙනවා දකින්න. මල්ලි දවසක් ඇවිත් මට කීවා 'පොඩි අක්කේ මම හෙට මාලිනීව කසාද බඳිනවා' කියලා. ඔය අතරේ බොහොම අවාසනාවන්ත දෙයක් සිදුවුණා. ලොකු අයියා සිඩ්නි හදිසියේම අසනීප වුණා. අසනීපය දැනගත්ත ගමන් අපේ ඥාති වෛද්‍ය කාලෝ ෆොන්සේකා කීවා 'සිඩ්නියෝ මෙහෙ ඇවිත් නැවතිලා බෙහෙත් ගනින්' කියලා. අයියා කොළඹ මහරෝහලේ නැවතුණා. ඊටපස්සෙ විජය මල්ලියි, මාලිනී ෆොන්සේකායි, මමයි සිඩ්නි අයියව බලන්න රෝහලට ගියා. එදා අප්‍රේල් 29දා. අප්‍රේල් 30දා මාලිනීගේ උපන්දිනය දවසේ තමයි විවාහයට දින යෙදිලා තිබුණේ. රෝහලට ගියාම මල්ලි සිඩ්නි අයියාට කීවා, 'අයියෙ මාලිනීයි මමයි කසාද බඳිනවා' කියලා.

අයියා ලෙඩ ඇඳේ ඉඳගෙනම දෙන්නට ආශිර්වාද කළා. එදා රෑ සිඩ්නි අයියා අන්ත්‍රා වුණා. තාත්තා නැති වුණාම පවුලේ වැඩිමලා සිඩ්නි අයියා තමයි තාත්තා වගේ අපි ගැන හොයලා බැලුවේ. මල්ලි විවාහය ලියාපදිංචිය අවලංගු කළා. කසාදය දවසේ අඳින්න සූදානම් කරපු ඇඳුම තමයි සිඩ්නි අයියගෙ මෘතදේහයට ඇන්දුවේ."

### එතකොට චන්ද්‍රිකා මැතිනියගේ විවාහයට පාර හැදුනේ කොහොමද?


"ඇත්තටම ඒක කොහොමද වුණේ කියලා මම දන්නේ නැහැ. මම හිතන්නේ කටාන අතුරු මැතිවරණය කාලයේදි තමයි ඔය සම්බන්ධය ඇතිවුණේ කියලා. 1977 තිබුණ මහ මැතිවරණයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කටාන ආසන අපේක්ෂකයා විදියට මල්ලි ඉදිරිපත් වුණා. ඒ මැතිවරණයෙන් පස්සේ 1978 පෙබරවාරි 20 දී තමයි චන්ද්‍රිකා මැතිනිය එක්ක විවාහය සිදුවුණේ."

චන්ද්‍රිකා මැතිනිය යනු එකල ඉහළ රදල පැලැන්තිය නියෝජනය කරන පවුලක සාමාජිකාවක විය. නමුත් විජය කුමාරතුංග යනු සාමාන්‍ය පවුල් පසුබිමකින් පැමිණ ජනප්‍රිය වූ පුද්ගලයෙකු පමණක් විය. එම දෙදෙනාගේ විවාහ ජීවිතය කෙසේ ගලපා ගත්තේද යන්න රූපා කුමාරතුංග මහත්මියගෙන් විමසීමි.

“අගමැති එස්.ඩබ්.ආර්.ඩී.බණ්ඩාරනායක වගේම ලෝකයේ ප්‍රථම අගමැතිනිය සිරිමා බණ්ඩාරනායක කියන්නේ චන්ද්‍රිකා මැතිනියගේ දෙමව්පියන්. බණ්ඩාරනායක පවුල කීවාම මුළු ලෝකයම දන්නවා. හැබැයි මල්ලි අපට කීවේ ඔයාලා ඔයාලගේ පාඩුවේ ඉන්න කියලා. අපිත් අවශ්‍ය අවස්ථාවලදී විතරයි බණ්ඩාරනායක පවුලට සම්බන්ධ වුණේ. ඒ නිසා ගැටලුවක් වුණේ නැහැ. සාමාන්‍ය විදියට සම්බන්ධතා පවත්වාගෙන ගියා. විවාහ උත්සවය වුණත් ලොකුවට ගත්තේ නැහැ.



විජය අම්මා බියට්‍රිස් පෙරේරා සමග



චන්ද්‍රිකා බණ්ඩාරනායක සමග

**“මල්ලි ලස්සනයි කියලා අමුතුවෙන් කියන්න අවශ්‍ය නැහැ. ඉස්කෝලෙ යන කාලයේ සීදුවෙම අපිත් දන්න ගෑනු ළමයෙක් එක්ක ප්‍රේම සම්බන්ධයක් තිබුණා. ඊටපස්සේ මාලිනී එක්ක ඇතිවුණ සම්බන්ධය ප්‍රසිද්ධ රහසක්නේ. මාලිනීත් ලස්සනයි, ජනප්‍රියයි. ඒ කාලයේ සිනමාවේ විජය - මාලිනී කියලා යුගයකුත් ඇතිවෙලා තිබුණා. ඒ නිසා හැමෝගෙම ප්‍රාර්ථනාව වුණේ මේ දෙන්නා එකතු වෙනවා දකින්න. මල්ලි දවසක් ඇවිත් මට කීවා ‘පොඩි අක්කේ මම හෙට මාලිනීව කසාද බඳිනවා’ කියලා**

විවාහය ලියාපදිංචියට අපේ පැත්තෙන් හිටියේ අම්මා විතරයි. චන්ද්‍රිකා මැතිනියගේ පැත්තෙන් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය, සුනේත්‍රා බණ්ඩාරනායක හා අනුර බණ්ඩාරනායක හිටියා. කසාදයට මල්ලිගෙ පැත්තෙන් අත්සන් කළේ ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් මහත්තයා. චන්ද්‍රිකා මැතිනියගේ පැත්තෙන් හෙක්ටර් කොබ්බෑකඩුව මහත්තයා අත්සන් කළා. විවාහයට කලින් තව දෙයක් සිද්ධ වුණා. අපි පාරම්පරික කතෝලිකයෝ නිසා කේන්දර නැහැ. ඒත් සිරිමාවෝ මැතිනියට අවශ්‍ය වුණා නැකතක් හදලා විවාහය සිදු කරන්න. ඒ නිසා මල්ලිගේ උපන් වෙලාව ඉල්ලගත්තා නැකතක් හදන්න කියලා.

විවාහයෙන් පස්සේ විජය මල්ලි රොස්මිඩ් පෙදෙසේ වෙනත් ගෙදරක පදිංචි වුණා. විවාහයෙන් අවුරුදු කීපයකට පස්සේ තමයි චන්ද්‍රිකා මැතිනිය අම්මා කෙනෙක් වුණේ.

චන්ද්‍රිකා මැතිනියට දරුවෙක් ලැබෙන්න ඉන්නවා කීවම සිරිමා මැතිනිය ගොඩක් සතුටු වුණා. මැතිනි බබා ලැබෙන දිනය ගැන හරිම උනන්දුවෙන් හිටියේ. මැකැනි නර්සිං හෝම් එකේදි තමයි චන්ද්‍රිකා මැතිනියට කුළුඳුල් දුව ලැබුණේ. බණ්ඩාරනායක පවුලට අලුතෙන් එකතු වුණ පළවැනි දරුවා. සිරිමා මැතිනිය පණිවිඩයක් එවලා තිබුණා බබාවත් අරගෙන රොස්මිඩ් වලව්වට ඒ කියන්නේ මහගෙදරට එන්න කියලා. විජය මල්ලි එයාගෙ වාහනය අරගෙන ඇවිත් හිටියා. මම තමයි චූටි දුවව වඩාගත්තෙ. අපි රොස්මිඩ් වලව්වට යද්දි සිරිමා මැතිනිය බබාව ගේනකම් ආසාවෙන් බලාගෙන හිටියා. බබාට කියලා කාමරයක් හරිම පිළිවෙලට සූදානම් කරලා තිබුණා. මම බබාව ඇඳ උඩින් තිබ්බම සිරිමා මැතිනිය හරිම සතුටින් තමයි බබාව බැලුවේ. ඊටපස්සේ චන්ද්‍රිකා මැතිනිය බබාත් එක්ක කීප දවසක් මහගෙදර ඉඳලා තමයි ආවේ.”

**එතකොට විජයව ඝාතනයට ලක්වුණ දවස මතකද?**

“ඔව්. ඒ දිනය 1988 පෙබරවාරි 16 දිනය මට හොඳට මතකයි. මගේ අනුරාධපුරයේ හිතවත් කෙනෙක්ගේ දරුවෙක් හිටියා විශේෂ අවශ්‍යතා තියෙන ළමයෙක්. ඒ ළමයට රැකවරණය සහ ප්‍රතිකාර දෙන්න පුළුවන් තැනක් හොයලා දෙන්න කියලා මම විජය මල්ලිට කීවා. මල්ලි ලියුමක් දීලා කීවා ගංගාරාමේ පොඩි හාමුදුරුවෝ හම්බවෙන්න, හරිගියේ නැතිනම් ඇවිත් කියන්න කියලා. මම ලියුම අරගෙන ගියාම හාමුදුරුවෝ කීවා එතැන සාමාන්‍ය ළමයි ඉන්නේ, වෙනත් සුදුසු තැනක් බලන්න කියලා. වැඩේ හරි නොගිය නිසා ගෙදරට යන්න කියලා බස් එකට නගින්න විහාරමහාදේවි එක ළඟ බස් හෝල්ට් එකට ආවා. එතැන ඉද්දි මිනිස්සු එකපාරටම කඩිගුලක් වගේ ඇවිස්සිලා වගේ කලබලයෙන් එහෙ මෙහෙ යන්න ගත්තා.

‘විජයට වෙඩි තියලා’

කියනවා ඇහුනා. විස්තරය අහද්දි කීවා විජයට වෙඩි තියලා කියලා. විස්තරය බලන්න පොල්හේන්ගොඩ ගෙදරට යද්දි එතැන සෙනඟ පිරිලා හිටියා. මම විජයගේ අක්කා කීවම එතැන ඉඳපු පොලිස් නිලධාරියෙක් සෙනඟ අතරින් මාව ගේ ඇතුළට ගත්තා. එතැනදි විස්තරය දැනගත්තා.”

**අවසාන වශයෙන් මොකක්ද කියන්න තියෙන්නේ?**

රූපා කුමාරණතුංග මහත්මියගෙන් මා ඇසුවෙමි.

“මල්ලි මරපු අයගෙන් මට අහන්න දෙයක් තියෙනවා. මිනිස්සුන්ට ආදරය කරපු, රටක් ආදරය කරපු මගේ අහිංසක මල්ලි මැරුවේ ඇයි? මොකක්ද ඔහු කරපු වැරැද්ද?”

කඳුළු පිරි දෙනෙතින් යුතුව වසර 35කට පසුත් ඇය තම පවුලේ ආදරණීය බඩපිස්සා සිහිකළේ එහෙමය.

■ සනත් ප්‍රියන්ත

1988 පෙබරවාරි 16 වැනි දින ඝාතනයට ලක් වනවිට වාමාංශික දේශපාලනඥයෙකු මෙන්ම විශිෂ්ට රංගධරයෙකු වූ විජය කුමාරතුංග මහතාට ‘පණ වුණත් දෙන්නට’ සූදානම් වූ අතිවිශාල පිරිසක් මේ රට තුළ බිහිවී සිටියහ. විජය නැති සොවින් තැවුණු ඒ බොහෝදෙනා හිත් හදාගන්නට බොහෝ දේ කළහ. ඇතැම්හු විජයව පපුවේ කොටාගත්හ. තවත් සමහරු ඔහු ගැන කවි, කතා ලියූහ. මේ ද මීට වසර 35 කට පෙර විජයගේ රසිකාවියක් වූ මාතර, දෙයියන්දර පදිංචි කාන්ති විජේකෝන් මහත්මිය විසින් රචනා කළ එවැනි කවි පෙළකි. මෙහි විශේෂත්වය වන්නේ මෙම කවි පෙළ විජය රඟපෑ චිත්‍රපටවල නම් ඇසුරෙන් නිර්මාණය කර තිබීමයි.

විජේ නැවතත් උපත ලැබ මෙහි රඟනු මැන රිදී තිරයේ
ගයා රස ගී රඟා රැගුමන් නැලවෙමින් රස ලෝකයේ
අගය කටකින් බැහැ කියන්නට දැයට ඔබ කළ සේවයේ
ජනාදරයෙන් ජනාදරයට පත්ව සිට හෙළ දීපයේ
විජේ නැවතත් උපත ලැබ මෙහි රඟනු මැන රිදී තිරයේ

එදා **‘හන්තානයේ’** සිටවිත් රිදී තිරයම ඔප කළා
සදා නොමැකෙන ලෙසට **‘පූජා’** තුළින් ආ දස්කම් ගලා
යොදා **‘ගඟ අද්දර’** දි ගී හඬ දේවි සරසවි කැඳවලා
නොදා ඉවතට තිබේ **‘යුගයෙන් යුගය’** ඒ ගැන සිහිවෙලා

**‘අහස් ගව්වක’** ගියත් ඉන් බැස රුවන් කැටයක් ලෙස මනා
**‘කරුමක්කාරයෝ’** සැමටම සැපත දෙන මාවත තනා
පුරුදු **‘මහගෙදර’** ටද ගොඩ වී එහිද විමසා උව මනා
**‘පොඩි මල්ලි’** සමඟ ආ හැටි මතක් වේ පාමින් සිනා

**‘මොනරතැන්නෙ’**දි විජේ හමුවී දුන්නු ඒ මිනිමුතු ඔවා ගැන
**‘අනුපමා’** දුව අදත් පවසයි නෙතේ උණු කඳුළැලි නගාගෙන
**‘අංජානා’** නංගි ආදර ඊයේ සේයා රුව බලාගෙන
**‘නැවත හමුවෙමු’** කියා පැතුවා සෑම වාරෙක ලොවේ උපදින

එදා **‘දෙව්දුව’** සමඟ විත් ඔබ සිටින අතරෙදි මාවතේ
**‘හිඟන කොල්ලා’** දැකල අසරණ දැඩි දුකක් හටගෙන හිතේ
**‘තුෂාරා’** ඇසුවිටදි අයියේ මෙහෙමදැයි මනු ජීවිතේ
ගොසින් **‘කවුළුව’** වෙතට බැංකුවේ තැබුව දහක් ඔහු අතේ


**‘අහස් මාලිග’** මොටද අපහට ඇතොත් මිනිසත්කම පුරෝගෙන
සදා **‘ඔබටයි ප්‍රියේ ආදරේ’** තුන්හෙළේ සැමටම කියා ගෙන
තවෙකුගේ දුක නොපෙනෙනා සඳ **‘මේ දෙඇස් කුමටද’** සිතාගෙන
දනිමි ගිය බව මේ නොබෝදා **‘ක්‍රිස්තු චරිතය’** වෙත සොයාගෙන

එදා **‘ඉන්දුට මල් මිටක්’** දී විජේ සෙනෙහස පුද කළා දැක
සදා **‘පෙම්බර මධූ’** ට ඇති වී තිබෙනවා දැක වේදනා දුක
පුදා **‘බංගලි වළලු’** දෙදෙනට එපා ඉන්නට කියා වී සැක
උදාරව පෑ සහෝදර පෙම තිබේ **‘මිහිදුම් සිහින’** සේ නෙක

ඇසුව විට **‘පොඩි නංගි’** දවසක් අයියෙ **‘ජය කොතනද’** කියා
**‘ශාන්ති’** ඇති තෙක් **‘පාර දිගේ’** යමු එවිට **‘ජය අපටයි’** ලියා
එදා **‘උමයංගනා’** දෙවොලෙදි පෑ සිනා සිහිවෙයි ඔයා
බලමි යළි **‘කැඩපතක සේයා’** තුළින් ඔබෙ ඒ ගුණ දයා

දුගී දුප්පත් රසික කැල හා ඇවිද **‘අක්කර පහ’** දිගේ
එදා **‘බද්දේගම’** ට ගිය ඒ ගමන අද කරනෙමි අගේ
**‘වාසනා’** ගුණ **‘අහිංසා’** ගති ඇතත් **‘සත් සමුදුර’** වගේ
විජේ **‘මරුවා සමඟ වාසේ’** නෙතේ උණු කඳුළැලි නැගේ


**‘හිමකතර’** කට ගොස් ආපසු බලා එන
**‘සූරිය කාන්තා’** මල සේ සිනා සෙන
**‘දෙළොස් මහේ පහන’** ක එළි විදා ගෙන
**‘ආරාධනා’** විජයට යළි මෙහේ එන



# ඒ වසරයි

බියංකා නානායක්කාර ලියයි

108 කොටස



# ලේ නෑකම් වුණත් මං අකමැති දේවල් කරනවානම් එතැන මං ඉන්නේ නෑ

දින කීපයක් යද්දී සියල්ල හොඳින් විසඳීම ගැන තේනුක තෙන්නකෝන් වගේම අංජනා ඇල්ලේපොලද සිටියේ හිතේ සැනසීමෙනි. ඒ නිසාම දෙදෙනාට හිතේ සතුටින් මාතලේ යන්නට පුළුවන් විය. තෙන්නකෝන් බණ්ඩාර ඇමතිවරයා නම් රෝහලට ඇතුළත් කළදට පසුදු ටිකට් කපා නිවසට එවා තිබුණේ විවේක ගන්නා ලෙසත්, සිදුකළ පරීක්ෂණවලට අනුව ඉතා ඉක්මනින් බයිපාස් ශල්‍යකර්මයක් කරගන්නා ලෙසටත් වෛද්‍ය උපදෙස් සමඟිනි. ඒත් සෙනෙහෙලතා මැණිකේ තේනුකට කතා කරන කල්හි කීවේ බයිපාස් එක ගැන මතකයක් තබා, විවේකීව පැයක් දෙකක්වත් ඔහු නිවසේ නොසිටි බවය. සෙනෙහෙලතා මැණිකේගේ කතාවෙන් ඔහු තේරුම්ගත්තේ වෛද්‍යවරු සහ වටපිටාවේ ඉන්නා අය තරමට තෙන්නකෝන් බණ්ඩාර ඔහුට ඇති රෝග තත්ත්වය ගැන බියක් නැතිව හැසිරෙන බවය. ඒ නිසාම ඔහු පියාට කතා කළේය.

"හැමදම දෙවියෝ චාන්ස් දෙන්නෙ නෑ අප්පච්චි... හැකි ඉක්මනට ඔය බයිපාස් එක කරගන්න."

තේනුකගේ කතාවට තෙන්නකෝන් බණ්ඩාර ඇමති සුපුරුදු ලෙස හඬ නගා සිනාසුණා පමණි.

"මගෙ ජීවිතේ භයානකම අපලෙ ගෙවුණා පොඩි පුතා. දැන් මං බය නෑ."

තේනුකට කේන්තිද ආවේය. දේශපාලනේ කරන බහුතරයකට ඇත්ත තේරුම්ගැනීමට මොළයක් නෑ කියා කියන්නට කටට ආවත් ඔහු එය වළකා ගත්තේය.

"අප්පච්චි ලෙඩ එක්ක සෙල්ලම් කරන්න එපා. ඒ ගැන හොඳටම දන්න හින්දයි මං මේ තරම් කියන්නේ..."

"හරි හරි... මං ටික දවසකින් ප්‍රයිවෙට් කරගන්නම්කෝ. බලාගෙන යනකොට ඔයා අපි එක්ක තරහෙන් වගේ හිටියට ආදරෙයිනේ... ගෙවල් දොරවල් නෑ වගේ තැන් තැන්වල නොඉඳ ගෙදර ඇවිත් ඉන්නවා පොඩි පුතා."

තේනුක තෙන්නකෝන්ගේ සිත ඇමතිවරයාගේ කතාව නොරිස්සුවේය. ඒ නිසා ඔහුට පියාට උත්තරයක් දෙන්නම සිතුණේය.

"මං ලේ නෑකම්වලට ආදරෙයි අප්පච්චි. ඒත් ලේ නෑකම් වුණත් මං අකමැති දේවල් කරනවානම් එතැන මං ඉන්නෙ නෑ... ඒ හින්ද කවදවත් මට ගෙදර ඉන්න කතා කරන්න එපා... ඔන්න අප්පච්චිලාට පුළුවන් නම් ඔය පුහු දේශපාලනෙන් අයින් වෙන්න... මාත් වෙනස් වෙනවා..."

තෙන්නකෝන් බණ්ඩාර ඊටද සිනාසුණා පමණි. ඒ සිනා හඬ තේනුකගේ කනෙහි තවමත් රැඳී ඇතුවා මෙනි.

"මොකද ඔයා තනියම හිනාවෙන්නේ..?"

නිහඬවම වාහනය පදවන තේනුක තෙන්නකෝන්ගේ මුහුණ දෙස බොහෝ වේලාවක් බලා සිටි අංජනා ඇසුවාය. ඔවුන් සිටියේ සෙනරත් ඇල්ලේපොලගේ තුන්මස් පිංකම වෙනුවෙන් මාතලේ බලා යමිනි.

"මං හිතුවා කියව කියව ඇවිත් නින්ද ගිහින් ඇති කියලා. ඒකයි මං උරහිසවත් හොළවන්නෙ නැතුව ආවේ..."

ඔහු කීවේ අංජනාගේ හිස මතින් මුදුවට අතක් තබමිනි.

"නිදිමත ආවා. ඒත් ඔයාව තනියම තියලා නිදාගන්න ලෝබ හිතුණා. ඉතින් මං ඔයාගෙ මූණ දිහා බලාගෙන හිටියා..."

"හා එතකොට මොනවද දන්නෙ නෑ දැක්කේ..."

"කල්පනා කළා, රිලැක්ස් වුණා. පොඞ්ඩක් තරහ ගියා වගෙත් වුණා. ඊටපස්සෙ නිකම් හිනායන්න වගේ යාන්තම් ආවා. එතකොට මට කට පියාගෙන ඉන්න බැරි වුණා."

අංජනා ඔහුගේ උරයෙන් හිස පසෙකට ගනිමින් කීවාය.

"මං අප්පච්චි ගැන හිත හිත ආවේ. බලන්න මීට මාස තුනකට කලින් ඔයාගෙ අප්පච්චි ජීවත් වුණා. ඒත් අපේ අප්පච්චිලා වගේ පොඩි ලෙඩේටත් චැනල් දෙස්තරලා පස්සෙ නොගිහින්. එහෙම ගියානම් අප්පච්චිගෙ තිබ්බ ලෙඩේටත් පූර්ව ප්‍රතිකාර ලැබිලා. දැන් අපේ අප්පච්චිගේ ලෙඩ හොඳයි. ඉක්මනට බයිපාස් එක කරගන්න කිව්වම හිනාවෙනවා ලෙඩවලට ඔයතරම් බයවෙන්න ඕනි නෑ කියලා..."

"අම්මලා අප්පච්චිලා කවුරුත් එහෙමයි. ඒ ගොල්ලන්ට තේරෙන්නෙ නෑ සෙල්ලම් කරන්නෙ ඒ ගොල්ලන්ගෙම ජීවිතේ එක්ක කියලා..."

අංජනා කීවේ සෙනරත් ඇල්ලේපොලවද සිහියට නගා ගනිමිනි. ඉස්සර අප්පච්චිද එසේය. ලෙඩක් අසනීපයක් හැදුණ කල්හී බෙහෙත් ටිකක් ගන්නට කැඳවා යන්නට බොහෝ අමාරුය. ඔහු එදවස කීවේද ඔය පොඩි පොඩි ලෙඩවලට දෙස්තරලා ළඟට යන එක බොරු වැඩක් කියාය.

"අපි කොළඹ ආවම අර පඬුරු බැන්ද බාර ඔප්පු කරන්න ඕන. දැන් දෙන්නටම හොඳයිනෙ..."

ලෙඩ අසනීප ගැන කියද්දී තේනුකගේ ජපන් මිතුරිය ටොෂිකෝද මතක් වූයෙන් අංජනා ඇල්ලේපොල කීවාය.

"මං නම් දන්නෙ නෑ ඔය බාර ඔප්පු කරන්න. දේවාන් ටොෂීට කියලා ඔයයි මමයි එයාට දෙවියන්ගේ පිහිට ඉල්ලලා පඬුරු බැන්ද කියලා..."

"ඉතින්..."

"එයා කිව්වලු කොහොමත් ලංකාවට එන්න ඕනි. ඔයාගෙයි මගෙයි වෙඩින් එකටත් කලින්. බාරෙත් ඔප්පු කරලා ඉතුරුවෙන ලෙඩ ටිකට හොඳ සිංහල බෙහෙත් ටිකක් බොන්න ඕන කියලා..."

"එයාට ලංකාවටම තමයි හිත නේද? ගිය ආත්මෙ ලංකාවෙ මනුස්සයෙක්ද දන්නෙ නෑ ඔය ජපානෙ ඉපදිලා තියෙන්නේ. එයා ඔයතරම් ලංකාවට ආස නම් අපි එයාට ලංකාවෙන් බෝයි ෆ්‍රෙන්ඩ් කෙනෙක් හොයලා දෙමු..."

අංජනා ඇල්ලේපොළ කීවේ ඇත්තටමය. එතකොට ඇය තේනුක ගැන හීන දකින එකද නැතිව යනු ඇත. එය තවත් හිතට හොඳය.

"එහෙමම කැමැත්තක් නෑ නෝනා... එහෙනම් ලංකාවෙ කොල්ලො කොච්චර ජපානෙ ඉන්නවද..?"

ටොෂිකෝ තමන්ට කැමැත්තෙන් සිටි බව අංජනා දැනගත්තා නම් ඈ කෙරෙහි මෙසේ අනුකම්පා නොකරනු ඇත. ඇත්තටම ටොෂිකෝට ලංකාවෙ කොල්ලෙක් ඕනෑ වුවා නම් ඔවුන්ගේ මිතුරු කණ්ඩායම්වලද ලංකාවේ කොල්ලන් ඕනෑතරම් සිටියේය.

> ජීවිතේට තනියම මුණදෙන්න වුණොත් ඒක මොනතරම් අභියෝගයක්ද කියලා දන්නෙ ඒ තනිවුණු කෙනයි

"ඔයා ගැනද දන්නෙ නෑ එහෙනම් එයාගේ හිතේ කැමැත්ත තියෙන්නේ..."

ඈ සිනාසුණේ කිසිත් නොදැනය. තේනුක තෙන්නකෝන් ඊට උත්තර බඳින්නට නොගියේ හිතාමතාය. ඊටපස්සේ මේ කතාව කොතැනින් කොහාට කැරකෙයි දැයි හිතාගන්නට බැරි නිසාය.

"ඔයාගේ අම්මගෙන් අහන්නෙ නැතුව අපෙ අම්මට දුගෙ ගෙදර එන්න කියපු එක හොඳද මන්ද..."

පසුගිය දින කීපයේම වරින් වර හිතට නැඟුණු වරදකාරී සිතුවිල්ල ඔහු අංජනා ඉදිරියේ වචන කළේ ඒ මොහොතේත් එය සිතුණ නිසාය.

"එහෙම ප්‍රශ්නයක් නම් නෑ. දැන් ඔයාගේ අම්මා ඇත්තටම ඒවිද අපේ ගෙදර..? ඕක නොකියා ආවා කියලා අපේ අම්මා ඕවා ලොකුවට ගණන් ගන්නෙ නැති කෙනෙක්. අනික අප්පච්චි නැතිවුණාට පස්සෙ අම්මා සැහෙන්න වෙනස්වෙලා කියලා මට හිතෙනවා."

"වෙන්න ඇති... ජීවිතේට තනියම මූණදෙන්න වුණොත් ඒක මොනතරම් අභියෝගයක්ද කියලා දන්නේ ඒ තනිවුණ කෙනායි. මට ඒකෙ වෙනසක් නොපෙනෙන්නේ ඊට කලින් මට අම්මා හම්බවෙලා නැනේ නෝනා... ඒකයි."

ඔවුන් කතාවෙන් කතාවෙන් මාතලේ නගරයද පසුකර ගෙවල් ආසන්නයටම පැමිණ සිටියහ. විජේසිංහ ඉස්කෝලෙ නෝනගෙ නිවස පෙනෙන මානයට ආවිට සිතට දැනුණේ පහද දිය නොහැකි සතුටකි. වාහනයෙන් බැසගත් අංජනාත් තේනුකත් ඇය සමීපයට යද්දී වත්සලා ඇල්ලේපොල තේනුක තෙන්නකෝන්ගේ අතෙන් අල්ලාගත්තාය.

"පුතාට පින්..."

ඇය සියලු සතුට වචන දෙකටට එක් කළාය.

"ඔන්න අම්මා අපේ අම්මත් දුනේ ගෙදර එනවා කිව්වා..."


හිතේ ඇති වරදකාරී හැඟීම ඉවත් කරගන්නට තේනුක කියද්දී මහා හයියෙන් කොතැනක හෝ සිටි හූනෙක් 'චුක් චුක්' ගෑවේය. හිනාවෙන් පිරී තිබූ වත්සලා ඇල්ලේපොලගේ මුහුණ එක්වරම කළු වූවාය.

ලබන සතියට

හිතේ හයියෙන් ජීවිතය දිනන්න කැමති කොයිකාටත් අතහිත දෙන්න 'ධරණී' හැමදාමත් කැමතියි. නිකරුණේ ගෙවිලා යන කාලය තමන්ගේම කියලා ස්වයං රැකියාවක් වෙනුවෙන් යොදවන්න කැමති කාන්තාවන්ට හොඳ ඉල්ලුමක් තියෙන විවිධ දෑ පියවරෙන් පියවර ගෙදරදීම හදාගන්න හැටි කියලා දෙන්න අපි හිතුවේ ඒකයි. කඩදාසි, මැටි, රෙදි, විවිධ ආහාර, සබන් ඇතුළු විවිධ දේ නිර්මාණය කරන විදිය ගැන සහ ඒවා වෙළඳපොළ වෙත යොමු කරන ආකාරය ගැන මේ ලිපි මාලාව හරහා ඔබව දැනුවත් කරනවා.

සීතා පොන්නම්පෙරුම
ස්වයං රැකියා
පාඨමාලා උපදේශිකා

# දැනුණොතින් තෙලේ බලේ කැක්කුම් ඔක්කොම කැලේ



"නැන්දේ මාමේ, අයියේ අක්කේ, නංගියේ මල්ලියේ... බලන්න ඕගොල්ලන්ට අද මම ගෙනල්ලා තියෙන දේ. රාජභෝජන දීලා රත්තරං සළු ඇන්දෙව්වත් මේ කුණුකය ටිකෙන් ටික දිරනවා කියලයි බුදුබණෙත් කියන්නේ. ඉතින් කොච්චර කළත් ඇඟේපතේ අමාරුකම්, සන්ධි වේදනා, වාත අමාරු එන එක වළක්කන්න සක්කරයගේ පුතා වයිමටවත් බැහැ... ඇඟේපතේ වේදනා හැදුනට පස්සේ බේත් හොය හොයා ඇවිදින්ට ගියාම ඒ අමාරුකම් තවත් වැඩිවෙනවා. එහෙම නොවෙන්ට මම ගෙනාව පංකාදු පහේ තෙලක්. වේදනාව එන්ට කලින්ම මේ තෙල් බේත අරන් තියාගත්තොත් සුටුස් ගාලා විනාඩියෙන් සුවේ! තෙල් බේතක් කිව්වට මේක ඉංග්‍රීසි බේතක් එහෙම නෙමෙයි ඕන්... පුරාණ වට්ටෝරුවකට හදපු රාස් බෙහෙතක්..."

මීට දශක කීපයකට කලින් ඔහොම කිය කියා බෙහෙත් විකුණපු මහත්තුරු හැම ටවුමකම හිටියලු. වැඩිහිටි උදවියට නම් අදටත් මතක ඇති. ඔය කියන කාලේ දැන් වගේ හිතුණු හිතුණු වෙලාවට ගිහින් බඩු ගන්න සුපිරි වෙළඳසැල් තිබිලා නැහැනේ. ඉතින් ගමේ ගොඩේ සිදුදියේ හැමකෙනාම ගෙදරට ඕනකරන අඩුම කුඩුම ගන්න වුණේ සතිඅන්ත පොළෙන්.

තෙල් බෙහෙත් විකුණන උදවියත් ඉස්සර ඔය පොළවල්වල වැරදුණේ නෑ කියලයි අපේ වැඩිහිටියෝ කියන්නේ. තෙල් බේත් කුප්පිවලට අමතරව නයි, පොළොංගු, ගෝණුස්සෝ වගේ විෂ සත්තු ඉන්න පෙට්ටි කීපයකුත් උන්දෑලා ගාව තිබුණලු. පොළට සෙනඟ පිරුණෑයින් පස්සේ අර පෙට්ටිවල ඉන්න සත්තුන්ගේ විෂ ගැනයි, උන් කෑවහම ගාන්න ඕන තෙල ගැනයි, සන්ධි අමාරුවට හොඳ බෙහෙත් තෙල් ගැනයි නාට්‍යානුසාරයෙන් කියන්න මේ අය හරි හපන්නුලු. වැඩේ පටන් අරන් විනාඩියෙන් දෙකෙන් උන්දැගේ කටකාර ශිල්ප දැක්කිල්ල බලාගන්න සෙනඟත් පොරකනවලු. ඒ විතරක්යෑ ඔච්චට වශීවෙන මිනිස්සු මේ මහාර්ඝ තෙල් කුප්පි දෙක තුනක්ම ගන්න පස්ස ගහන්නෙත් නැතිලු.

ඒ කාලේ තිබ්බයි කියන ඔය තෙල් බේත්වලින් ඇත්තටම සන්ධි අමාරුකම් සුවවුණාද කියන්න දන්නේ නැහැ. හැබැයි සන්ධි වේදනාවලට අතේපයේ කැක්කුම්වලට සුවයක් දෙන වේදනානාශක තෙල් එකක් හදන හැටියි අද කියලා දෙන්නේ. හැබැයි අර ටීවී එකේ පෙන්වන, ගෑව ගමන් සුව වෙනවයි කියන ජාතියේ මැජික් තෙල් එකක් එහෙම නෙමෙයි. තාවකාලික සහනයක් ලබාගන්න පුළුවන් වේදනානාශකයක්. ඒ නිසා බොරු විස්තර කියලා මේ වගේ දේවල් අලෙවි කරන්න යන්න එපා කියන එක නොකියා බැහැ.

අතපයක සන්ධියක වේදනාවක් ආපු හැටියේ සමහරු කරන්නේ වේදනානාශක පෙත්තක් ගිලින එක. ක්ෂණික සහනයක් ලැබුණත් ඒවා දිගුකාලයක් පාවිච්චි කළාම අතුරුආබාධ එන්න පුළුවන්. ඉතින් හිතුමනාපෙට පෙති ගිලිනවට වඩා තෙල් ඩිංගිත්තක් ගාලා තාවකාලිකව වේදනාව සමනය කරගන්න එකයි හොඳම වැඩේ.

වේදනානාශක කියාපුවාමයි මතක් වුණේ. බුදුරජාණන් වහන්සේ ලෝකවාසී සත්වයන්ගේ මනසට බෙහෙත් දුන්නු බව විනා කායික ලෙඩ දුකට ඖෂධ අනුදැන වදාළ බව සාමාන්‍යයෙන් වැඩිදෙනා අතර ප්‍රචලිත දෙයක් නෙමෙයි. හැබැයි බුදුරජාණන් වහන්සේ ගිලන් භික්ෂූන් කිහිප නමකටම ප්‍රතිකාර කළා කියලා ත්‍රිපිටකයේ සඳහන් වෙනවා.

ආනන්ද හාමුදුරුවන්ගේ ගුරුවරයෙක් වෙච්චි බෙලට්ඨිසීස මහරහතන් වහන්සේට සුව නොවන සන්ධි වේදනාවක් තිබුණලු. විහාර චාරිකාවේ වඩින බුදුන් වහන්සේ බෙලට්ඨිසීස හාමුදුරුවෝ විඳින වේදනාව ගැන දැනගෙන උන්වහන්සේගේ විහාරෙට වැඩම කරලා මහරි කොළ, කොහොඹ එකට එක්කාසු කරලා තෙලක් හිඳවලා බුදුන්ගේ දෑතින්ම බෙලට්ඨිසීස හාමුදුරුවන්ගේ කකුල් මත ආලේප කළාය කියලයි සඳහන්.

ඒ තෙලට දැම්මා වගේ ස්වභාවික අමුද්‍රව්‍ය නොදැම්මට මේකට යොදන්නෙත් ශරීරයට හිතකර අමුද්‍රව්‍ය විතරයි. මුලින්ම තෙල් 100ml ප්‍රමාණයක් හදලා බලමු.

ඉයුකැලිප්ටන් තෙල් 20ml, වෙජිටබල් ටර්පන්ටයින් 10ml, මීතයිල් සැලිසිටේට් 5ml, මෙන්තෝල් 5ml, වගේම වයිට් ඔයිල් 60ml සපයාගන්න.

මේ අමුද්‍රව්‍ය සේරම පිටකොටුවෙන් ගන්න පුළුවන්. ශරීරයේ ආලේප කරන ඖෂධයක් නිසා හොඳම ප්‍රමිතියේ අමුද්‍රව්‍ය අරගන්න.

ඒ වගේම කියන්න ඕනේ ඖෂධයක් නිසා ස්වයං රැකියාවක් විදියට කරනවා නම් රජයේ පිළිගත් ලියාපදිංචි වෛද්‍යවරයෙක්ගෙන් සහතික කරවගෙන ආයුර්වේද අමාත්‍යංශයේ අනුමැතිය අරගන්න.

හරි එහෙනම් නංගියේ, අක්කේ, නැන්දේ අපි දැන් අපේ වේදනානාශක තෙල හදමු.



**1** මුලින්ම වයිට් ඔයිල් ටික බීකරයට දාලා උණුවතුර බඳුනක තියලා 40C දක්වා රත්කරගන්න.



**2** මිශ්‍රණය ලිපෙන් අයින් කරලා අනිත් ද්‍රව්‍ය එකින් එක එකතු කර කර විනාඩි 10ක් විතර උපරිම වේගයෙන් මිශ්‍ර කරන්න. මේ සඳහා මිශ්‍රණ යන්ත්‍රයක් භාවිතා කරන්න පුළුවන්නම් වැඩිය හොඳයි. පස්සේ සුදුසු බෝතල්වල දාලා අසුරලා ලේබල් කරන්න.




30mlක වේදනානාශක බෝතලයක් රුපියල් 200ක මිලකට අලෙවි කරන්න පුළුවන්. තව විස්තර දැනගන්න 0714766819ට කතා කරන්න.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි

# කවි යාය

ඔබේ කවි නිර්මාණ පහත ලිපිනයට එවන්න.

''කවි යාය'' 'ධරණී' කර්තෘ මණ්ඩලය,
අංක 91,විජේරාම මාවත,කොළඹ 07 නැතිනම්
dharanee.editor@liberty.lk
ලිපිනයට ඊමේල් කරන්න

## සොඳුර නුඹ

පෙර ඔබ කියූ වදන් මතකෙට එනවා
උණු කඳුළැලි කම්මුල සිඹිනවා
කියා ගනු බැරි දුකක් මට දැනෙනවා
එම දුක දරාගන්නට බැරි බව හැඟෙනවා

නුඹ ගිය මග තවත් බලා සිටිනවා
නුඹ ආපසු එයිද මට දැනෙනවා
කමක් නෑ නුඹ ආවොතින් හිත හැදෙනවා
දමා යන්න බැරියි කියා පොරොන්දුවක් ගන්නවා

යහළු යෙහෙළියන් නුඹ ගැන අහනවා
එවිට ඇසට කඳුළු උනනවා
සිතට මහ තනිකමක් දැනෙනවා
ජීවත් වන්නට බැරි බවක් දැනෙනවා

**පසින්දි අමායා ප්‍රනාන්දු**
**ගල්ගමුව**

## මල් සහ බඹරු

අකුලක් ගහක් දුටුවිට එහි එතෙයි වැල්
ගඟුලක් මිසක් සමුදුර වෙත නොයයි විල්
පහසක් පිණිස මී බිඳු වැගුරුවා තොල්
බඹරෙක් නිසා අතු මත පිබිදුනා මල්

කවරෙකු පළඳද ජය මාලා ගෙලට
කුමරෙකු වඩීදෝ නුඹෙ දුප්පත් පැලට
කවියෙකු අසුවේද ගැහැනුන්ගේ දැලට
බඹරෙකු මිසක දෙබරෙකු එනවද මලට

සන් සුන් ගමන හන්සයො ළය මත පීනූ
පුන් සඳ මෙන් උවන, ඇස් නිල් මිනි වැනූ
ලන්දේ පිපෙන මල් මෙනි ලස්සන මූණූ
රොන් සුණු උරයි බඹරා නොතලා රේණූ

කුමරෝ නොපෙනේද එල්ලෙන කියඹු වැල
හතුරෝ නිවයිදෝ ඇගෙ නෙත් පහන් සිල
දෙබරෝ මලට ළංවූවද නොමැත පල
බඹරෝ නුඹට හිමිවේවිද පිපුණ මල

**සිරිසෝම පයාගලගේ**
**බෙන්තොට**



## නපුරු වූ ද

රළු පරළු වදන් වැල්
සවනතේ වැකෙද්දී
සියොළඟම දැවීගොස්
කඳුළු වැල් වැටෙද්දී
ආදරෙන් සිපගත්තු
දෙතොල්පෙති මැවෙද්දී
අනේ ඒ ඔබමදැයි
මගේ සිත අහද්දී
මට මගේ ජීවිතේ
කළකිරුණා රත්තරන්
සත්තකින්

**ශ්‍යාමලී අමරතුංග**
**කිරිඳිවැල**


නගරයේ ප්‍රසිද්ධ අධ්‍යාපන ආයතනයක් සඳහා ඉංග්‍රීසි හොඳින් කථාකළ හැකි ඉංග්‍රීසි ගුරුවරියන් / කාර්යාල සහයිකාවන් අවශ්‍යයි. වයස සීමාව (25-55) මහනුවර නගරයට ඉතා නුදුරු අස්ගිරිය, කටුගස්තොට පේරාදෙණිය, අනිවත්ත හන්තාන වැනි ප්‍රදේශවලින් විශේෂයි.
0770 126 321
0777 805 664

රු. 35000/- කට වැඩි ආදායමක්
විලාසිතා අත්පලඳනා, කරාබු සැකසීම.
- නිවසේ සිටම කරගෙන යා හැකිය
- නිෂ්පාදන භාර ගැනේ
- මුදල් එවලේම
- අමුද්‍රව්‍ය නිවසටම සැපයේ

වැඩි විස්තර සඳහා ඔබගේ Whatsapp අංකය SMS කරන්න.
070-6128955

විවිධ බැංකු ඇබෑර්තු
★ බලපත්‍රලාභී අලුතින් විවෘත වූ බැංකු කිහිපයක් සඳහා ප්‍රාදේශීය මට්ටමින් අයදුම්පත් කැඳවේ.
★ අවම සුදුසුකම් O/L වේ.
★ වැටුප් සමග පුහුණුව.
★ රැකියාව තම ප්‍රදේශයටම.
වැටුප 40,000/-
18/40 ගැ/පි
(මැන් පවර් නොවේ)
0712 564 715 | 0774 024 155
0703 346 072 | 0761 125 624
0702 725 731 | 0702 231 694

උගස් තැබූ රත්තරං
ඔබ උගස් තැබූ ආයතනයට පැමිණ බේරාදී වැඩි මිලට මිලදී ගනු ලැබේ.
කැරට් 22 සඳහා ඉහළ මිලක්
076 101 88 53

මෙවර සාමාන්‍ය පෙළ / උසස් පෙළ / ශිෂ්‍යත්වය ඇතුළු සියලුම විභාගවලින් විශිෂ්ට ජයග්‍රහණ ලබා ගැනීම සඳහා පැමිණ හමුවන්න.
නැතහොත් ලිපියක් මගින් විමසන්න. (පූජා භාණ්ඩ ඔබ විසින් සැපයිය යුතුයි.)

ප්‍රේම සබඳතා බිඳවැටෙන්නේ ඇයි?
ව්‍යාපාර/ගේ දොර පාළු වී යන්නේ ඇයි?
අයුතු සම්බන්ධතා නිසා පවුල් අවුල් වන්නේ ඇයි?
මෙන්න! එයින් මිදෙන්න නිසි මඟක්...

අයුතු සම්බන්ධතා නැවතීම
* නිවාස ආරක්ෂා
* නඩුහබ දිනීමට
* දරුඵල ලබීමට

මත්කුඩු සහ සුරාව

* රැකියා ලබා ගැනීමට
* සියලු විභාග සඳහා
* නොවිකිනෙන ඉඩම් විකිණීමට

* විවාහ පමා අයට
* නැරගිය අය ගෙන්වීම
* අසාර්ථක ව්‍යාපාර දියුණුවට

මාතර වෙද හාමුදුරුවෝ
ඔබ කුමන හෝ මත්ද්‍රව්‍යයකට ඇබ්බැහි වූ අයෙක් ද?
එසේ නම් ඉන් මිදීමට අමතන්න.
වරු තුනෙන් ප්‍රතිඵල පැමිණ හමුවන්න
අමතන්න 077 362 77 14

හමුවීම
බදාදා, සෙනසුරාදා
පෙ.ව. 8.00 සිට
ප.ව. 3.00 දක්වා

කුරුණෑගල, පොතුහැර චන්ද්‍රසේල පිරිවෙන් පුරාණ විහාරයේදී

ශාස්ත්‍රවේදී පණ්ඩිත මාතර වෙද හාමුදුරුවෝ
භාරකාරතුමා, ජනසෙත වෙද මැදුර, චන්ද්‍රසේල පිරිවෙන් විහාරය, කොළඹ පාර, පොතුහැර, කුරුණෑගල, පොතුහැර චන්ද්‍රසේල පිරිවෙන් පුරාණ විහාරයේදී


ගෙදර හැමෝගෙම හිනාව හැමදාම තියාගන්න නම්
රට රස්සාවට යනකොට ජාවාරම්කරුවන්ට
අහුවෙන්න එපා
නීත්‍යානුකූල මාර්ග හරහාම පමණක් රට රස්සාවල්වලට යන්න
රට යනකොට කතාකරන්න 1989
කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
අංක 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල.
www.slbfe.lk




කොළඹ 7 විජේරාම මාවත අංක 91 හි පිහිටි ලිබර්ටි පබ්ලිෂර්ස් (පෞද්ගලික) සමාගම විසින්, මල්වාන කළුකොඳයාවේ පිහිටි සිය මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.